ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 මැයි 17 වන බදාදා
3 කාණ්ඩය 24 කලාපය
මිල රු. 80 යි

කොච්චර ගත්තත්
අතේ සතේ නෑ
කියන අයට

NO SPEND CHALLENGE

විශේෂ අතිරේකයක් නොමිලේ



ඔන්ලයින් ක්‍රමයට නිධානයක් ගොඩගන්න ගිහින් අංජනම් දේවිගෙ ගෝලයෝ පොලිසියට කොටුවෙලා

රුධිරය වියළීම ගැන බලා ඉඳලා කියන්න පුළුවන්නම් මටත් මහාචාර්යවරයෙක් වෙන්න තිබුණා ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න

දුවෙක් කියන්නේ අම්මගෙයි තාත්තාගෙයි නොවරදින ඉන්ෂුවරන්ස් එකටලු

කාඩ්බෝඩ් පිරිමින්ට වඩා පින්ගුත්තරලා හොඳ වෙන්නේ කොහොමද?

රැෆෙල්ලා ප්‍රනාන්දු

ඡායාරූප
ක්‍රිෂාන් කාරියවසම්

# ගර්භිණී බක් මහා උළෙල ලෝකෙටම එකයි

**"එන සිකුරාද ඌව පරණගම ප්‍රාදේශීය රෝහලේ ටිකක් වෙනස් විදියක අවුරුදු උත්සවයක් තියෙනවා කියලා ආරංචියි."**

මීට දින කීපයකට පෙර මට ඒ ඇමතුම දුන්නේ ළඟම සගයෙකි. හිසේ කෙස් ගාණට අවුරුදු උත්සවවලට ගොස් ඇතත් වෙනස් විදියේ එකක් කී නිසා හිත බලකළේම එහි යන්නටය.

අදාළ දිනයේදී මා ඌව පරණගම ප්‍රාදේශීය රෝහල වෙත ගියද එහි අවුරුදු උත්සවයක අසිරිය තිබුණද වෙනත් වෙනසක් නම් මා දුටුවේ නැත. සුළු මොහොතකින් අපූරු වාදනයක් වයමින් පාසල් බෑන්ඩ් කණ්ඩායමක් රෝහල දෙසට පැමිණියේය. ඒ බෑන්ඩ් කණ්ඩායම පෙරටුකරගත් පෙරහරේ කැඳවාගෙන එන්නේ ආරාධිත අමුත්තන් කියා සිතුවත් ඒ මොහොතේ පෙරහරින් එතැනට පැමිණියේ ගැබිනි මව්වරුන් පිරිසකි.

"අවුරුදු කාලෙට අවුරුදු උත්සව හැමතැනම. මං කවදාවත් ගැබිනි මව්වරුන්ගේ අවුරුදු උත්සවයක් දැකලා නෑ. ලංකාවේ නෙවෙයි ලෝකේ කොහේවත් එහෙම උත්සවයක් තිබිලා නැතුව ඇති. අපේ රෝහලේ අයගේ සහයෝගය ඇතුව ගැබිනි මව්වරුන්ට අවුරුදු උත්සවයක් කරන්න හිතුණේ ඒකයි."

මට ඒ පැහැදිලි කිරීම කළේ මා සිටින්නේ දෙගිඩියාවක බව තේරුම්ගත් ඌව පරණගම ප්‍රාදේශීය රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී ඩබ්ලිව්.පී.එස්.උදය මහතාය. ඔහුගේ ඒ සංකල්පය මත මේ අපූරු අවුරුදු උත්සවය සංවිධානය කර තිබුණේ රෝහල් කාර්යය මණ්ඩලය හා රෝහල් කමිටුවයි. මේ අවුරුදු උත්සවයේ නම 'උතුම් මාතෘත්වය වෙනුවෙන් පිදෙන ගර්භිණී බක් මහා උළෙල'යි.

"අවුරුදු උත්සවයකට දරුවෙක් ලැබෙන්න ඉන්න අම්මා කෙනෙක් ගියොත් මුලින්ම කරන්නේ පුටුවක් දීලා එයාව පැත්තකින් වාඩිකරවන එක. හැබැයි මේ ගර්භිණී අවුරුදු උත්සවේ හැම තරඟයකටම සහභාගී වෙන්නේ ගැබිනි මව්වරු විතරයි."

වෛද්‍ය උදය මහතා අපූරු අවුරුදු උත්සවයේ විශේෂත්වය පැහැදිලි කරද්දී තරඟ ආරම්භ වෙන තෙක් මට ඉවසුමක් තිබුණේ නැත.

"ඌව පරණගම ග්‍රාමසේවා වසම් 24ක් තුළ ඉන්න ගැබිනි මව්වරු 100ක් මේකට සහභාගී වෙනවා. මෙහෙම දෙයක් කරන්න යනවා කියද්දි එයාලත් පුදුම විදියට සතුටු වුණා. මේ අවුරුදු උත්සවේ තේමාව 'උතුම් මාතෘත්වය වෙනුවෙන් පිදෙන බක් මහා උළෙල' කියන එකනේ. ඉතින් අපිට ඕන වුණා ලොකු ගෞරවයක් එක්ක මව්වරුන්ව අවුරුදු උත්සවයට රැගෙන එන්න. ඒ වෙනුවෙන් මේ කිට්ටුව තියෙන අඹගස්දෝව ජනාධිපති විද්‍යාලයේ බෑන්ඩ් කණ්ඩායමට ආරාධනා කළා."

අලංකාර පෙරහරෙන් ගැබිනි මව්වරු අවුරුදු උත්සව භූමියට පැමිණි පසුව සෙත් පිරිත් කියා සංඝරත්නය ඔවුන්ට ආශිර්වාද කළේය.



වෛද්‍ය ඩබ්ලිව්.පී.එස්.උදය



"කණාමුට්ටිය බිඳීම, අලියට ඇස තැබීම, අන්ධයාට කිරි කැවීම, සංගීත තොප්පි තරඟය, හොඳම හිනාව, හොඳම ඇඳීම වගේ අවුරුදු උත්සවයක තියෙන හැම තරඟයක්ම මේ අවුරුදු උත්සවයෙත් තියෙනවා."

එකී තරඟවලට ගැබිනි මව්වරු සහභාගී වූයේ දැඩි උද්‍යෝගයකින්ය. එහෙත් එතැන හුන් කාගෙ කාගේත් වැඩි අවධානය යොමුවුණේ හොඳම ගර්භිණී කුමරිය තේරීමේ තරඟයටය.

"අවුරුදු කුමරිය තරඟය හොඳම ගර්භිණී කුමරිය විදියට වෙනස් කළා. හොඳම ගර්භිණී කුමරිය තේරුවේ රූපයම බලලා නෙවෙයි. දැනුමත් පරීක්ෂා කළා. ගර්භිණී කාලෙට අම්මෙක් දැනුවත් වෙන්න ඕන කරුණු කාරණා ගැනයි ඇහුවේ. වැලිමඩ මූලික රෝහලේ වෛද්‍ය අධිකාරිතුමිය මධාරා ගුණසේන මහත්මිය තමයි ඒ තරඟය අධීක්ෂණය කළේ."

මේ ගර්භිණී අවුරුදු උත්සවය සූදානම් කිරීම පිටුපස කතාවද අපූරුය. එය සිදුකර ඇත්තේ ඒ ඒ ගැබිනි මව්වරුන්ගේ දෙළදුකට ප්‍රමුඛත්වය දෙමිනි.

"මුලින් අපි මේ ගැබිනි අම්මලා සියදෙනාට දත්ත පත්‍රිකාවක් දුන්නා. තමන් කන්න කැමතිම කෑම වර්ගය, පලතුරු වර්ගය, එළවලු වර්ගය, රසකැවිලි වර්ගය, බත් වර්ගය වගේ දේවල් තමයි ඒකේ පුරවන්න තිබුණේ. පස්සේ ඒ ඒ අය කැමති දේවල් දාලා එකකට එකක් වෙනස් පාර්සල් සීයක් හැදුවා. එහෙම කරපු එකෙන් අම්මලා දෙළදුක් කාලයට කන්න කැමති කෑම ගැන අවබෝධයකුත් ලැබුණා. වෛද්‍යවරු විදියට අපිට ඒක වැදගත්."

අවුරුදු උත්සවයේ තරඟවලින් ජයග්‍රහණය කළ ජයග්‍රාහිකාවන්ට වටිනා ත්‍යාගද සූදානම් කර තිබිණි.

"ඒ වගේම ගර්භිණී කාලසීමාවේ අම්මෙකුට අවශ්‍ය කරන බඩු භාණ්ඩ පර්සලයකුත් අපි දෙනවා. බදුල්ල දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරි වංගියකුඹුරේ සමිත හිමි මේ අවස්ථාවට වැඩම කළා. ඒ වගේම ඌව පරණගම ප්‍රාදේශීය රෝහලේ රෝහල් කාර්ය මණ්ඩලය වගේම රෝහල් කමිටුවත් මතක් කරන්න ඕනේ. ඔවුන් නොහිටින්න මෙහෙම දෙයක් කරන්න ලැබෙන්නේ නෑ. මේ ප්‍රදේශයේ විහාරස්ථානවලින්, පාසල්වලින්, අඹගස්දෝව පොලිසියෙන්, සමිති සමාගම්වලින්, ව්‍යාපාරික ප්‍රජාවගෙන් වගේම ප්‍රදේශවාසීන්ගෙනුත් අපට උදව් ලැබුණා. අවුරුද්දක් ගාණෙම මේ ගර්භිණී අවුරුදු උත්සවය මේ රෝහලේදී පවත්වන්න අපි හිතාගෙන ඉන්නවා."





පසුගිය දිනවල රට්ටුන්ගෙන් බැණුම් ඇසූ විච්චූරණ අවුරුදු උත්සව දෙස බලද්දී මෙවැනි ආදර්ශවත් අවුරුදු උත්සව ගැන නොලියා බැරිය. එදා අවුරුදු උත්සවය නිමාවීමට පෙර අත්‍යවශ්‍ය රාජකාරියක් වෙනුවෙන් යන්නට වූ නිසා පසු දිනක මා වෛද්‍ය උදය මහතාට ඇමතුමක් ගත්තේ එදා අවුරුදු උත්සවය අවසානයේදී ගර්භිණී මව්වරුන්ගෙන් ලැබුණු ප්‍රතිචාර ගැන අසන්නටය.

"අම්මලාට හරිම සතුටුයි. ගර්භිණී කාලෙට එහෙම හිනාවෙලා සතුටින් ඉන්න එක ගොඩක් හොඳයි. ගොඩාක් අම්මලා එයාලා ආස විදියේ කෑම දුන්නට ස්තූති කළා. ගැබිනි මව්වරු කියලා එයාලව පැත්තකට කරලා තියන්න ඕනේ නැහැ. ගර්භිණී කාලේ වුණත් කඩිසරව මේ වගේ දේවල් කරන්න ඒ අයට ඉඩ දෙන්න ඕනේ. ඒක එයාලගේ ඇඟට වගේම හිතටත් හොඳයි."



■ රුවන් එස්.සෙනවිරත්න

# දැනටමත් දොස්තරලා දීපු දින පැනලා අනේ අපේ දරුවාව බේරගන්න උදව් කරන්න





**තිවංකා ජයන්ති/දනුෂ්ක සඳමාල්**

> **දරුවගේ ඇඟත් රිදෙනවා ඇති. එයා දවස පුරාම අඬනවා. එතකොට අපිටත් ඉවසන්න බෑ. දරුවා ලැබුණු දා ඉඳලා අපි දෙන්නත් එක රැයක් හරියට නිදාගෙන නෑ**

"බෑ... බෑ මෙතැන ආධාර එකතු කරන්න බැහැ එළියට යන්න... එළියට යන්න."

පන්සල ඇතුළේ උපාසක මහත්තුරු පිරිසක් කරපු ගාලගෝට්ටිය ඇහිලා මාත් නිකමට ඒ පැත්ත විපරම් කළා. එතැන හිටියේ පුංචි දරුවෙක් වඩාගත්තු තරුණ අම්මා කෙනෙකුයි තාත්තා කෙනෙකුයි.

උපාසක සද්ද පූජාව නිසා මූණු මැලවුණු අම්මයි තාත්තයි පන්සලෙන් එළියට ගියා. ප්‍රසිද්ධ ස්ථානවල දරුවෝ පෙන්නලා ආධාර එකතු කරන පිරිස ඕසෙට. හැබැයි මේ අම්මගේයි තාත්තගෙයි මූණුවල හැබෑම අසරණකමක් දැකපු නිසා මාත් ඒ අයගේ පස්සෙන් ටිකක් ඇවිදගෙන ගියා. පන්සලෙන් එළියට ගියපු යුවල ඊගාවට ඒ අවට ගෙවල් දෙක තුනකට ගියා.

"බබාට අසනීපද? මොකද්ද අසනීපේ?"

ඔය ගමන ටිකක් කිට්ටු කරලා මම ඇහුවා.

"අනේ ඔව් මිස්. දරුවගේ අක්මාව නරක් වෙලා."

එහෙම කියපු හැටියේ විශ්වාස නොකරයි කියලා හිතපු නිසාදෝ අම්මා වෛද්‍යවරු සහතික කළ දරුවගේ වෛද්‍ය වාර්තා සේරම මගේ අතින් තිබ්බා.

"මම වැඩ කරන්නේ ගුවන් හමුදාවේ. අපි සාමාන්‍ය පවුලක මිනිස්සු. දරුවව හොඳ කරගන්න සල්ලි ඕනේ. ලැජ්ජාව පැත්තක තියලා සල්ලි හොයන්න අපි ගෙවල් ගානේ ඇවිදිනවා. අපේ කකුල්වල පොට ගිහිල්ලා හරි කමක් නෑ අපේ දරුවව බේරගන්න ලැබෙනවා නම්."

එහෙම කිව්වේ තාත්තා. ඔහු දනුෂ්ක සඳමාල්. අම්මගේ නම ජයන්ති කුමාරි. ඉස්සර හැම ගමකම ඉස්පිරිතාල නැති කාලේ ගෙදර දරුවෙක්ට අසනීපයක් වුණාම අම්මලා තාත්තලා දරුවෝ කරගහන් කකුල් කැපෙනකල් හැතැප්ම ගාණක් පයින් යනවලු. දරුවන්ගෙ ජීවිත බේරගන්න ඉස්පිරිතාලවලට පයින් ගාටන අම්මලා තාත්තලා අදටත් ඕන හැටියට ඉන්නවා.

මේ ළඟදි මම නිවුස් එකක් දැක්කා කෙලී කියලා එංගලන්තේ අම්මා කෙනෙක් ගැන. ඇගේ අවුරුද්දේ දියණියට උපතින්ම දරුණු හෘද රෝගයක් තිබිලා. අම්මගේ කැපවීම නිසා ඒ දුවව සනීප කරගන්න පුළුවන් වෙලා. සතුටට කෙලී දරුවත් වඩාගෙන සැතපුම් 91ක් පයින් ගිහින්. ඒ ලැබුණු මුදල් පරිත්‍යාග කරලා තිබුණොත් ළමා රෝහලකට. කෙලී ඇවිද්දේ දරුවා සුවවීමේ සතුටෙන්. හැබැයි මේ අම්මයි තාත්තයි ඇවිදින්නේ දුකෙන්. අනේ කෙලී අම්මට වගේ සතුටක් කවදාහරි මේ අම්මලටත් උදාවෙනවා නම්...

"බබාගේ නම සවීන් තෙනුල්‍ය. අවුරුද්දයි මාස තුනයි. මුල් මාස තුනේ බබාට කිසි ප්‍රශ්නයක් තිබුණේ නැහැ. මාස තුනක් යද්දි බබාගෙ ඇස් සම්පූර්ණයෙන්ම කහ වුණා. අපි බයවෙලා ඉස්පිරිතාලෙ අරන් ගියා. බබාගේ පිත නාල බ්ලොක් වෙලාලු. අක්මාව නරක් වෙන්නේ ඒ නිසාලු. බබා ජීවත්වෙන්නේ අවුරුද්දයි කිව්වා. ඊට කලින් ඔපරේශන් එක කරගන්න කිව්වා."

එවෙලේත් පුංචි පුතා සවීන් හිටියේ අඬ අඬ. පුතාගේ ප්ලීහාවයි අක්මාවයි ඉදිමිලාලු. බඩ ගාව ලොකු ගෙඩියක් මම දැක්කා. ඒක හර්නියා එකක්ලු. කුමාරි කිව්වා වගේ දරුවගේ ඇස් කහ පාටයි. අත පය කෝටු ගැහිලා.

"ඇතුළේ අවයව හරියට නැති නිසා බබා මොනවා කෑවත් අනිත් පැත්තට මළ විදියට පිට වෙනවා. ඒ නිසා එයා වර්ධනය වෙන්නෙ නෑ. දරුවව හොඳ කරන්න නම් ඔපරේශන් එකට ඉන්දියාවේ ගෙනියන්න ඕනේ. ඔපරේශන් එකට විතරක් එක් කෝටි පන් ලක්ෂයක් යනවා. අනිත් පරීක්ෂණවලට තව ලක්ෂ පනහක් ඕනේ. මහත්තයා වැඩ කරන තැනින් අපිට යම් මුදලක් ලැබෙයි කියලා හිතුවා. ඒත් එහෙම සහනයක් ලැබුණේ නෑ. සල්ලි හොයාගන්න සෑහෙන උත්සාහ කළා. දැන් දරුවගේ ඔපරේශන් එකේ දින පැනලා. ඉවසන්නම බැරි තැන තමයි අපි මෙහෙම පාරට බැස්සේ."



අම්මයි තාත්තයි දෙන්නම කතා කළේ ඇස්වල කඳුළු පුරෝගෙන. දරුවෙක් මැරෙන්න යනවා කියලා දැනගෙන ජීවත්වෙන අම්මලා තාත්තලගේ මූණුවලට හිනාව කොහෙන්ද?

"දරුවගේ ඇඟත් රිදෙනවා ඇති. එයා දවස පුරාම අඬනවා. එතකොට අපිටත් ඉවසන්න බෑ. දරුවා ලැබුණු දා ඉඳලා අපි දෙන්නත් එක රැයක් හරියට නිදාගෙන නෑ."

දරුවෙක්ගේ දුකකදි දෙමාපියන්ගේ ඇස් පියවෙන්නෙත් නෑ. දරු සොවට පපුව රිදෙන එක නවතින්නෙත් නෑ.

"සවීන් මගේ තුන්වැනි පුතා. තව පොඩි බබාලා දෙන්නෙක් ඉන්නවා. එයාලගේ වැඩත් කොහොමහරි කරගන්නවා. බබාව නිතරම ඉස්පිරිතාලෙ අරන් යනවා. ලේ බලවනවා. ගෙදර තියාගෙන ඉන්නත් හිතට බයයි. නිතරම බෝධිපූජා තියනවා."

බබාගේ මාසේ වියදම 15,000ක්ලු. ඒ දේවලටත් වඩා කුමාරිලා උදව්වක් බලාපොරොත්තු වෙන්නේ දරුවගේ ඔපරේශන් එකට.

"අපේ රටේ ඉන්නේ අනුන්ගේ දුකේදි හිත් උණුවෙන මිනිස්සු. අපි ගියපු කිසිම ගෙදරකින් අපිට බැනලා එළෙව්වේ නෑ. හැමෝම පුළුවන් විදියට උදව් කළා. දැන් යම්කිසි මුදලක් එකතු වෙලත් තියෙනවා. හැබැයි තාම පුතාගේ ඔපරේශන් එකට සල්ලි මදි. ඔපරේශන් එක නොකර පුතාව තව කොච්චර කාලයක් මෙහෙම තියාගන්න පුළුවන් වෙයිද දන්නේ නෑ. ඉතින් අපේ පුංචි පුතාගේ ජීවිතේ වෙනුවෙන් පොඩි මුදලකින් හරි උදව්වක් හරි කරන්න කියලයි අපි හැමෝගෙන්ම ඉල්ලන්නේ."

'අපේ රටේ ඉන්නේ අනුන්ගේ දුකේදි හිත් උණුවෙන මිනිස්සු.' ඉතින්, මේ අහිංසක අම්මයි තාත්තයි බලාපොරොත්තු තියාගෙන ඉන්නේ ඔයාලා ගැනයි. පුංචි සවීන් පුතා ජීවිතේ පටන්ගත්තා විතරයි. හැබැයි පුතාට තව ලොකු කාලයක් නැහැ. ඉතින් මේ පුංචි ජීවිතේ අකාලේ මිලාන වෙන්න ඉඩ නොදී පුංචි රුපියල් සීයකින් හරි පුංචි පුතාගේ ජීවිතේ බේරගන්න දායකවෙන්න කියලයි අපිත් ඉල්ලන්නේ. 0767247671/0769235613 අංකවලට මේ අම්මලාට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි



අත්තනායක එම්. හේරත්

රත්තරන් දුවේ



# දුවෙක් කියන්නේ අම්මගෙයි තාත්තාගෙයි නොවරදින ඉන්ෂුවරන්ස් එකට...

මේ කතාව මට කියන්නේ සිද්ධියට අදාළ අම්මගේම කටහඬින්. අම්මගේ වයස අවුරුදු 84ක්. ඇය නිවසක මෙහෙකාරියක් විදියට රැකියාවක් සොයාගැනීම සඳහා දන්නා හඳුනන අයට කියමින් වෙහෙසවෙමින් ඉඳලා තියෙනවා. 'ධරණී' පුවත්පතේ මගේ අංකය දුටු ඇය මට කතා කළේ ඇගේ කතාව කීමට නොවේ, ඇයට රස්සාවක් හොයාගැනීම සඳහායි. ඇගේ වයස ගැන ඇසූවිට මට ඇගේ කතාව අසන්නට හිතුණා. ඒ අම්මා හා තාත්තාට එකම පුතෙකුයි දුවෙකුයි තමයි ඉඳලා තියෙන්නේ. ඒ දෙන්නා පුතාට විශේෂ සැලකිල්ලකුත් දුවට තරමක් අඩු සැලකිල්ලකුත් තමයි දීලා තියෙන්නේ. මේ අම්මගේ මහත්තයා ජීවත්ව ඉන්න කාලෙම ඒ අයට තිබුණ නිට්ටඹුව ප්‍රදේශයේ පාරට ආසන්න ඉඩම ලොකු පුතාට ලියලා. තමන්ගේ පරම්පරාවේ නම ගෙනියන්න ඕන නිසා තමයි තාත්තා දේපළ පුතාට ලියලා තියෙන්නේ. අම්මා ඒකට විරුද්ධ වෙලත් නැහැ. දුව විරුද්ධ වෙලත් නැහැ. මොකද ඒකනේ රටේ සම්ප්‍රදාය.

තමන්ට ලැබුණ ඉඩම ගැන පුතා හිටියේ ආඩම්බරෙන්. නංගිට දෙන්න දෙයක් තාත්තට තිබුණෙ නැහැ. නංගි දීග දෙන දවසේ නිට්ටඹුවේ ලී බඩු කඩයක විකුණාගන්න අමාරු ලී බඩු ලොරියක් අඩු ගාණට ගන්න තාත්තට පුළුවන් වුණා. ඉතින් දුව දීග දෙනකොට මඟුල් කාර් එක පස්සෙන් දෑවැදි ලොරියත් ආවා. පාර දෙපැත්තේ අයට හරිම සතුටුයි. මොකද දුවගේ දෑවැද්ද පාරෙ ප්‍රසිද්ධියේ ගමන් කරනවනේ. ඒත් කවුරුවත් දැනගෙන හිටියේ නෑ කෝටි ගණනක් වටිනා ඉඩම පුතාට පවරා තියෙන බව. දුවගේ දෑවැද්ද ජංගම දෑවැද්දක්. පුතාගේ දෑවැද්ද ස්ථාරව ගිණුමක්. ඉතින් දුව බැන්ද ස්වාමිපුරුෂයා රජයේ රැකියාවක නියුතු කෙනෙක්. එයාට ලැබුණෙ පොඩි වැටුපක්. ඒත් මේ තරුණයා බිරිඳගෙන් තමන්ට නොලැබුණ දේ ගැන කවදාවත් කතා කළේ නැහැ.

පුතා ඉක්මනින් පොහොසතෙක් වන රජයේ රැකියාවකුයි කළේ. ඔහු ඉතාම ඉක්මනින් පරණ ගෙදර කඩලා තට්ටු තුන හතරක මහගෙදරක් හැදුවා. අම්මයි තාත්තයි තියාගත්තා. පුතා විවාහයක් කරගත්තා. එදා ඉඳලා පුතා ලේලිගේ කීම මත අම්මට තාත්තට වෙනස්කම් කරන්න ගත්තා. තාත්තට මේ පීඩනය එච්චර දරාගන්න බැරිව ඒ ගෙදරදීම මියගියා. මරණ ගෙදරට යානවාහන ගොඩක් ආවා. කන්න බොන්න පවා නැතිව තමන්ගේම ඉඩමේ මේ අසරණ තාත්තා මියගියා. පුතාට මළගෙදර උත්සවයක්. පුතාගේ හිතේ තිබුණා ප්‍රාදේශීය සභාවට ඡන්දය ඉල්ලන්න. ඊළඟට ලේලිගේ බැල්ම එල්ලවුණේ නැන්දම්මා දිහාවට. ගෙදර සියලුම වැඩ අම්මා කළත් ලේලිට ඕන වුණේ නැන්දා එළවාගන්න. ඇය එක්තරා ඉරිදාවක නැන්දම්මගේ රෙදි ටික මල්ලට දාලා අම්මව දොට්ට දැම්මා. අම්මා දුව හොයාගෙන ගියා. පුංචි ගෙදරක දුව ප්‍රීතිමත් විවාහයක් ගතකරනවා. අම්මා ගෙට ඇතුළුවන විටම දුව දැනගත්තා අම්මට වෙච්ච දේ. "අම්මා ඔයා මට දුන්නේ නිට්ටඹුවේ කඩේක දිරාගිය ලී බඩු ලොරියක්නේ. අම්මට තිබුණා ඒ ඉඩම දෙකට බෙදලා මටත් කොටසක් දෙන්න. ඒත් අම්මා ඒක කළේ නැහැ. මේක මගේ පුංචි ගෙදර. අම්මා දුන්න ලී බඩු එකක්වත් දැන් නැහැ. මමයි දුවයි පුතයි මහත්තයයි මේ ගේ කෑල්ලේ ජීවත්වෙනවා. අපි නිදාගන්නේ පැදුරේ. ඒත් අපි ඉන්නේ සතුටෙන්. මම අම්මව එළවන්නේ නැහැ අයියා වගේ." එහෙම කියලා එයා වහාම දුරකතන ඇමතුමක් දීලා මහත්තයව ගෙන්න ගත්තා.



නෝනගේ අම්මව දැක්ක බෑණා දණගහලා නැන්දට වැන්දා. "අම්මේ, අම්මා ඉන්න අපිත් එක්ක. හිඟා කාලා හරි මම අම්මව බලාගන්නවා. මට සල්ලි නැහැ. අම්මගෙ දුව, මගේ නෝනා හරිම අහිංසකයි. එයාගේ සතුට මගේ සතුට. හැබැයි ගේ පුංචියි. සල්ලි හොයන්න මං ගොඩාක් දුක් විඳිනවා. මගේ නෝනා මට ගොඩක් ආදරෙයි. ඉතින් වේලක් හැර වේලක් නොකා හරි අපි එකට ඉමු අම්මේ." මේ වචන ඇහෙනකොට අම්මට ඒක දරාගන්න බැරිවුණා. ජාතක කතාවල අහලා තිබුණ බෝධිසත්වයෙක් අම්මට සිහිවුණා. දුවගේ බබාලා දෙන්නා කිසිම දෙයක් ආච්චිට නොදී කන්නේ නැහැ. ලොකු බබා හය වසරේ. දෙවැනි බබා දෙක වසරේ. ඉතින් මොන්ටේරෝ, ප්‍රාඩෝ වාහන පිරිවරාගෙන තමන් දුන් ඉඩමේ රජෙක් වගේ වැජඹෙන පුතයි, දහදුක් විඳගෙන තමන්ට සලකන බෑණයි දකිනකොට අම්මට මතක්වෙන්නේ මගේ පුතා දේවදත්තයෙක් බෑණා බෝධිසත්වයෙක් කියලයි. දේවදත්තයෙකුට අම්මා වීම ගැන ඒ අම්මට දුකයි. ඒත් ඒ කුසයේම උපන් දුව ඇයට මහාමායාවක්, විශාඛාවක්, යසෝදරාවක්. දුවයි පුතයි දවසක් අම්මට කියනවා "අම්මේ මේ ඉඩම පර්චස් දහයයි. මේ ඉඩම හරියට දෙකට මැදින් බෙදලා එකක් දුවට අනෙක පුතාට. අපි දෙන්නම ඒක ඒ දෙන්නට කියලා ඉවරයි." තමන්ගේ කුසයේ උපන් පින්වන්ත දියණිය ගැන අම්මට හරිම දුකයි. ඒත් ඒ දුව බෑණාට සබ්බ භාර්යාවක්. ඉතින් අම්මට දුකයි මේ දෙන්නට කරදර දෙන්න. ඒකයි මේ අම්මා රැකියාවක් හොයන්න පෙළඹිලා තිබුණේ. අම්මට එහෙම කරන්න එපා කියලා මම කිව්වා. මොකද ඒ අම්මා හොඳටම වයසයි. ගෙදරක වැඩපල කරන්න තරම් හයියක් උන්දැට නැහැ.

**මොන්ටේරෝ, ප්‍රාඩෝ වාහන පිරිවරාගෙන තමන් දුන් ඉඩමේ රජෙක් වගේ වැජඹෙන පුතයි, දහදුක් විඳගෙන තමන්ට සලකන බෑණයි දකිනකොට අම්මට මතක්වෙන්නේ මගේ පුතා දේවදත්තයෙක් බෑණා බෝධිසත්වයෙක් කියලයි. දේවදත්තයෙකුට අම්මා වීම ගැන ඒ අම්මට දුකයි**

කොහොම නමුත් මම මීට කලිනුත් කියලා තියෙනවා වගේ, මේ කතාවෙනුත් ගන්න තියෙන්නේ එක පාඩමයි. ඒ තමයි දුවෙක් කියන්නේ අම්මගේ තාත්තගේ නොවරදින ඉන්ෂුවරන්ස් එක කියන එක. මේ අම්මට ඒක තේරුම් යද්දී ප්‍රමාද වැඩියි. නමුත් මේ ලිපිය කියවන අම්මලා, තවමත් ඒ කාරණාව තේරුම්ගන්න ප්‍රමාද නෑ කියලයි මට හිතෙන්නේ.

අත්තනායක එම්. හේරත්



දිවිය පුරා ළඟ රැඳෙනා
හද පිරි සෙනෙහසින් ඉතිරෙනා
දැයේ රන් මව්වරුන්
රකිමු සෙනෙහෙන් සදා

**ලෝක මව්වරුන්ගේ දිනය නිමිත්තෙන් ලක්වාසී සියලු අම්මාවරුන් සමරන්නට SLIC වෙතින් සුබ ප්‍රාර්ථනා!**

Sri Lanka Insurance

www.srilankainsurance.com

0112 357 357

SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්

Company Registration Number - PB 289



# සනීපාරක්ෂක තුවායක් උපරිම පැය 4යි

## මේක අවුරුදු 10යි



අරුණාචලම් මුරුගනන්තම් කියල දුප්පත් ඉන්දියානු ජාතිකයෙක් හිටියා. ඔසප් දවසට බිරිඳ කිළිටු රෙදි කෑලි පාවිච්චි කරන බව ඔහු දැක්කේ අහම්බෙන්. ඒක අරුණාචලම්ගේ හිතට ලොකු වේදනාවක් වුණා. කඩේට ගිහින් සනීපාරක්ෂක තුවායක් මිලදී ගන්න හැදුවත් එව්වයේ මිල වැඩි නිසා බිරිඳ වෙනුවෙන් එහෙම දෙයක් කරන්නත් ඔහුට පුළුවන්කමක් තිබුණේ නෑ. අරුණාචලම්ගේ වේදනාව තවත් වැඩි වුණා. ඒ නිසා බිරිඳ වෙනුවෙන් සනීපාරක්ෂක තුවායක් හදන්න අවසානෙදි ඔහු තීරණය කළා. හැබැයි ඒ වැඩේ ලේසි වුණේ නෑ. ප්‍රශ්න ගොඩකට මුහුණ දෙන්න වුණා. නින්දා අපහාස විඳින්න වුණා. කැපකිරීම් කළා. ඒ කැපකිරීම්වල ප්‍රතිඵලය විදියට ඔහු සනීපාරක්ෂක තුවා හැදුවා. බිරිඳ වෙනුවෙන් විතරක්ම නෙමෙයි මුළු ඉන්දියාවෙම දුප්පත් කාන්තාවන් වෙනුවෙන්. එතැනින් නොනැවතී ඔහු සහන මිලට ඒ පෑඩ් ඉන්දියාවේ කාන්තාවන්ට ලබාදුන්නා. අරුණාචලම්ගේ ඒ කතාව අලලා තමයි 'පෑඩ් මෑන්' කියන චිත්‍රපටය හැදුණේ.

ඉස්සර ලංකාවේ කාන්තාවන්ගෙන් සැලකිය යුතු පිරිසක් සනීපාරක්ෂක තුවා ඇන්දා. හැබැයි උද්ධමනය එක්ක එව්වයේ මිල ඉහළ යාම නිසා මෙහෙත් බොහෝ දෙනෙක් සනීපාරක්ෂක තුවා භාවිතය අතඇරලා. හැබැයි ඒ අයට දැන් විසඳුමකුත් තියෙනවා. ඒ තමයි Menstrual Cup. පිටරටින් ආනයනය කරන Menstrual Cup ගැන මුලදි අපේ කාන්තාවන්ට ලොකු උනන්දුවක් තිබුණේ නැහැ.

හැබැයි නැවත නැවත භාවිතා කරන්න පුළුවන්කමත් එක්ක වියදම් අඩු නිසා දැන් ගොඩක් කාන්තාවන් මේ ගැන උනන්දුයි.

ලංකාවට ඔපස් කප් ආනයනය කරන ප්‍රමුඛතම සමාගම ලේඩි ලංකා පෞද්ගලික සමාගමයි. මේ ආයතනයේ හිමිකාරිය සජනා විජේසිංහ. මිල අධික සනීපාරක්ෂක තුවා වෙනුවෙන් ඉන්දියානු කාන්තාවන්ට අඩු මුදලට පෑඩ් දුන්නු අරුණාචලම් වගේම අපේ රටේ කාන්තාවන්ට වෙලාවේ හැටියට හොඳම විකල්පයක් දීපු සජනාත් ඇත්තටම කතාබහට ලක්විය යුතු චරිතයක්. 'ධරණී' අපි ඇයත් එක්ක කතා කරන්න හිතුවේ ඒ නිසයි.

**"මං මෙහෙම ව්‍යාපාරයකට අතගැහුවේ ලොකු අවදානමක් අරන්. මොකද තවමත් අපේ රටේ බහුතරයක් කාන්තාවන් ඔසප් දවස්වලදි පාවිච්චි කරන්නේ සනීපාරක්ෂක තුවා. ඒ අය මේ නිෂ්පාදනය කොයි විදිහට බාරගනියිද කියන එක ගැන මට පොඩි බයක් තිබුණා. හැබැයි පොඩි කාලයක් ඇතුළත බොහෝ පිරිසක් Menstrual Cup වලට හුරුකරවන්න මට පුළුවන් වුණා. මේ වෙනකොට මගෙන් බොහෝ පිරිසක් Menstrual Cup අරගන්නවා."**

සජනා එහෙම කිව්වට සනීපාරක්ෂක තුවාවලට හුරුවෙලා හිටපු අපේ කාන්තාවන්ට Menstrual Cup තාම අලුත්. ඉතින් Menstrual Cup කියන්නේ මොනවද කියන තැනින්ම අපි කතාව පටන්ගමු.

"මේක ඔසප් දවසට සනීපාරක්ෂක තුවා වෙනුවට පාවිච්චි කරන්න පුළුවන් උපකරණයක්. යුරෝපීය රටවල නම් විවාහ නොවුනු අයත් මේවා පාවිච්චි කරනවා. මේක යෝනි මාර්ගයට ඇතුළු කරන උපකරණයක්නේ. ඉතින් අපේ සංස්කෘතික කාරණා එක්ක විවාහ නොවුනු කාන්තාවන්ට මේවා පාවිච්චි කරන්න කියලා අපිට කියන්න බෑ. පෙනුම පුනීලයක් වගෙයි. ඉතාම සුමුදු නම්‍යශීලී කප් එකක්. මේවා නිෂ්පාදනය කරන්නේ පොඩි දරුවන්ගේ සූප්පු එහෙම නිෂ්පාදනය කරන්න ගන්න Original Medical Grade Silicon කියන අමුද්‍රව්‍යයෙන්."

**අපේ සංස්කෘතික කාරණා එක්ක විවාහ නොවුනු කාන්තාවන්ට මේවා පාවිච්චි කරන්න කියලා අපිට කියන්න බෑ.**

Menstrual Cup එක ශරීරය අභ්‍යන්තරයට පාවිච්චි කරන දෙයක් නිසා උපරිම ප්‍රමිතියත් තියෙන්න ඕනේ. ඒ වගේම ඒක Original Medical Grade Silicon කියන අමුද්‍රව්‍යයෙන් විතරක් නිෂ්පාදනය කරපු එකක්ද කියලත් බලන්න ඕනාලු.

"මිලිලීටර් 25 Small Cup සහ මිලිලීටර් 30 Large Cup කියලා කප් වර්ග දෙකක් තියෙනවා. එතැනින් දරු ප්‍රසූතියක් කරලා නැති කාන්තාවන්ටයි, සිසේරියන් සැත්කම්වලින් දරු ප්‍රසූති කරලා තියෙන කාන්තාවන්ටයි හොඳ මිලිලීටර් 25 පොඩි කප් එක. මිලිලීටර් 30 Large Cup එක සාමාන්‍ය දරු ප්‍රසූතියක් කරලා තියෙන කාන්තාවන්ට හොඳයි. මෙතැනින් කොයි එක පාවිච්චි කළත් අංක එකට බලන්න ඕනේ ප්‍රමිතිය. දැනට වෛද්‍ය උපකරණ සඳහා ලබාදෙන ISO 13485:2016 තත්ත්ව සහතිකය තියෙන ලංකාවේ එකම Menstrual Cup නිෂ්පාදනය තමයි මගේ ගාව තියෙන්නේ."

කෙනෙක් සනීපාරක්ෂක තුවායෙන් Menstrual Cup එකකට මාරුවෙනවානම් මේවගේ වාසි ගොඩක් තියෙනවා.

"ලොකුම වාසිය Menstrual Cup එකක් අවුරුදු දහයක් තරම් දීර්ඝ කාලයක් වුණත් පාවිච්චි කරන්න පුළුවන්. ඒකෙන් අවුරුදු දහයක් පුරා සනීපාරක්ෂක තුවාවලට වියදම් වෙන මුදල් ඉතුරුයි. අනික මේක එකදිගට පැය 10ක 12ක කාලයක් භාවිතා කරන්න පුළුවන්. සනීපාරක්ෂක තුවා පාවිච්චි කරද්දි ශාරීරික සහ මානසික අපහසුතා දැනෙනවා, කකුල් කැපෙනවා, දද, කුෂ්ඨ වගේම බැක්ටීරියා ආසාධනය වෙන්න පුළුවන්, රුධිරය බාහිරට එනවා, දුගඳක් වහනය වෙනවා වගේ පොදු ප්‍රශ්න ටිකකට මුහුණපාන්න වෙනවා. ඒත් Menstrual Cup එකක් භාවිතා කරද්දි ඔය එකක්වත් නෑ. සාමාන්‍ය දවස්වල වගේ ඕනෑම වැඩක් කරගෙන ඔසප් දවසක් නෙවේ වගේ ඉන්න පුළුවන්. තව විශේෂ දෙයක්. මේක තමයි ඔසප් හැදුනු කෙනෙක්ට වතුරේ පාවිච්චි කරන්න පුළුවන් එකම නිෂ්පාදනය. සනීපාරක්ෂක තුවා පාවිච්චි කරපු කෙනෙක් ටික දවසකට Menstrual Cup එකකට මාරුවුණොත් එයා ආයෙත් ජීවිතේට සනීපාරක්ෂක තුවා අඳින එකක් නෑ කියලා මම නිසැකවම කියනවා."

මෙච්චර වාසි තියෙනවා නම් ඔය කියන Menstrual Cup එකක් අස්ප ගණන් ඇති කියලා දැන් කෙනෙක්ට හිතෙන්න පුළුවන්. එහෙම නෑ. සජනා ගාවින් ප්‍රමිතියෙන් ඉහළ Menstrual Cup එකක් රුපියල් හාරදහකට අඩුවෙන් ගන්න පුළුවන්. අවුරුදු දහයකටම රුපියල් හාරදහක් කියන්නේ මේ කාලේ හැටියට ඒක කොයිතරම් සහනයක්ද?

**"මේ Menstrual Cup කාන්තාවන් අතරට ගෙනාපුවහම ඔවුන්ට පොදු ප්‍රශ්න ටිකක් ආවා. පළවැනි ප්‍රශ්නේ මේක පැළඳගෙන මලමුත්‍රා කරන්න පුළුවන්ද කියන එක. උත්තරය කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නෑ. දෙවැනි ප්‍රශ්නය මේක යෝනි මාර්ගය තුළ හිරවෙන්න පුළුවන්ද කියන එක. Menstrual Cup එක හදලා තියෙන්නේම යෝනි මාර්ගයේ හැඩයට ගැළපෙන විදියටයි. ඉතින් කප් එක ඊට ඇතුල් කරපුවම යෝනි මාර්ගයේ මාංශපේශී සංකෝචනය වෙලා ඒක නියමිත තැන ස්ථානගත වෙනවා. මේක පැළඳසිටීම අපහසුද කියලත් සමහරු අහනවා. ඇත්තටම එහෙම කිසිම අපහසුවක් දැනෙන්නේ නෑ. මේක භාවිතා කිරීමත් එක්ක යෝනි මාර්ගය විශාල වෙයිද කියලත් කට්ටිය බයයි. යෝනි මාර්ගය කියන්නේ පහසුවෙන් සංකෝචනය සහ ඉහිල්වීම වෙන අවයවයක්. ඒ නිසා ඒ ගැන බයවෙන්න එපා. මේක පැළඳගෙන නිදාගත්තම රුධිරය කාන්දුවීමක් වෙයිද කියලා තව කෙනෙකුට හිතෙන්න පුළුවන්. එහෙම නෑ. මොකද මේක යෝනි මාර්ගය ඇතුළට හොඳින් සම්බන්ධ වෙනවා. අවසාන වශයෙන් මේක පැළඳගෙන නිදාගත්තම රුධිරය ආපහු ශරීරය ඇතුළට යයිද කියලත් ප්‍රශ්නයක් තියෙනවා. අපේ ශරීරය නිර්මාණය වෙලා තියෙන්නේ බාහිරින් කිසිම දෙයක් ශරීරයට ඇතුල් නොවෙන විදියට නිසා එහෙම ගැටලුවක් නෑ."**

උත්තරේ ටිකක් දිග වුණාට සජනා ඒ සියලුම කාරණා පැහැදිලි කළේ කාන්තාවකට මේක වැදගත් වෙයි කියලා හිතලයි. ඒ අතරේ ඇගේ ආයතනයෙන් Menstrual Cup මිලටගත් අයගේ ප්‍රතිචාර ගැන අහන්නත් අපි අමතක කළේ නෑ.


"ප්‍රතිචාර නම් ඉතාම හොඳයි. කිසිම කෙනෙක් නරකක් කියලා නෑ. මාසෙකට සැරයක් ඔසප් වෙනවද කියලවත් දැනෙන්නේ නෑ කියලයි ගත්තු හැමෝම කියන්නේ. මං මේක කරන්නේ ව්‍යාපාරයක් විදියට හිතලම නෙවෙයි. මොකද කෙනෙක් Menstrual Cup එකක් ගන්නේ අවුරුදු දහයකට සැරයයිනේ. එහෙම බැලුවහම මේකෙන් ලොකු ලාබ උපයන්න බැහැ. ඔසප් දවසට ගැහැනියක් විඳින අපහසුතා මමත් දන්නවා. ඒ අපහසුකම් මේ හරහා හෝ නැති කරලා ඒ දවසටත් අපේ කාන්තාවන්ගේ මූණට හිනාවක් ගේන්නයි මට ඕනේ."

අද වෙළඳපොළේ සනීපාරක්ෂක තුවා තියෙන තැනට තව ටික කාලෙකින් මේ Menstrual Cup ඒවි. ඒක එහෙම වුණු දවසට සජනාට ඇය ගැනම ආඩම්බරයක් හිතෙයි. මොකද ලොකු අවදානමක් අරන් ඔසප් දවසට සහනයක් දෙන්න පුළුවන් අඩු මිල නිෂ්පාදනයක් කාන්තාවන් අතරට ගෙනාවේ ඇයනේ.



■ රුවන් එස්.සෙනවිරත්න


අම්මාවරුන්ගේ
දිනය වෙනුවෙනි
හොඳම දේ දන්නෙ අම්මා
ගෙදරට අවශ්‍ය බඩු ගන්න අම්මත් එක්ක
මාර්කට් ගියපු අත්දැකීම ඔබ විඳලා තියනවද?
ඉවසීම, නැණවත් බව, ඉතිරි කිරීම, අපේ දේට මුල් තැනදීම,
ඒ හැම පාඩමක් ම අම්මගෙන් ඉගෙනගන්න පුළුවන්
ඒ තමයි හොඳම දේ දන්න අම්මා
අම්මාගෙන් ඉගෙනගමු...
ලංකා සතොස
LANKA SATHOSA | லங்கா சதொச
අපේම රටේ අපේම තැන



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**

# ඔන්ලයින් ක්‍රමයට නිධානයක් ගොඩගන්න ගිහින් පොලිසියට කොටුවෙලා

අගනුවරට නොදුරු අර්ධ නාගරික ප්‍රදේශයක හැත්තෑහය හැවිරිදි කාන්තාවකට පසුගිය දිනයෙක තම මියගිය සැමියා සිහිනයෙන් පෙනුණි. ඔහු එසේ සිහිනෙන් දිස්වූයේ නිකම් නොවේ. ලොකු වාසියක් පිළිබඳ පණිවිඩයක් දැනුම්දීමටය. "ගේ ඉස්සරහ ළිඳ ඇතුළේ රුපියල් කෝටි ගාණක් වටිනා රන්, රිදී, මුතු, මැණික් තියෙන නිධානයක් වළදමලා තියෙනවා. ළිඳේ වතුර ටික අයින් කළාම ඒ නිධානය මතු කරගන්න පුළුවන්. ඒත් ඒක ආවට ගියාට කරන්න එපා. ඒවා ගැන හොඳට දැනුම් තේරුම් ඇති කෙනෙකුගේ උපදෙස් අරගෙන බහිරව දේවතාවුන්වහන්සේට පුදපූජා එහෙම පවත්වලා බොහොම අරපරිස්සමට කරන්න. නැත්නම් නිධානය ගන්න එක කොහොම වුණත් මහා විනාශයක් වෙන්නත් ඉඩ තියෙනවා."

එම කාන්තාව හමුවේ පෙනී සිට එසේ කී ඇගේ සැමියා ඒ සැනින් අතුරුදන් විය. තමන් දුටු මෙම සිහිනය කෙතරම් විස්මිත එකක්දයත් ඒ මොහොතේම නින්දෙන් පිබිදුණු කාන්තාව ඒ පිළිබඳව යළි යළිත් සිතන්නට වූවාය.

තමන්ට දිවිහිමියෙන් ආදරය කළ ස්වාමිපුරුෂයා මෙලෙස හදිසියේ සිහිනයෙන් පෙනී සිටිමින් කළ දැනුම්දීම බොරුවක් වීමටද නොහැක. එමෙන්ම ජීවිතයේ අන් කවරදාටත් වඩා ආර්ථික ගැටලු ඉස්මතු වී ඇති වර්තමානයේ ඒ සියලු ගැටලු එක්රැයින් දුරුකොට තම දූ දරුවන්ද සමඟ සුඛෝපභෝගී දිවිපෙවෙතකට මුලපිරීමට මේ නිධානය ඒකාන්ත වශයෙන්ම ඉවහල් වෙතැයි ඇය සිතුවාය.

ඒ අනුව එම කාන්තාව පසුදා උදයේම තමන් දුටු ඒ විස්මිත සිහිනය පිළිබඳව පවුලේ සෙසු සාමාජිකයන්ටත් කියා සිටියාය. ඔවුන්ගේ පොදු අදහස වූයේද ඒ සිහිනයෙන් ලැබුණු පණිවිඩය මුළුමනින් නොසලකා හැරිය යුත්තක් නොවන බවය. එමෙන්ම නොයෙකුත් ආර්ථික කම්කටොලු දුෂ්කරතා තම පවුල වටා ගොඩනැගෙමින් තිබෙන අතරේ මහා විශාල ධන සම්භාරයක් ඇති ඒ ළිඳ දෙස බලමින් සුසුම් හෙළීම මහත් මෝඩකමක් යැයිද ඔවුහු සිතූහ.

එහෙත් ඒ සම්බන්ධයෙන් ඊළඟට පැනනැගුනු බරපතළම ගැටලුවක්ද විය. එනම් එම නිධානය ගොඩගැනීම සඳහා හවුල් කරගත යුත්තේ කාවද යන්නය. ඊට හේතුව ධන තණ්හාවෙන් පෙළෙන ඇදුරකු ඒ කටයුත්තට සම්බන්ධ වුවහොත් එම නිධානය ගොඩදමා උපක්‍රමශීලීව එය පැහැරගැනීමට ඔහුට යම් හැකියාවක් තිබීමය. එමෙන්ම ඒ ඇදුරා මිනීමැරුම් සඳහා වන දමරික සිත් ඇත්තෙකු නම් තම පවුලේ සාමාජිකයන් මරා දමා නිදන් වස්තුව පැහැරගැනීමට ඔහුට පහසු හැකියාවක් තිබීමය. නමුත් පිරිමින්ට සාපේක්ෂව කාන්තාවෝ එතරම් දරුණු සිත් ඇත්තෝ නොවෙයි. එනිසා ඒ නිධානය ගොඩගැනීම සම්බන්ධයෙන් ගුප්ත සේවා කටයුතු සඳහා එවැනි කටයුතු කරන කාන්තාවකගේ සහාය ගන්නට එම පවුලේ සාමාජිකයෝ තීරණය කළහ.

එවැනි කාන්තාවන් කිහිපදෙනෙකු සම්බන්ධයෙන් විමසුම්කොට අවසානයේ එම පවුලේ සාමාජිකයන් තෝරාගත්තේ පාතාල අංජනම නම් අඳුනක් හිමි කාන්තාවකි. ඇය 'මෑණියන්' යනුවෙන්ද හඳුන්වන ලදි.

"ඔය කතාව සහතික ඇත්ත දරුවා. ඔය භූමියේ ජලාශ්‍රිතව මහා වටිනා ධන නිධානයක් සඟවලා තියෙනවා තමයි." එම නිධානයේ කතාව ඇසූ මෑණියෝ තමන් සතු පාතාල අංජනමින් ඒ සම්බන්ධ සත්‍යාසත්‍යතාව විමසා බලා කීවාය. "අනික ඔය පවුලට බොහොම ආදරෙන් ඉඳලා පරලෝකප්‍රාප්ත වුණු ඒවගේ ඥාතියෙක් කීයටවත් එහෙම බොරු දැනුම්දීමක් කරන්නේ නැහැ. එහෙම කරන්නේ ප්‍රේත, පිසාච, කුම්භාණ්ඩ වගේ පහත් පෙළේ අමනුස්සයෝ විතරයි."

"එතකොට කොහොමද මෑණියෝ අපි මේ නිධානේ ගන්නේ?" එවිට ඒ වියපත් කාන්තාව අසා සිටියාය.

"ඔයාලා මම කියන විදියට බහිරව දේවතාවුන්නාන්සේට පූජාව තියලා ඊටපස්සේ ඒ ළිඳේ වතුර ටික ඉහින්න. එතකොට මම මෙහේ ඉඳගෙන ඒ නිධානේ හරියටම තියෙන තැන පාතාල අංජනමෙන් බල බල ෆෝන් එකෙන් කියන්නම්. හැබැයි මේ කතාව වෙන කුරා කූඹියෙකුටවත් කියන්න එපා." එම මෑණියෝ කීහ.

"ඒ වගේම ඔතන තව මෙහෙම දේකුත් තියෙනවා. ඔය නිධානය ගොඩගන්න එක ගෑනු අය මුල්වෙලාම කරන්න ඕනේ වැඩක්. පිරිමි කෙනෙක්ගෙන් පුංචි උදව්වක් ගත්තාට කමක් නෑ. ඒත් මුල්වෙන්න ඕනේ ගෑනු අයම තමයි." මෑණියන්ගේ එම කතාව ඇසූ ඒ වියපත් කාන්තාව ඇතුළු පවුලේ ඥාතීන් සිතුවේ තමන් නොදන්නා මොනතරම් දේවල් මේ ගුප්ත ශාස්ත්‍රය තුළ තිබේද යන්නය.

**ඔයාලා මම කියන විදියට බහිරව දේවතාවුන්නාන්සේට පූජාව තියලා ඊටපස්සේ ඒ ළිඳේ වතුර ටික ඉහින්න. එතකොට මම මෙහේ ඉඳගෙන ඒ නිධානේ හරියටම තියෙන තැන පාතාල අංජනමෙන් බල බල ෆෝන් එකෙන් කියන්නම්**

කෙසේ හෝ මෑණියන් දුන් ඒ උපදෙස් අනුව එම නිධානය ගොඩගැනීමට අවශ්‍ය මල්, පහන්, සුවඳදුම් ඇතුළු වෙනත් පූජා භාණ්ඩ සේම ළිඳ ඉසීම සඳහා ජල මෝටරයක්, වතුර බට, බේසම්, බාල්දි ආදිය එක්කරගත් එම වැඩිහිටි කාන්තාව ඇගේ දියණිවරුන් සහ මිණිපිරියන්ද සමඟ එම මෑණියන් දුරකතනයෙන් සම්බන්ධ කරගනිමින් නිධානය ගොඩගැනීමේ කටයුතුවලට මුල පිරුවාය. එහෙත් එම ළිඳට බැසීම කාන්තාවන්ට කළ නොහැකි නිසා ඒ සඳහා පමණක් එම පවුලේ පිරිමියෙකුගේ සහාය ගැනුණි.

ඒ අතරේ එම මෑණියන් විසින් තමන් සතු පාතාල අංජනමින් ඒ නිධානය ඇති ඉසව්ව පරීක්ෂා කරන අතරේ ඒ තොරතුරු ඒ මොහොතේම එම පවුලේ සාමාජිකයන් වෙත දන්වන ලදි. එහෙත් එම කාරිය එසේ සිදුවන අතරේ හිටිහැටියේ එහි කඩාවැදුනු පොලිස් නිලධාරීන් කණ්ඩායමක් එම කාරියේ යෙදුණු අවුරුදු හැත්තෑහයේ වැඩිමල් කාන්තාවගේ සිට අවුරුදු විස්සක් වූ බාලම යුවතිය දක්වා කාන්තාවන් සිව්දෙනෙක් සහ ඊට එක්වූ පිරිමියා අනවසර කැණීම් යන චෝදනාව යටතේ අත්අඩංගුවට ගැනුණි. පසුව ඔවුන්ගෙන් අනාවරණය වූ කරුණු මත දැනගන්නට ලැබුණේ ඊට මගපෙන්වූ මෑණියන්ද ඇගේ බලගතු පාතාල අංජනම සමඟම අත්අඩංගුවට ගන්නා ලද බවයි.



# කොටියාකුඹුර උබේසේකර

## කේෂ කල්‍යාණී තෛලය

### සුමුදු සුසිනිදු මොණර පිළක්වන් කෙස් කළඹක රහස

**අකලට හිසකෙස් ගැලවීම, සුදු වීම, තට්ටය පෑදීම, හිසකෙස් දිරා යාම, තඹ වර්ණ වීම, පීනස් රෝග සමනය කරයි**

අවුරුදු 800කට වඩා ඉපැරණි පුරාණ පුස්කොළ පොතකින් උපුටාගන්නා ලද අත්දුටු රහස් වට්ටෝරුවක් අනුව අවුරුදු ගණනාවක් පර්යේෂණ පවත්වා සමන් මල්, සඳුන් මල් ආදී දුර්ලභ වන මල්වර්ග රාශියක් සංයෝග කර මෙම තෙල් නිෂ්පාදනය කර ඇත. අකලට හිසකෙස් ගැලවී යාම වහා නවත්වා මොණර පිළක්වන් සිය කෙස්වලින් හිස පුරවාලීමේ පුදුම බලයක් ඇති මෙම තෛලය, අතීතයේ භාරතයේ විසූ රාජකුමාරියන් පවා භාවිත කළ ශ්‍රේෂ්ඨ බල ඇති තෛලයකි. අකලට හිසකෙස් නොවැටීම, නොපැසී විශේෂ අරුම පුදුම බලයක් ඇති, කෙස් සුදුවීම, තට්ටය පෑදීම, උඳුගොව්වන් කෑම නතර කිරීම, හිසකෙස් දිරා යෑම, අඩ වර්ණ වීම, පීනස් රෝග සුව වීම, හිස්සොරි වළදවීම, හිස කැක්කුම, කල්පනාව අඩුකම, නිතර කිවිසුම් යාම, ඇස් දැවිල්ල, ඇස්පෙනීම අඩුකම, කබ කඳුළු ගැලීම ආදී සියලු රෝග වළක්වයි. හිස කෙස් දික්ව මොණර පිළක් බඳු අලංකාර කේෂ කලාපයක් ලබාගැනීමට මෙම තෙල් දිනපතා හිස ගල්වන්න.




**සියළුම හිසකෙස් රෝග සඳහා වෛද්‍යවරයා හමුවී ප්‍රතිකාර ලබා ගැනීමට අමතන්න**

මිල රු.490/=

සියලුම ආයුර්වේද වෙළඳසැල්වලින් දැන් ලබාගත හැක



සාම විනිසුරු පාරම්පරික හිස කෙස් රෝග විශේෂ දේශීය වෛද්‍ය විශාරද

**වෛද්‍ය ශිරෝමනි ආර්.පී. උබේසේකර**

කොටියාකුඹුර

දු.අ. 035 228 90 64 / 0725 493 435



# මිනුවන්ගොඩ
## වේයන්ගොඩ







ප්‍රධාන මාර්ගයට 200m නුදුරින්
(දෙවලපල පන්සල් හන්දිය) පිහිටි පර් 17ක
නව දෙමහල් නිවස
(පහත මාලය සාදා නිම කළ) සමඟ
අඩි 40x15 ඇනෙක්සියක්ද පුද්ගලිකව
කඩිනමින් විකිණේ.

**077 18 18 451**
**071 70 51 133**



රටම කතාකරන
කතාකරලම උගන්වන

# ඉංග්‍රීසි කතා පුහුණුව
## සිංහිඳ

**කුරුණෑගල සරසවි**
(මැයි 20 සෙනසුරාදා උදේ 10.30 - 1.30)
ගම්පහට නුදුරු කළඳඹළුවාව සණස බෙම්මුල්ල
(මැයි 21 ඉරිදා සවස 2.30 - 5.30)

**රැකියා විදේශගතවීම් උසස්වීම් සඳහා අංග සම්පූර්ණ ඉංග්‍රීසි දැනුම**

වටිනාකම දන්නා වැඩිහිටි ඔබ සඳහාමයි

## ප්‍රියංකර ගමගේ
මෙහෙයවන

(ගම්පහ කළමනාකරණ හා උසස් වෘත්තීය පුහුණු අභ්‍යාස ආයතනයේ හිටපු ජ්‍යෙෂ්ඨ ඉංග්‍රීසි භාෂා උපදේශක)



**0771 101 563**

**මේ කතාව, 90 දශකයේ බ්‍රිතාන්‍යයේ වැඩියෙන්ම අලෙවි වුණු අභිරහස් නවකතා සහ කෙටිකතා රචිකාවිය, ඇන් පෙරී ගැනයි. 1979 අවුරුද්දේ ඇය ලියූ ‘ Cater Hangman’ කියන මුල්ම නවකතාවේ පිටපත් මිලියන 26කට වඩා අලෙවිවුණා. නමුත් ඒ ජනප්‍රියත්වය රැඳී තිබුණේ දශක දෙකකට ආසන්න කාලයක් විතරයි. 1994 ‘ Heavenly Cretures’ කියන චිත්‍රපටය තිරගත වීමෙන් පසුව ඇගේ ජීවිත කතාව සම්පූර්ණයෙන්ම උඩු යටිකුරු වුණා. මොකද ඒ චිත්‍රපටයේ කතාවට පදනම් වූ මිනීමැරුමේ සැබෑම ඝාතකයා වුණේ ඇන් පෙරී. ඇත්තටම ඇගේ ජීවිත කතාවත් ඇය ලියන ප්‍රබන්ධ කතාවල චරිතයක් වගෙයි කියලා ගොඩක් දෙනෙකුට තේරුම්ගියේ මේ සිදුවීමෙන් පස්සෙයි.**

# ණයගැති බවෙන් මිදෙන්න අම්මාව මරන්න උදව් කළා



ඇන් පෙරී

ඇන් පෙරීගේ මුල් නම වුණේ Juliet Hulme. ජුලියට්ගේ තාත්තා ඒ වෙනකොට නවසීලන්තයේ ක්‍රිස්ට්චර්ච් නගරයේ පිහිටි කැන්ටබරි විශ්වවිද්‍යාලයේ ප්‍රධානියෙකු විදියට සේවය කරමින් හිටියා. ඒ නිසා ජුලියට්වත් ඒ නගරයේම පිහිටි උසස් බාලිකා විද්‍යාලයකට ඇතුළත් කරන්න ඔහු කටයුතු කළා. පෝලින් පාකර් කියන මිතුරිය, ජුලියට්ට මුණගැහුණේ ඒ පාසලේදී. එතකොට ජුලියට්ගෙ වයස අවුරුදු 15යි. පාකර්ට 16යි.

මේ දෙන්නගේ යාළුකම වැඩිකල් යන්න මත්තෙන් බොහොම කිට්ටු යාළුකමක් බවට පත්වුණා. ඇත්තම කිව්වොත් ඔවුන් ජීවත්වුණේ ඔවුන් විසින්ම ගොඩනගාගත්තු මනඃකල්පිත ලෝකයක. නාට්‍ය, පොත්පත් සහ ඔවුන්ගේ රහසිගත ලෝකය පිළිබඳව විවිධ කතන්දර ලියමින් තමයි මේ මිතුරියන් දෙදෙනා වැඩි කාලයක් ගතකළේ. මේ දෙන්නගේ ලෝකය කොච්චර අමුතු එකක්ද කියනවානම් ඔවුන්ට අදහන්න ඔවුන්ගේම පුද්ගලික ආගමක් පවා තිබුණා. ඒ වගේම ‘යුතෝපියාව’ කියලා අපි හඳුන්වන්නේ අපි විසින් මවාගත්තු ලෝකයකටනේ. එහෙම නැත්නම් හතරවන ලෝකය කියලා අපි හඳුන්වන්නේත් එයමයි. සියලු දේ සර්ව සම්පූර්ණ වුණු ලෝකයක් හැටියටයි මේ මනඃකල්පිත යුතෝපියාව සැලකෙන්නේ. ඉතින් මේ යෙහෙළියන් දෙදෙනා, ඔවුන්ට රිසි සේ ජීවත්වෙන්න යුතෝපියාවේ ආදර්ශ ආකෘතියක් පවා නිර්මාණය කරලා තිබුණා. හිතාගන්න පුළුවන් නේද දෙන්නගේ අමුතු ලෝකයේ තරම?



ඔහොම ඉන්නකොට 1954 අවුරුද්දේ ජුලියට්ගෙ දෙමාපියන් විවාහයෙන් වෙන්වෙන්න තීරණය කළා. ඒ නිසා ජුලියට්ව ඔවුන්ගේ ඥාතීන් සමඟ ජීවත්වීම සඳහා දකුණු අප්‍රිකාවට පිටත් කර යැවීමේ සැලසුමක් ඔවුන් සතුව තිබුණා. හැබැයි පාකර් එක්ක එකතු වෙලා හදාගත්තු අපූරු ලෝකයෙන් මිදිලා දකුණු අප්‍රිකාවට යන්න ජුලියට්ට කොහෙත්ම අවශ්‍ය වුණේ නෑ. ඒ නිසා පාකර්වත් එක්කගෙන එහෙ යන්න ඈ සැලසුම් කළා. ඒත් පාකර්ගේ මව, හොනොරා රීපර් (Honorah Rieper) ඒ සඳහා ඇයට අවසර දෙයිද කියන සැකය මේ දෙදෙනාටම තිබුණා. බැරිවෙලා හරි ඇය අකමැති වුණොත්? ඒ නිසා අවදානමක් නොගෙන ඇය මරා දමන්න මේ දෙදෙනා තීරණය කළා.

1954 ජුනි මාසෙ 22 වැනිදා තමයි සැලසුම ක්‍රියාත්මක වුණේ. බොහොම හොඳින් හිරුඑළිය වැටී තිබුණු එදා, රීපර් මේ ගැහැනු ළමුන් දෙදෙනා එක්ක ක්‍රිස්ට්චර්ච් නගරයේ පිහිටි සුන්දර වික්ටෝරියා උද්‍යානයේ ඇවිදින්න ගියේ මේ සැලසුම ගැන කිසිවක් නොදැන. එහෙම ඇවිද ඇවිද ඉඳිද්දී, ජුලියට් එකපාරටම විසිතුරු ලෙස සරසපු ගලක් බිමට අතහැරියේ හරියට අත්වැරදීමක් වුණා වගේ. නමුත් ඔවුන්ගේ සැලැස්ම වුණේ එය අහුලාගැනීමට රීපර් පහතට නැමුණු වහාම ඇයගේ හිසට පහර දෙන්න. ඔව්... හිතුවා වගේම රීපර් ඒ බිම වැටුණු වස්තුව අහුලාදෙන්න බිමට පහත් වුණා. ඒත් එක්කම ක්‍රියාත්මක වුණු ගැහැනු ළමුන් දෙදෙනා ඔවුන්ගේ බෑග්වල දමාගෙන සිටි ආවරණය කරන ලද ගඩොල් කැටවලින් ඇගේ හිසට මාරුවෙන් මාරුවට විසි වතාවකට වඩා පහර දුන්නා. රීපර් එතැනම අවසන් ගමන් ගියා.



ජුලියට් සහ පාකර් දෙදෙනා 1954දී මිනීමැරුමට වරදකරුවන් වූ පසු අධිකරණයෙන් පිටත් වන අවස්ථාව

**අම්මව මරන්න උදව් නොකළොත්, ඇය සියදිවි නසාගන්නා බව මට කිව්වා. ඇත්තටම ඇය එසේ කරාවි කියන බයක් මගේ හිතේ තිබුණා. ඒක දරාගන්න බැරි නිසයි මම ඇයට උදව් කළේ**

කොහොමහරි වැඩිකල් යන්න මත්තෙන්ම මේ දෙදෙනා පොලිසියට කොටුවුණා. පොලිස් අත්අඩංගුවට පත්වුණාට පසු නඩු විභාගයකට පෙනී සිටින්න මේ දෙදෙනාට සිද්ධ වුණා. මේ මිතුරියන් දෙදෙනාට කිසියම් උන්මත්තකභාවයක් තිබූ බව සහ දෙදෙනා අතර ආදර සම්බන්ධතාවයක් තිබූ බවට නඩු විභාගයේදී අනුමාන කර තිබුණා. නමුත් ජුලියට් සහ පාකර් යන දෙදෙනාම ඒ චෝදනාව ප්‍රතික්ෂේප කළා.

පසුව මේ ඝාතනය ගැන අදහස් දක්වමින් ජුලියට් පවසා තිබුණේ මේ වගේ කතාවක්. "මම අසනීප වෙලා රෝහල්ගත කර සිටියදී පාකර් මට ගොඩක් උපකාර කළා. ඒ නිසා මා ඇයට ණයගැතියි වගේ හැඟීමක් දැනුණා. ඒ ණයගැති බවෙන් මිදෙන්නයි අම්මව මරන්න මම ඇයට උදව් කළේ. ඒ වගේම අම්මව මරන්න උදව් නොකළොත්, ඇය සියදිවි නසාගන්නා බව මට කිව්වා. ඇත්තටම ඇය එසේ කරාවි කියන බයක් මගේ හිතේ තිබුණා. ඒක දරාගන්න බැරි නිසයි මම ඇයට උදව් කළේ."


කොහොම වුණත්, 1954 අගෝස්තු 28 වැනිදා රීපර්ගේ ඝාතනය සම්බන්ධයෙන්, අධිකරණය මේ දෙදෙනා වැරදිකරුවන් කළා. දෙදෙනාම බාල වයස්කරුවන් නිසා මරණ දඬුවම නොදී වසර පහක් සඳහා ඔවුන් බන්ධනාගාරගත කළා. අවුරුදු පහකට පස්සේ මේ දෙදෙනා බන්ධනාගාරයෙන් පිටව යද්දී ජුලියට්ට ලැබුණු අලුත් නම තමයි ‘ඇන් පෙරී’. ඊටත් ටික කලකට පසු, Newzeland Herald කියන වෙබ් අඩවියට සම්මුඛ සාකච්ඡාවක් ලබාදෙමින් ජුලියට් කියා තිබුණේ ඒ වෙන්ව යාමෙන් පසු නැවත කිසිම දිනයක ඔවුන් දෙදෙනා මුණ නොගැසුණු බවයි.

මේ සිදුවීම් සියල්ලෙන් පසු 1994 අවුරුද්දේ ‘Heavenly Cretures’ කියන චිත්‍රපටය තිරගත වුණාට පස්සේ තමයි ඇන් පෙරී කියන ජනප්‍රිය ලේඛිකාව මිනිස් ඝාතනයක් කරන ලද ‘ජුලියට්’ බව සියලුදෙනා දැනගත්තේ. එය ඇගේ කීර්ති නාමයට විශාල අභියෝගයක් වුණා.

2003 වසරේ ගාඩියන් සඟරාවට සම්මුඛ සාකච්ඡාවක් ලබාදෙමින් ඇය කියා තිබුණේ කවුරුහරි කෙනෙක් ඒ අතීතය පදනම් කරගනිමින් ඇයව විනිශ්චය කිරීම බලවත් අසාධාරණයක් බවයි. ඒ වගේම ‘Heavenly Cretures’ කියන චිත්‍රපටය සම්බන්ධයෙනුත් ඇයට එතරම් පැහැදීමක් තිබුණේ නැහැ. සමාජයේ වැදගත් පුද්ගලයෙකු ලෙස මහන්සියෙන් ඇය අත්පත් කරගත් සියලු දේ එම චිත්‍රපටය නිසා අභියෝගකට ලක්ව ඇති බවයි ඇය පවසා තිබුණේ. කොහොම නමුත් ඒ සිදුවීමෙන් පසුවත් ඇය තවත් පොත් දුසිම් 6කට වඩා වැඩි ප්‍රමාණයක් එළිදක්වන්න කටයුතු කර තිබුණා.

පාප මිත්‍ර සේවනයට යොමුවෙන ඕනෑම කෙනෙකුට මේ වගේ අකරතැබ්බ වෙන්න පුළුවන්. නමුත් ඇන් පෙරීගේ කතාවෙන් අපිට ඉගෙනගන්න තියෙන පාඩම, උත්සාහ කළොත් ඕනෑම කෙනෙකුට තමන්ගේ ඒ අඳුරු අතීතයෙන් ගොඩ එන්න පුළුවන් කියන එකයි. අවුරුදු 15දී මිනිස් ඝාතනයක් කරපු ඇය අවුරුදු 84දී මියගියේ ඝාතකයෙක් විදියට නම් නෙවෙයි, ලෝකයේ නම් දරාපු දක්ෂ සහ ජනප්‍රිය ලේඛිකාවක් විදියට.

■ සුරේෂ් විදානගමගේ



# වෛරී වූ ඇත්ගොව්වාට අලියා සෙනෙහස පාලා

ඇත්ගොව්වාට ළංවීමට හෙතෙම කිසිවකුට ඉඩ නොදුන්නේය. සැබෑ ලෙන්ගතුකම් එසේය. තමාට වඩා හොඳට වෙනකෙකු ඇත්ගොව්වා බලා ගනී යැයි විශ්වාස කළ නොහැකිය. එනිසාම නානාවිධ ආහාර තිළිණ ලැබුවද ඔහුගේ අවධානය වෙනතකට යොමු නොවීය.

අද මෙන් එකල මග සිටින ඕනෑම අයෙකු අත ජංගම දුරකතන නැත. ස්ථාවර දුරකතන ඇත්තේද සීමාසහිතවයි. එනිසා අලි හිමිකරුට පණිවිඩයක් යවා ගැනීමට සැලකිය යුතු කාලයක් ගතවිය. පැය එකහමාරක පමණ කාලයක් ගෙවී ගිය පසු අලි හිමියා එතැනට පැමිණියේය. ඔහුගේ අණට අවනත වූ අලියා පසෙකට විය. අනතුරුව ඇත්ගොව්වා වහාම රෝහලට රැගෙන යාමට පියවර ගැනිණ. හෙතෙම ප්‍රතිකාර ලබා සුව වූයේය. කවුරුත් අලියාට දෙස් නැගුවේ නැත. අලි මෙන්ම අලින්ගේ ප්‍රේමයද අපූරුය.

■ රජනිකා ලියනගේ

තොරතුරු
**රන්ජන් හේමචන්ද්‍ර**
(පිටිපන)

අලි ඇතුන් සහ හස්තිපාලකවරුන් අතර ඇත්තේ පුදුමාකාර බැඳීමකි. ගසට පොත්ත මෙන් ඔවුන්ට එකිනෙකා නැතිවම බැරිය. එයට අතීතයද වර්තමානයද කියා වෙනසක් නැත.

අනූව දශකයේ මුල සද්දන්ත හීලෑ අලියෙක් හෝමාගම පිටිපන ප්‍රදේශයේ මාර්ගයක ගමන් කරමින් සිටියේය. ඔහු නැදුන්ගමුව රාජාට වඩා තරමක් උසින් අඩුය. පසු පා යුගල දම්වැල් ද ඇත. ඒ, අඩිය තැබිය හැකි පරිදිය. වැඩිහිටියන් දරුවන්ද සමඟ මාර්ගය දෙපසට රැස්වූයේ අලි ගමන නැරඹීමටයි. කාටවත් කිසිඳු කරදරයක් නැතිව අලියා පැද්දි පැද්දී ඉදිරියට ඇදුණේය. ඇත්ගොව්වා අලියාගේ පිට මතය. හේ හීන්දෑරිය. හිසේ ජටාවකි. වයස අවුරුදු හැටක පමණ පෙනුමක් ඇත. අලියා පා ඔසවන තාලයට ඔහු සැහැල්ලුවට දෙපසට වැනුණේ පුවත් නොදැන බමන මතිනි. ඒ, මධු පානයෙන් සප්පායම් වී ඇති නිසා බවට සැක නැත. අතේ ඇති හෙණ්ඩුවද ඕනෑවට එපාවට පැද්දුණු ආකාරයකි. එතැන වූයේ ඇත්ගොව්වා අලියා රැගෙන යාමක් නොවේ. අලියා පරෙස්සමට ඇත්ගොව්වා රැගෙන යාමකි.

ටිකෙන් ටික ඉදිරියට ඇදුණු අලියා පිටිපන පන්සල හන්දියට මීටර පනහක් පමණ දුරින් මොරගහහේන පෙදෙස පසුකරමින් සිටියේය. එක්වරම වූයේ නොසිතූ අකරතැබ්බයකි. ඇත්ගොව්වා ක්ෂණයකින් අලියා පිටින් ඇද වැටුණේය. හිස තාර පාරේ ගැටී රුධිරය ගලා ගියේය. සිහි කල්පනාවේ ස්වභාවය අනුව ඔහුට රිදුණාද නැද්ද කිව නොහැකිය. එහෙත් අලියාට ඉන් රිදෙන්නට ඇත. ඔහු සිය සමීපතමයා ආරක්ෂා කිරීමේ කඩිනම් පියවර ගත්තේය. වෙනත් කිසිවකු කෙරෙහි විශ්වාසය තැබිය නොහැකිය. හෙතෙම කකුල් සිව් පසට තබා ඇත්ගොව්වා බඩ යටින් සිටින සේ සිටගත්තේය. කිසිවකු හෝ එතැනට ළඟා වී තුවාලකරු ගැන බලනවා බොරුය. එය සම්පූර්ණයෙන් අධි ආරක්ෂිත කලාපයකි. ඉදිරියේ වූයේ කඩමණ්ඩියයි. ඒවායින් අලියාට කෙසෙල් ආදී තුටු පඬුරුද ලැබිණ. එහෙත් අල්ලස් ලබා මිතුරා පාවාදීමට ඔහු සූදානම් නැත. කෙසෙල් අනුභව කළාට




ඔබට මුදල් හදිස්සියක්ද?
නැත්නම් ඔබේ වටිනා
රන් භාණ්ඩ
සින්න වෙන්න
යනවාද?

F.A.Ads

ඕනෑම බැංකුවක උකස් තබා ඇති රන් භාණ්ඩ ගණුදෙනුවක් සඳහා
පවුමට රු. 43,000/- ක් ම වැඩිපුර
1% ක අඩුම පොලියට ලබා ගන්න
ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න
විශේෂ සහන රැසක් සමගින්
නැවත බේරා ගැනීමේදී පහසු ගෙවීමේ ක්‍රමයට Loan එකකුත්

*කොන්දේසි අදාලවේ

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | මීගමුව | 0766 227 056 |
| හෝමාගම | 0778 330 346 | ගම්පහ | 0779 230 549 |
| පස්සර | 0772 700 002 | කළුතර | 0776 167 149 |
| කොටහේන | 0702 539 382 | හලාවත | 0779 256 191 |
| වැල්ලවත්ත | 0710 870 686 | මාතර | 0705 979 237 |
| ග්‍රෑන්ඩ්පාස් | 0742 379 739 | ගම්පොල | 0710 870 735 |
| මොරටුව | 0766 227 059 | නාවලපිටිය | 0710 870 706 |
| පානදුර | 0767 952 286 | හැටන් | 0778 790 372 |
| වෙන්නප්පුව | 0710 869 378 | කෑගල්ල | 0703 583 363 |
| ගාල්ල | 0705 979 274 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| කුරුණෑගල | 0766 227 061 | පුත්තලම | 0771 201 861 |
| දිගන | 0778 156 738 | මහියංගනය | 0771 201 862 |
| බේරුවල | 0740 920 356 | වත්තේගම | 0742 551 103 |
| මතුගම | 0771 201 860 | හපුතලේ | 0760 677 018 |
| මොණරාගල | 0771 201 852 | මාතලේ | 0702 539 389 |
| බදුල්ල | 0771 201 863 | තලවකැලේ | 0710 871 009 |
| කල්පිටිය | 0761 605 803 | රාගල | 0710 870 703 |
| කටුගස්තොට | 0779 476 206 | පූඩළුඔය | 0740 929 541 |
| නාඋල | 0763 226 230 | මස්කෙලිය | 0760 909 822 |
| කන්තලේ | 0742 572 585 | පුස්සැල්ලාව | 0742 531 360 |
| පොතුවිල් | 0771 201 855 | මට්ටක්කුලිය | 0742 127 665 |
| වැලිමඩ | 0778 764 751 | ඇලකන්ද | 0771 201 857 |
| බගවන්තලාව | 0742 588 267 | හාවඑළිය | 0773 394 209 |
| ආගරපතන | 0742 499 563 | | |

# රුධිරය වියළීම ගැන බලා ඉඳලා කියන්න පුළුවන් නම් මටත් මහාචාර්යවරයෙක් වෙන්න තිබුණා





**ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න යනු විද්‍යාත්මකව සහ කලාත්මකව පැමිණිල්ල මෙහෙයවීමට නම් දරා ඇති විශිෂ්ටයෙකි. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී ආන්දෝලනාත්මක නඩු රැසක පැමිණිල්ල මෙහෙයවීමට ඔහු දායක වී ඇත. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු විසින් රචිත 'යළි මැවෙන අපරාධයක්' කෘතියේ සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් පසුගිය වසරේදී සමුගත්තේ ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියදීය. හෙතෙම නීතිය නව්‍යකරණයට මෙන්ම නීතිය පිළිබඳ සරල අන්දමින් දැනුවත් කිරීමට සක්‍රියව දායක වන්නෙකි. නීති ඉතිහාසයේ සුවිශේෂ වැදගත්කමක් උසුලන නඩුවලදී ඔහුගේ ක්‍රියාකාරීත්වය බෙහෙවින් වැදගත්ය. ඒවා මෙරට නීති වෘත්තිකයින්, සිසුන්, විමර්ශකයින්, විශේෂඥයින් පමණක් නොව සාමාන්‍ය ජනයාට පවා වැදගත් වේ. විශේෂයෙන් ඔහුගේ හරස් ප්‍රශ්න ඇසීමේ කලාව අපූරුය. අද මේ ලිපිය සකස් කෙරෙන්නේ සුප්‍රසිද්ධ ටෝනි මාටින් නඩුව මුල් කරගෙනය. එහිදී විශේෂඥ මත අනුකූල කරගත් ආකාරයද සාකච්ඡා කෙරේ. අද ඉදිරිපත් කෙරෙන්නේ මෙවැනි ලිපි මාලාවක දහහතරවැන්නයි.**

## මා දේශනා කළ නිසාම යැයි කිසිම පුද්ගලයෙකු මාගේ ධර්මය නො පිළිගන්න."

බුදුන්වහන්සේ කාලාම සූත්‍රයේදී එසේ දේශනා කළහ. උන්වහන්සේ පවසන පරිදි අප පිළිගත යුත්තේ තමන්ගේ බුද්ධියට හා ප්‍රඥාගෝචරභාවයට සරිලන තාර්කික වශයෙන් පිළිගැනීමට හැකි කරුණු පමණි. ඒ අනුව යමක් ගැන, කවරෙකු වුව පවසන දෑ එකෙනෙහිම පිළිගත යුතු නොවේ. යම් මතයක් පවසන්නා අදාළ විෂය සම්බන්ධ ප්‍රවීණයෙකු විය හැකිය. එහෙත් තමා ඉදිරිපත් කරන මතය සනාථ කිරීමට එම තැනැත්තා සමත් විය යුතුය. එයට පිළිගැනීමක් ලැබෙන්නේ එවිටය. අධිකරණයේදීද විවිධ මත ඉදිරිපත් වේ. ඇතැම් ඒවා පිළිගැනේ. ඇතැම් අදහස් එසේ නොවේ.

## විශේෂඥ සාක්ෂිවල වැදගත්කම

මෙම ලිපි මාලාවේදීම නීති ඉතිහාසයේ සුවිශේෂ සංධිස්ථාන සලකුණු කළ ප්‍රධාන නඩු තීන්දු තුනක් ගැන කතා කර තිබේ. පෝලින් ද කෲස්, කුලරත්න සහ සතාසිවම් නඩු ඒවායි. ඒ නඩු තුනේදීම විශේෂඥ සාක්ෂි ප්‍රධාන භූමිකාවක් ඉටුකළේය. විශේෂඥ සාක්ෂි ලබාදෙනුයේ සිදුවීමේ පාර්ශවකරුවකු නොවේ. ඔහු සිදුවීම නොදැක මත පළ කරන්නෙකි. සාමාන්‍යයෙන් අධිකරණයේදී සාක්ෂි ලබාදිය හැක්කේ ඇසීමෙන්, දැකීමෙන් ආදී ලෙස යම් සිදුවීමක් සිය පංචේන්ද්‍රියන්ට ගෝචර වූ තැනැත්තෙකුට පමණි. විශේෂඥයා යනු ඊට ව්‍යතිරේඛයකි. එම තැනැත්තා සිද්ධිය අහන්නේ, දකින්නේ නැත. එහෙත් යම් ක්ෂේත්‍රයක් හෝ විද්‍යාවක් පිළිබඳ සිය නිපුණත්වය භාවිත කරමින් විද්‍යාත්මක මතයක් පළ කිරීමට ඔවුන්ට නීතියෙන් අවසර හිමි වේ. සාක්ෂි ආඥා පනතේ 45 වන වගන්තියේ අදාළ විෂයන් දක්වා ඇත. කෙසේ වෙතත් එම මත කියූ සැනින් පිළිගැනීමට අධිකරණය බැඳී නැත. යම් කරුණක් ගැන මත පළ කරන්නා උසාවියේදී ගුරුවරයකු වැනිය. විනිසුරුවරයා ඔහුගේ ගෝලයකු බවට පත්වේ. ගුරුතුමා කියන සියල්ල පිළිගැනීමට ශිෂ්‍යයා බැඳී නැත. එහෙත් විශේෂඥයා දක්වන හේතු පිළිබඳ සෑහීමකට පත්වන අවස්ථාවකදී අදාළ කරුණු ගැන වටහාගනිමින් මතය පිළිගැනීමට විනිසුරුවරයා හැකිය.

විශේෂඥ සාක්ෂි, නඩුවක ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. එම තැනැත්තා පැමිණිල්ලෙන් හෝ විත්තියෙන් කැඳවුවද ස්වාධීන මතය ඉදිරිපත් කළ හැකිය. ඔවුන්ගේ සාක්ෂිද වෙනත් අයගේ ලෙසින්ම හරස් ප්‍රශ්නවලට බඳුන් කළ හැකි වේ. පැමිණිල්ල විසින් විශේෂඥ සාක්ෂි ඉදිරිපත් කරනුයේ සිය සාක්ෂි වඩා තහවුරු කිරීමටයි. එසේත් නැතිනම් අපරාධයේ අත්‍යවශ්‍ය අංගයක් ඔප්පු කිරීමට විශේෂඥ මතය අවැසි වේ. උදාහරණයක් ලෙස මිනීමැරුම් නඩුවකදී මරණකරු මියගියේ ස්වභාවික හේතුවක් නොවන සාහසික ක්‍රියාවකින් නම් එය තහවුරු කළ යුත්තේ විශේෂඥයකු මිස වෙනත් අයෙකු නොවේ. විත්තිය විශේෂඥයින් කැඳවන්නේ පැමිණිල්ලේ මතය බිඳීමටයි. නොඑසේනම් ඒ ගැන සාධාරණ සැකයක් මතු කිරීමටයි.

## දරුවා ළිඳට වැටුණු වේලාව

පෝලින් ද කෲස් නඩුවේදී දරුවා ළිඳට දැම්මේ හෝ වැටුණේ කීයටද යන්න තීරණාත්මක සාධකයක් විය. දහවල් දෙකට පමණ පෝලින් ද කෲස් සහ මරණයට පත් දරුවා පල්ලියක ළිඳක් අසල සිටි බවට සාක්ෂි තිබිණ. එහෙත් පල්ලියේ සේවකයකු සවස හයට පමණ වතුර ගැනීමට පැමිණි අවස්ථාවේ මරණයට අදාළ කිසිඳු ලකුණක් දැක තිබුණේ නැත. දරුවා මියගිය වේලාව ගැන විශේෂඥයින් අතරද මත ගැටුමක් විය. ඇතැම්හු එදින මධ්‍යම රාත්‍රියත් උදෑසන හයත් අතර සිදු වූ බවට මත පළ කළහ. එවැනි අඩමාන තත්ත්වයක් මතු වුවද විත්තිකාරිය වරදකාරිය වූවාය.

## පද්මිණීගේ සිරුරේ ඇති විෂ

පද්මිණී කුලරත්න නඩුවේදී වැදගත් වූයේ මරණකාරියට ශරීරගත වූ විෂ වර්ගයයි. එහිදී පැමිණිල්ල වෙනුවෙන් විෂ පිළිබඳ විශේෂඥයෙක් සාක්ෂි දුන්නේය. එහෙත් ඔහු දැන සිටියේ එළිමහනේ පවතින විෂ පිළිබඳ මිස මිනිස් සිරුරේ අභ්‍යන්තරයේ පවතින විෂ පිළිබඳ නොවේ. ඒ ගැන මූලික නඩු විභාගයේදී ප්‍රශ්න කෙරුණු නිසාම මෘත ශරීර හතක් යොදගනිමින් හෙතෙම පරීක්ෂණයක් කළේය. එහෙත් එය පිළිගත හැකි ප්‍රමිතියේ පරීක්ෂණයක් නොවන බව විත්තියේ නීතීඥ ජී.ජී. පොන්නම්බලම් පෙන්වා දුන්නේය. අධිකරණ විෂ විද්‍යාව විෂයය පිළිබඳ ඔහු සඳහන් කළේ ලෝක ප්‍රකට නඩු තීන්දුද උදාහරණයට ගනිමිනි. ඒ සියලු කරුණු පැමිණිල්ලට අවාසිදායක විය.

## ආනන්දම් මියගියේ දහයට පෙරද? පසුද?

සතාසිවම් ඝාතන නඩුවේදී මතභේදයට ලක්වූයේ මරණකාරිය මියගිය වේලාවයි. පැමිණිල්ල උත්සාහ කළේ ඇය උදෑසන 9.30ට පෙර මියගිය බව පෙන්වීමටයි. විත්තියේ ස්ථාවරය වූයේ ඇය උදෑසන 10-12 අතර මියගිය බවයි. එහිදී අධිකරණ වෛද්‍යවරයාගේ භූමිකාව බෙහෙවින් වැදගත් වේ. ආහාර ජීර්ණය වී ඇති ප්‍රමාණය, සිරුර දරදඬු වීම (rigor mortis), සිරුරේ උෂ්ණත්වය පහළ ගොස් ඇති ප්‍රමාණය, සිරුර කුණුවීම ආරම්භ වී ඇති වෙලාව ආදිය එහිදී වැදගත්ය. පැමිණිල්ල ප්‍රථමයෙන් කැඳවූ මහාචාර්ය සේරම්ගේ මතය විත්තියට වාසිදායක විය. පසුව පැමිණිල්ල වෙනත් වෛද්‍යවරුන් දෙදෙනෙකුගේ සාක්ෂි කැඳවීමට පියවර ගත්තේය. විත්තිය මේ වෙනුවෙන් අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ලෝකයේ කීර්තිමත් මහාචාර්යවරයකු වන සිඩ්නි ස්මිත් කැඳෙව්වේය. ඔහුගේ මතයද මහාචාර්ය සේරම් සමඟ සමාන විය. එය විත්තියට වාසිදායක වූයේය.



"ඔබ දේශනවලදී කියන්නෙ ඇත්තද?"
"ඇත්ත කියන්නෙ."
"බොරු කියන්නෙ නෑ නේද?"
"බොරු කියන්නෙ නෑ."
"ඔබතුමා කියන ඇත්ත තහවුරු කිරීමට සහ මතක තබා ගැනීමට සටහනකුත් දෙනවා නේද?"
"ඔව්."

## රුධිරයෙන් තැබූ ඇඟිලි සටහන

ඉතිහාසයේ බෙහෙවින් වැදගත් වූ මෙම නඩු ත්‍රිත්වයේදීම විශේෂඥ සාක්ෂි බොහෝ තීරණාත්මක විය. මෑතකාලීන නීති ඉතිහාසය සැලකූ විට ටෝනි මාටින් නඩුව මෙරට නීති ක්ෂේත්‍රයේ ප්‍රබල සන්ධිස්ථානයකි. ඉහත සඳහන් කළ පෝලින් ද කෲස් සහ කුලරත්න නඩු පරිදිම ටෝනි මාටින් නඩුවේද ඇසූ දුටු සාක්ෂිකරුවෝ නොවූහ. එය සම්පූර්ණයෙන්ම පරිවේෂණීය සාක්ෂි මත රඳා පැවතිණ. මව යාබද ප්‍රධාන නිවසේ සිටියදී ඇනෙක්සියේ විසූ කඩවසම් තරුණ රගර් ක්‍රීඩකයෙකු වූ ටෝනි මාටින් ඝාතනයට ලක්විය. ඒ, 1986 මැයි 16 වනදාය. එවිට වේලාව පාන්දර 2.30ට ආසන්නය. "මමී, මමී" යනුවෙන් ඔහු කෑගැසුවද මවට ඇනෙක්සියට පැමිණිය නොහැකි විය. ඒ, නිවස සහ ඇනෙක්සිය අතර දොර අල්මාරියකින් හරස් කර තිබූ බැවිනි. ඈගේ දැනුම්දීමෙන් අඩ පැයකට ආසන්න වේලාවක් ඇතුළත පොලිසිය පැමිණියේය. එවිට තුවාල 88ක් සමඟ ටෝනි මාටින් සිය කාමරයේ බිම ඇද වැටී සිටියේය. ඔහු මියගොසිනි. පැය කිහිපයකට පසු අධිකරණ වෛද්‍යවරයා සහ ඇඟිලි සලකුණු විශේෂඥයා ආදීහුද එම ස්ථානයට පැමිණියහ. ඇඟිලි සලකුණු විශේෂඥයා නිරීක්ෂණය කළේ ටෝනිගේ කාමරයට ඇතුළු වන ස්ථානයේ බිත්තියේ රුධිරය සහිත ඇඟිලි සලකුණක් ඇති බවයි. රුධිරය තෙත්ගතියෙන් යුතු බවද ඔහුට පෙනිණ. ඇඟිලි සලකුණ ඡායාරූපගත කළ ඔහු සිය නිරීක්ෂණ සටහන් කර තිබිණ. දින කිහිපයකට පසු අත්අඩංගුව ගත් පළමු විත්තිකරුගේ ඇඟිලි සටහන සමග එය ගැළපුණේය.

## රුධිරයේ තෙතමනය

ඇඟිලි සලකුණෙහි වූ රුධිරය තෙතබවින් යුතුයැයි යන නිරීක්ෂණය පැමිණිල්ලට වාසිදායකය. මක්නිසාද යත් විත්තිකරුවන් මරණයට පෙරදා රාත්‍රියේද ටෝනි හමුවීමට නිවසට පැමිණ තිබූ බැවිනි. එහෙත් මරණය සිදුවූයේ පාන්දරය. එබැවින් විත්තිකරුවන් පාන්දරද එහි පැමිණි බව තහවුරු කිරීමට ඇඟිලි සලකුණේ වූ රුධිරය තෙතගතියෙන් යුතු වීම සහායකි. එකල ඩී.එන්.ඒ. තාක්ෂණයද භාවිත නොකෙරුණ බැවින් මේ නිරීක්ෂණය තහවුරු කිරීම පැමිණිල්ලේ කාර්යයකි. 1995 මාර්තු 27 ආරම්භ වූ නඩු විභාගයේදී රජයේ රස පරීක්ෂක ඒ.ආර්.එල්. විජේසේකර පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දීමට කැඳවා තිබිණ.

"මේ වගේ පරිසරයකදී රුධිරය වේලෙන්නේ නැතිව කොයිතරම් වේලාවක් තිබිය හැකිද?"

"ඒ බව ස්ථිරවම ප්‍රකාශ කරන්න බෑ. ඒත් පැය භාගයේ සිට පැය පහක් හයක් දක්වා කාලයක් අතර තියෙන්න ඉඩ තියෙනවා. ඊට තවත් සාධක බලපානවා."

රුධිරය වියළීම පිළිබඳ ඔහුගෙන් ඇසූ පැනයට පිළිතුර එපරිද්දෙනි. පැමිණිල්ලේ නඩුව නිමවීමෙන් පසු විත්තියේ නඩුව ඇරඹිණ. පළමු විත්තිකරු විත්ති කූඩුවේ සිට ප්‍රකාශ කළේ තමා මෙම මනුෂ්‍ය ඝාතනයට සම්බන්ධ නොවූ බවයි. බිත්තියේ වූයේ ඔහුගේ ඇඟිලි සටහනයි.

## රුධිරය පිළිබඳ මහාචාර්යවරයාගේ පරීක්ෂණය

විත්තිය විශේෂඥයෙකුද කැඳෙව්වේය. ඔහු අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකි. මහාචාර්යවරයා සාක්ෂියට කැඳවීමේ පරමාර්ථය වූයේ රුධිරය වියළීමකින් තොරව පැය පහක් හයක් නොපවතින බව පෙන්වීමයි. ඔහුගේ අදහස වූයේ රුධිරය පැයක් ඇතුළත වේලෙන බවයි. ඒ අනුව ඇඟිලි සලකුණු පිළිබඳ විශේෂඥයාගේ සාක්ෂිය අසත්‍යයක් බව පැවසීම විත්තියේ අපේක්ෂාව විය. මෙම මහාචාර්යවරයා සාක්ෂි දීමට පැමිණියේ සිදුවීමෙන් වසර 9කට පසුවයි. ඔහු විමර්ශන ආදී කිසිවකට සම්බන්ධ නොවුවද අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂඥයෙකි. නඩු විභාගය අතරතුර දීම 1995 මැයි 18 වනදා ඔහු පරීක්ෂණයක් කළේය. ඒ වෛද්‍ය පීඨයේ ඇති රසායනාගාරයකයි. හෙතෙම සිරින්ජරයක් ගෙන තමාගේම සිරුරින් රුධිරය ගත්තේය. එය මිලි ලීටර 5ක් වැනි ප්‍රමාණයකි. ඒවා සිය අත්ල මත තවරා බිත්තියේ ස්ථාන තුනක සලකුණු තැබීය. පසුව ඒවා වියළීමට යන කාලය නිරීක්ෂණය කළේය. පැයක් ඇතුළත ඒවා වේලුණු බව ඔහු පැවසීය.

## *පැමිණිල්ලේ හරස් ප්‍රශ්න

විත්තිය විසින් සාක්ෂි මෙහෙයවීමේදී එලෙස වන බව සම්පූර්ණයෙන් සනාථ කිරීම අවැසි නොවේ. එය වෙන්නත් නොවෙන්නත් ඉඩ ඇති බවට සැක මතුකිරීම ප්‍රමාණවත්ය. එහෙත් පැමිණිල්ලට එසේ නොවේ. විත්තිය ඉදිරිපත් කළ විශේෂඥ සාක්ෂිය සම්පූර්ණයෙන් අසත්‍ය බව තහවුරු කළ යුතුය. ඒ අනුව එවකට සිය නීතීඥ දිවියේ ආරම්භක අවදියේ සිටි ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයාගෙන් හරස් ප්‍රශ්න ඇසීම ඇරඹුවේය.

"ඔබ මේ සම්පූර්ණ පරීක්ෂණය සඳහා භාවිත කළ මෙවලම් මොනවාද?"

"සිරින්ජරයක් සහ ඔරලෝසුවක් පමණයි."

"ඔබතුමා මේක කළේ ඔබේ ලැබ් එකේ?"

"ඔව්."

"ඔබතුමා දන්නවා නේද යමක් වේලීමට විවිධ පරිසර සාධක බලපාන බව?"

"ඔව්."

"ඔබතුමා දන්නවද සාපේක්ෂ ආර්ද්‍රතාව (වායුගෝලයේ ඇති ජල වාෂ්ප ප්‍රමාණය) කියලා දෙයක් තියෙනවා?"

"ඔව්. දන්නවා."

"ඒක මනින්න උපකරණ තියෙනවා. ඔබ එවැන්නක් භාවිත කළාද?

"නෑ."

"අඩු වශයෙන් ඔබතුමා මේ ලැබ් එකේ උෂ්ණත්වය පරීක්ෂා කළාද?"

"නෑ."

"මේ ලැබ් එකේ බන්සන් දාහක කිහිපයක්, අධිශීතකරණ දෙකක්, සාමාන්‍ය ශීතකරණ දෙකක් සහ ආවරණය නොකළ ජනෙල් 8ක් තිබෙනවා නේද? කාමරයට හොඳින් ඉරඑළිය වැටෙනවා නේද?

"ඔව්."

මෘතදේහ සියයකට ආසන්න සංඛ්‍යාවක් භාවිත කරමින් මහාචාර්ය නන්දදාස කෝදාගොඩ කළ විද්‍යාත්මක පරීක්ෂණ පිළිබඳවද ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න පැහැදිලි කළේය. ඒ අතරතුර ප්‍රශ්න කිරීම අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. ඔහු මිලි ලීටර 5ක් මැනිය හැකි කුඩා හැන්දක්ද අධිකරණයට ගෙනාවේය. එය මහාචාර්යවරයාට ඉදිරිපත් කරමින් ඇසුවේ මෙවැනි පැනයකි.

"ඔබ ලබාගත්තේ රුධිරය මිලි ලීටර පහක් වැනි ප්‍රමාණයක් නේද? එය මේ හැන්දේ ප්‍රමාණය නේද?"

"ඔව්."

මහාචාර්යවරයා එම රුධිරය අත්ලේ තවරා බිත්තියේ සලකුණු තුනක් තැබූ විට සලකුණුවල ඇති රුධිර ප්‍රමාණය එකිනෙකට වෙනස්ය. ඒවායේ ඝනත්වය පරීක්ෂා කිරීමටද මහාචාර්යවරයා පියවර ගෙන නොතිබිණ. ඒ අනුව ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න සිය අදහස් දැක්වීය.

"මේ වගේ සාම්පල් තුනක් විතරක් අරගෙන පරීක්ෂණ පවත්වන්න පුළුවන්ද? කිසිදු පරිසර තත්ත්වයක් නොසලකා එසේ කළ හැකිද? එහෙමනං මටත් විද්‍යාඥයෙක් වෙන්න පුළුවන්. ඕකට මහාචාර්යවරයෙක් ඕනෙ නෑනෙ. මටත් රුධිර සාම්පලයක් අරන් අතේ තවරලා බිත්තියේ සටහන් කරලා බලාගෙන ඉඳලා රුධිරය පිළිබඳ විශේෂඥයෙක් වෙන්න පුළුවන්නෙ."

මෙවැනි අදහස් මතුවනවිට මහාචාර්යවරයා සිය ස්ථාවරය මදින් මද වෙනස් කළේය. තමා මේ පරීක්ෂණයෙන් පමණක් තීරණය නොකළ බව සහ කොහොමත් මෙම කරුණු දැන සිටි බවත් හෙතෙම පැවසීය. ඒ වනවිට මෙම මහාචාර්යවරයාද සම්බන්ධ අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් නීතීඥවරුන් වෙනුවෙන් ආරම්භ වී තිබිණ. සරත් ජයමාන්නද එහි සිසුවෙකි. ඔහු සිය ගුරුවරයාගෙන් අඛණ්ඩව ප්‍රශ්න කළේය.

## සිසුවාගෙන් ගුරුතුමා වෙත ප්‍රශ්න

"ඔබතුමා මීට පෙර කවදාවත් රුධිරය වියළීම ගැන සාක්ෂි දී තියෙනවද?"

"නෑ."

"ඔබතුමා දන්නවා නේද අධිකරණ විද්‍යාවේ ප්‍රධාන කොටස් දෙකක් තියෙන බව ව්‍යාධිවේදය (pathology) සහ වෙනත් විද්‍යාවන් (ගිනි අවි, බෝම්බ, අත් අකුරු, ඇඟිලි සටහන්, මුට්ටු ආදී ) කියලා?"

"ඔව්."

සරත් ජයමාන්න උත්සාහ කළේ සාක්ෂිකරු අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයවරයකු වුවද රුධිරය පිළිබඳ විශේෂඥයකු නොවන බව පෙන්වා දීමටයි. රුධිරය පිළිබඳ රජයේ රස පරීක්ෂකවරයාගේ මත ගැනීමට මෙම මහාචාර්යවරයා යොමු කළ ලිපි සේම මහාචාර්ය කීත් සිම්සන් වැනි ලෝක ප්‍රසිද්ධ ගත්කතුවරුන්ගේ අදහස්ද හෙතෙම ඉදිරිපත් කළේය. උපකරණ භාවිතයෙන් තොරව නග්න ඇසින් රුධිරය වියළීම මැනීම ගැන ද ඔහු විමසීය. එමෙන්ම රසායනාගාරය අඩි 50 40 විශාල එකකි. ටෝනි මාටින්ගේ කාමරය කුඩා සහ වසා දමා තැබූවකි. මේ දෙකෙහි තත්ත්ව සම්පූර්ණයෙන් එකිනෙකට වෙනස්ය. ඒ සියල්ල මතුකළ සරත් ජයමාන්න විශේෂඥ සාක්ෂිය බිඳ හෙළීමේ අවසන් අදියරට ක්‍රමයෙන් ළඟාවිය.

## පුස්සක් වූ විශේෂඥ මතය

"ඔබ මේ නිගමනයට ආවේ බලා සිටීමෙන් පමණක්ද?"

"සර් අයිසැක් නිව්ටනුත් එහෙම තමයි."

"ඒ නිමිත්ත දුටු පසු ඔහු ගුරුත්වාකර්ෂණය ගැන කොයිතරම් පරේයේෂණ කළාද කියලා ඔබතුමා දන්නවද?"

විද්‍යාත්මක පරේයේෂණ යන්න තවත් ගැඹුරින් පැහැදිලි කළ හෙතෙම ඩිප්ලෝමා පාඨමාලාවේ සටහන්ද භාවිත කළේය.

"ඔබ වෛද්‍යවරුන් නොවන අයටත් අධිකරණ වෛද්‍ය විද්‍යාව ඉගැන්වීමට පාඨමාලාවක් පටන්ගත්තා නේද?"

"ඔව්."

"ඔබ කිව්වනේ, පරීක්ෂණ කළත් නැතත් පොතපතින් දැනුම ගත් බව. ඒ දැනුම භාවිත කර හෝ ඔබ ඉහත පාඨමාලාවේ සිසුන්ට දේශන කළා නේද?"

"ඔව්."

"ඒ දේශනවලදී රුධිරයේ වියළීම ගැනත් කිව්වද?"

"ඔව්."

"ඔබ දේශනවලදී කියන්නෙ ඇත්තද?"

"ඇත්ත කියන්නෙ."

"බොරු කියන්නෙ නෑ නේද?"

"බොරු කියන්නෙ නෑ."

"ඔබතුමා කියන ඇත්ත තහවුරු කිරීමට සහ මතක තබා ගැනීමට සටහනකුත් දෙනවා නේද?"

"ඔව්."

"මේ තියෙන්නෙ ඒ නෝට් එකද?"

"ඔව්."

"ඒ නෝට් එකේ තියෙනවද රුධිරය වියළීම පිළිබඳ නිශ්චිත මතයක් පළ කිරීමට ලෝකයේ සිටින කිසිඳු විශේෂඥයෙකුට බෑ කියලා?"

"තියෙනවා."

විශේෂත්වය වන්නේ මහාචාර්යවරයා එම සටහන සිය සිසුන්ට දී තිබුණේ නඩු විභාගයට අදාළව පරීක්ෂණයක් කළ දිනයටද පසුව ජුනි මාසයේදී වීමයි. හරස් ප්‍රශ්නවලට ඔහු මුහුණ දුන්නේ අගෝස්තු මාසයේදීය. ඒ සමඟින් විශේෂඥ මතය බිමට කඩාවැටිණ. ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න අධිකරණයට පෙන්වා දුන්නේ මහාචාර්යවරයා මත පළ කිරීමට පැමිණියේ තමාට කිසිඳු විශේෂඥ දැනුමක් නොමැති ක්ෂේත්‍රයක් සම්බන්ධව බවයි.

විශේෂයෙන් අපරාධ නඩු හෙළිදරව් කිරීමේදී, තීන්දු ගැනීමේදී විශේෂඥ මත බෙහෙවින් වැදගත්ය. ඒ සඳහා ඔවුන් සිය විෂය ක්ෂේත්‍රයේ නිපුණයින් විය යුතුය. විනිසුරන් සහ නීතීඥයින්ද ඒවා සූක්ෂමව සහ ගවේෂණාත්මක ලෙස භාවිත කිරීම අවැසිය. එසේ නොවුණහොත් කිසියම් පාර්ශවයකටම යුක්තිය ඉටු වනවාට වඩා අගතියක් වීමට ඉඩ තිබේ.

■ රජනිකා ලියනගේ





ජනාධිපති නීතීඥ
සරත් ජයමාන්න විසින් රචිත
**යළි මැවෙන අපරාධයක්** පොත
ඔබේ නිවසටම ගෙන්වා ගැනීමට
www.slbooks.lk වෙබ් අඩවියට
පිවිසෙන්න.
නැතහොත් 0777342809 අංකයට
Inbox/WhatsApp/SMS කරන්න.



**ඉන්දිකා ප්‍රනාන්දු**
මනෝඋපදේශිකා සමාජ විද්‍යා ග්‍රන්ථ කතුවරි

# ලියුම අහුවුනා කියලා තාත්තා ගෙදර එන්න කලින් කොල්ලා එක්ක පැනලා ගිහින්

ඉක්මන් කොටයි... කලබල වුණොත් කොරොස් කටේවත් අත දන්න බැහැ වගේ කතා නිතරම ඇහුණට මොකෝ සමහරු වැඩියෙන්ම කලබල වෙන්නේ ජීවිතේ වැදගත්ම තීරණ ගන්න වෙලාවලට.

මේකත් ඉක්මන් කොට කරගත්තු තරුණියකගේ කතාවක්. මම ඇයට සඳුනි කියලා කියන්නම්. මට සඳුනිව මුණගැහුණේ රක්ෂිත බන්ධනාගාරෙදි. සඳුනි ටිකක් දුර පළාතක ඉඩකඩම් එහෙම තිබුණු පවුලක දරුවෙක්. අම්මා තාත්තා දෙන්නම රජයේ රස්සාවු කළේ. සඳුනිත් ඉගෙනුමට දක්ෂ දරුවෙක්ලු. සාමාන්‍ය පෙළ පංති යද්දි සඳුනි පංතිය ළඟදි මුණගැහුණු වැඩිමහල් අයියා කෙනෙක් එක්කලා සම්බන්ධයක් ඇති කරනගෙන. සම්බන්ධෙට මාස දෙක යද්දි පෙම්වතා දීපු ලියුමක් සඳුනිගේ අම්මට අහුවෙලා.

ලියුම අහුවුණහම සඳුනි ගොඩක් කලබල වෙලා. අම්මා තාත්තට කියයි කියලා හිතුවලු. සඳුනි නිසා පවුලට ලැජ්ජාවක් වෙයි, ගමේ අයට මූණදෙන්න බැරිවෙයි වගේ අටෝරාශියක් සිතිවිලි පහල වෙලා. ඉතින් සඳුනි කරලා තියෙන්නේ එදා තාත්තා ගෙදර එන්න කලියෙන් අර පිරිමි ළමයා එක්ක පැනලා ගියපු එක. ඒ යනකල් පිරිමි ළමයගේ ගෙවල් කොහෙද කියලවත් මේ දරුවා දන්නේ නැතිලු.

තරුණයා කොළඹ ජනාශ්‍රිත පැත්තක. පිරිමි ළමයාගේ අම්මා රැකියාවක් විදියට මත්ද්‍රව්‍ය විකුණනවලු. ටියුෂන් පංති ගාව පුංචි ගෑනු ළමයි හාද කරගෙන මුදල්වලට විකුණපු එකයි කොල්ලගේ රස්සාව. මට මුණගැහෙද්දි සඳුනිට දහඅටයි. පැනලා ආපු ද ඉඳලා අකමැත්තෙන් වුණත් සඳුනිත් විකිණිලා. රක්ෂිතේට ඇවිල්ලා තිබුණේ ගණිකා වෘත්තියේ යේදීම නිසා.

තීරණ ගන්න එකත් හරියට හුස්ම ගන්නවා වගේ වැදගත්. ඉක්මන් වෙලා ගන්න ක්ෂණික තීරණ හරි ගියපු අයත් ඉන්නවා. හැබැයි බහුතරයක් තීරණ වැරදිලා. හිරගෙදරදී, උපදේශනවලදි මුණගැහෙන 99%ක් දෙනා අතීතේ කලබලේ ගත්තු තීන්දු තීරණ නිසා අද පසුතැවෙනවා. ජීවිතේ ආපස්සට හැරෙන්න ලැබුණොත් ඒ තීරණ වෙනස් කරනවා කියනවා. ක්ෂණික නුඩිලස් හදන තාලෙට ජීවිතේ ගැන තීරණ ගන්න එක සාර්ථක නැහැයි කියලා පැහැදිලි කරන්න හිතුවේ ඒකයි.

කලබලේට තීරණ ගන්න එක සම්බන්ධතා පැත්තෙන් විතරක් නෙමෙයි අධ්‍යාපනය, රැකියාව ඔය හැමදේටම බලපානවා. බහුතරයක් දෙනා හදිස්සි තීරණ ගන්න ඉක්මන් වෙන පොදු කාරණා ටිකක් බලමු.

පළමුවැනි දේ අධ්‍යාපනය. මේ කාරණාවේදී මාවම උදාහරණයක් විදියට ගන්න පුළුවන්. මම විෂයන් තෝරගත්තේ කලබලෙන්. පස්සේ මනෝ උපදේශනය සම්බන්ධ හැදෑරීම් කරලා ඒ විෂයෙන් ඉදිරියට ආවත් විද්‍යා විෂයන් කළානම් මනෝ වෛද්‍යවරියක් වෙන්න තිබුණානේ කියලා වෙලාවකට හිතෙනවා. තමන් ඉස්සරහට යන අධ්‍යාපන අංශය තෝරගන්න එක මනුස්සයෙක්ගේ ජීවිතේට ලොකුවටම බලපාන දෙයක්. ඇත්තටම ලංකාව වගේ රටක දරුවන්ට තමන්ගේ දක්ෂතා, කුසලතා අඳුනගෙන ඉස්සරහට යන්න වෘත්තිමය උපදේශනයක් ලැබෙන්නේ නැහැ. ගොඩක් දරුවෝ විෂයන් තෝරගන්නේ ගෙදර අය කියන නිසා නැත්නම් යාළුවා කරන නිසා. සමහරු තෝරගන්න ඕන හින්දා කලබලේට. මේ කාරණාව ගැන දෙමාපියන් දැනුවත් වෙනවා නම් දරුවන්ගේ දක්ෂතා අඳුනගන්න උදව් දෙන්න පුළුවන්.

ඊගාවට සම්බන්ධතා. මම දන්න කාන්තාවකගේ තව කතාවක් මතක් වුණා. උසස් පෙළ පංතිවලදි මේ කාන්තාව පිරිමි ළමයෙක් එක්ක සම්බන්ධයක් පටන්ගන්න කැමැත්තෙන් හිටියා. ඒත් ඇයට ඒ වගේ යෝජනාවක් ආවෙම නැහැ. විශ්වවිද්‍යාලයට ගියපු අලුත ඇයට පෙම් යෝජනාවක් ආවා. කිසි හෙවිල්ලක් බැලිල්ලක් නැතිව ඇයත් ඒකට කැමති වුණා. මේ පුද්ගලයාට විෂ (Toxic) සහිත ගුණාංග තිබුණා. ඒත් වෙන කෙනෙක් ලැබෙන එකක් නැහැයි කියලා ඇය සම්බන්ධය නතර කළේ නැහැ. ඔහුවම විවාහ කරගත්තා. දැන් දරුවෝ දෙන්නෙකුත් හදාගෙන බොහොම දුක්ඛිත ජීවිතයක් ගත කරනවා. ආයේ කෙනෙක් හොයාගන්න බැරිවෙයි කියලා අහන පළවැනි කෙනා එක්කම යාළුවෙන, ගතිගුණ වැරදි කප්පරක් තිබුණත් ඒ මනුස්සයවම කසාද බැඳපු මේ වගේ කාන්තාවන් අනන්තයි.



රැකියාව සම්බන්ධ කාරණාවත් ඕකමයි. සමහරු උපාධි දෙක තුන තියාගෙන ලැබෙන පළවැනි ජොබ් එකම බාරගන්නවා. පස්සේ ආයේ නෑ වගේ හරියට. මම දන්න අය ඉන්නවා. ගාල බැඳගත්තු හරක් වගේ අඩු පඩියට වැඩ. හැබැයි ඒ අයට ඊට වඩා තැනකට යන්න පුළුවන් කියන එක පැහැදිලිවම පේනවා.

හිතන්නකෝ බත් විතරක් කාපු කෙනෙක් කියනවා මේ ලෝකේ රහම කෑම බත් කියලා. හැබැයි රට රටවල කෑම වර්ග කාපු කෙනෙක්ට රසම කෑම බත් නෙවෙයි. ඉතින් සම්බන්ධතා සහ රැකියා වගේ දේවල් සම්බන්ධ තීරණ ගනිද්දි හැම පැත්තක් ගැනම හිතලා බලලා තීරණ ගන්න.

ඊගාවට කසාද බැඳලා අවුරුද්දක් දෙකක් යද්දි වටේ අය බබාලා ගැන අහන්න ගන්නවා. ඔහොම ඇහුව ගමන් සමහරු ආර්ථික ස්ථාවරත්වය, අනාගත සැලසුම් සේරම අමතක කරලා වටේපිටේ අයට පේන්න දරුවො හදන්න තීරණය කරනවා. සමාජෙට පේන්න ඒ වගේ ඉක්මන් තීරණ ගත්තම පවුලේ බර දරන්න ප්‍රශ්න අහන අය එන්නේ නැහැනේ. ඉතින් ඒවත් හොඳට හිතලා බලලා ගන්න ඕන තීරණ.

නිවැරදි තීරණ ගන්න හැටි මනෝ විද්‍යාවේ පැහැදිලි කරලා දෙනවා. අපි අද රෑට කන්නේ මොනවද කියලා තීරණය කරන එක බොහොම පුංචි දෙයක් කියලා කෙනෙක්ට හිතෙන්න පුළුවන්. ඒක එහෙම නැහැ. පුංචි තීරණයක් ගන්නත් මොළයේ නියුරෝන මිලියන ගණනක් ක්‍රියාත්මක වෙනවා.

අපි යමක් කරන්න යද්දි ඒ සම්බන්ධ විකල්ප දෙකක් නැත්නම් වැඩි ගණනක් අතරින් එකක් තෝරාගන්න එකට තමයි තීරණයක් ගන්නවා කියන්නේ.

ජීවිතෙත් හරියට ප්‍රශ්න පත්‍රයක් වගෙයි. තීරණයක් ගන්න වෙනවා කියන්නෙම එතැන ප්‍රශ්නයක් තියෙනවා කියන එක. මුලින්ම කරන්න ඕනේ ප්‍රශ්නය හරියට තේරුම්ගන්න එක. සඳුනිව උදාහරණයට ගත්තොත් පෙම්වතාගේ ලියුම අම්මට අහුවුණු එකයි ඇගේ ප්‍රශ්නය වුණේ.

පස්සේ ප්‍රශ්නයට උත්තර හිතන්න. ඒවා වර්තමානයට, අනාගතයට බලපාන හැටි කල්පනා කරන්න. පෙම්වතා එක්ක පැනලා යනවා වෙනුවට දෙමාපියන්ට පැහැදිලි කරන්න නැත්නම් ඒ අයගෙන් ටිකක් බැණුම් අහගෙන ඉවසලා ඉන්නවා කියලා සඳුනිට තීරණය කරන්න තිබුණා.

ඊගාව දේ හොඳම විකල්පය තෝරගෙන ඒක ක්‍රියාත්මක කිරීම. ගත්තු තීරණය පලදායී ක්‍රියාවක් කිරීම තමයි මනෝ විද්‍යාවේදී තීරණ ගැනීමේ අවසාන පියවර විදියට පෙන්වන්නේ. ඒ කියන්නෙ අපි ගත්තු තීරණය තවත් හොඳ විදියට හැසිරවීම. උදාහරණයක් විදියට, ඉගෙනගන්නකල් සම්බන්ධය නතර කරලා අධ්‍යාපනයෙන් පස්සේ නැවත ඒ සම්බන්ධය පටන්ගන්න තීරණය කරන එක. එතකොට කාලීනව පෙම්වතා ගැන ඇගේ අදහස වෙනස් වෙන්නත් තිබුණා. අවාසනාවට සඳුනිට මේ කාරණා ගැන දැනුමක් තිබුණේ නැහැ. යෞවන වයසේ දරුවන් බහුතරයකට මේ කුසලතාවය නැහැ. ඔවුන් තීරණ ගන්නේ කලබලෙන්. හෝර්මෝන ක්‍රියාවලිය එක්ක ඔවුන් එහෙම තීරණ ගන්න එක ස්වාභාවිකයි. ඉතින් වගකීම තියෙන්නේ දෙමාපියන්ට.

හෝර්මෝන වෙනස්වීම, අත්දැකීම් වගේ දේ එක්ක වයසින් වැඩෙද්දී හිතාමතා තීරණ ගන්න පුළුවන් තැනක් එනවා. ඒත් පෞරුෂ අඩුපාඩු නිසා වයසට ගියත් ඉක්මන් තීරණ ගන්න අය ඕනතරම් ඉන්නවා. උපදේශනයෙන් ඒ වගේ තත්ත්වයන් යටපත් කරන්න පුළුවන්.

ඊගාව කාරණාව කලබල වෙලා තමන් ගන්න තීරණයේ වගකීම තමන්ට දරන්න වෙනවා කියන එක. ගොඩක් අඩු වයසින් විවාහ වුණ කාන්තාවෝ ඉන්නවා. ඒ අය දන්නේ දරුවෝ හදන්නයි, උයන්නයි විතරයි. සතුටින්, සැහැල්ලුවෙන් ඉන්න යුවතියක් දැක්කහම ඒ අයට අර ඇරියස් එක එනවා. එතකොට ඒ අය බලන්නේ අනිත් මිනිස්සුන්වත් මානසිකව වට්ටවන්න. ඉතින් ජීවිතේ වැදගත් තීරණයක් ගන්නකොට හොඳට හිතලා බලලා ඒ තීරණය ගන්න. කිසිම වෙලාවක කලබල වෙලා තීරණ ගන්න එපා. මොකද අපි ගන්න සමහර තීරණ ආපහු හරවන්න බැරි වෙන්නත් පුළුවන්. එහෙම හරවන්න බැරි තීරණ අරන් අනිත් අයගෙන් පලිගන්න, ඒ ගැන සමාජයට දෙස් කියන්න එපා. මොකද තමන් අද මුහුණදෙන ඕනම තත්ත්වයක් ඇතිවෙලා තියෙන්නේ තමන් කවදාහරි ගත්තු තීරණයක ප්‍රතිඵල විදියට. තමන් ගත්තු තීරණවල වගකීම තමන්ටම දරන්න වෙන බව මතක තියාගන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

**සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.**

# කැත හිතට තිත තියන්න මම තීරණය කළා



අපි හැමෝගෙම ජීවිතවල පුංචිම හරි ඉලක්කයක් තියෙනවා. ඒක විභාගයක් වෙන්න පුළුවන්, රැකියාවක් වෙන්න පුළුවන්, විවාහය වෙන්න පුළුවන්, ආදායම වැඩි කරගන්න විදියක් ගැන වෙන්න පුළුවන්, නැත්නම් පිටරට රැකියාවකට යන්න, ගෙයක් හදන්න, අලුත් වාහනයක් ගන්න, ජීවිතේ ඉන්න තැනින් ඉස්සරහට යන්න වගේ ඉලක්කයක් වෙන්නත් පුළුවන්.

සමහරය අය ඉන්නවා අවුරුද්දක් ලබද්දි තමන්ගේ ඒ ඉලක්කවලට යන්න පියවරෙන් පියවර සැලසුම් කරනවා. සමහර අය බුලට් ජර්නල් හදාගෙන හරිම පිළිවෙලට අවුරුද්ද, මාසය, සතිය, දවස සැලසුම් කරගෙන ඒ ඉලක්ක කරා යනවා.

ඉතින් මාත් මේ අවුරුද්ද ලබද්දීම හිතුවා මගේ ඉලක්කය වෙන්න ඕනේ මොකක්ද කියලා. හැබැයි වාහන, ගෙවල් දොරවල්, කියන කිසි දෙයක් මගේ ඔළුවට ආවේ නෑ. මගේ ඉලක්කය වුණේ කොහොමද මං මගේ හිත ලස්සන කරගන්නේ කියන එක. අපේ හිත ලස්සනයි කියලා අපිට විතරක් දැනුණාට මදි, ඒ ලස්සන අපි ආදරේ කරන අපේ සමීපතමයන්ටත් දැනෙන්න ඕනේ. ඊටපස්සේ තව අයටත් ඒ සුවඳ විහිදිලා යන්න ඕනේ. එතකොටයි තවත් කෙනෙකුගේ හිතක් සුවපත් කරන්න පුළුවන් මනුස්සයෙක් විදියට ජීවත්වෙන්න ලැබෙන්නේ.

ඉතින් මම මගෙන්ම ප්‍රශ්න කළා, මගේ හිත ලස්සන කරගන්නේ කොහොමද කියලා .එතකොට ලැබුණු උත්තර එක්ක මං මටම පුංචි නීති ටිකක් දාගත්තා.

මම ඇඳුම් ගන්න ගියපු වෙලාවක ෆිටෝන් රූම් එකෙන් ඇඳුමක් ඇඳන් හැඩ බලන්න එළියට ආපු ගෑනු ළමයෙක්ට, "මේ ඇඳුමට ඔයා ගොඩක් ලස්සනයි, ඒක ඔයාට ගැළපෙනවා" කියලා මං කිව්වා. එයා ගොඩක් සතුටු වෙලා මට ස්තූති කළා. ඒ සිද්ධිය වුණේ මං මැලේෂියාවේ ඉඳපු කාලේ. කවුද කියලාවත් නොදැන මං එයාගේ ලස්සන අගය කළා. ඉතින් මං හිතුවා තව කෙනෙක්ගේ හිතක් සතුටු කරන්න පුළුවන් හැකියාව මට තියෙනවා නම් ඒ දේ දිගටම තියාගන්න, ලස්සන දෙයක් දැක්කාම, ඒ කවුද? මොනවා කරන කෙනෙක්ද? තරාතිරම මොකක්ද කියලා නොබලා ලස්සනයි කියලා ඒ හිතට සතුටක් දෙනවා කියලා.

මං නිසා කාගේ හරි හිතක් රිදුනොත් ඒ දේ මං හිතාමතා නොකරපු දෙයක් නම්, හේතු පැහැදිලි නොකර සමාව ගන්නවා කියලා හිතුවා. ඒ දේත් මං කීපවිටක්ම කළා. හේතු පැහැදිලි කරලා මං වැරැද්දක් කළේ නෑ කියනවට වඩා හිත රිදුන කෙනාගේ හිතට පොඩි හරි සැනසීමක් වෙන්න පුළුවන් සමාව ගත්තාම. ඉතින් ඒ දේත් මින් ඉදිරියට කරන්න හිතාගත්තා. සමාව ගත්තා කියලා අපිට නැතිවෙන්න දෙයක් නෑනේ.

ඒ වගේම මට කාගෙන් හරි වැරැද්දක් වුණොත් ඉල්ලුවා නොඉල්ලුවා මං ඒ අයට සමාව දීලා මගේ හිතේ සැනසීම රැකගෙන ඉන්න හිතාගත්තා.

මාව පහත් කරලා කතා කරන කවුරුම හරි වේවා, ඒ මොහොතේ එන ආවේගයට ඉඩ නොදී නිශ්ශබ්ද වෙන්න ඕනේ කියලා හිතුවා. ඒ ඇවිලෙන්න ඕන තැන නිවෙන්න ඕනෙයි කියලා මං තදින්ම විශ්වාස කරන නිසා.

බැදීම මොකක් වුණත්, මාව ගනන් නොගන්න අයගේ පස්සෙන් යන්නේ නැතුව මගේ ආත්මාභිමානය රැකගෙන හිතේ සැනසීමෙන් ඉන්න තීරණය කළා. ඇවිලෙන්න හේතු හොයන අය ඉස්සරහා පුළුවන් තරම් නිවිලා ඉන්න උත්සාහ කරනවා කියලාත් මං මටම පොරොන්දු වුණා.

මගහැරුණ, අතහැරුණ, වැරදුන ජීවිතයක් තිබුණු මම, ඒ හැමදේම හදාගෙන ජීවිතේ ඉස්සරහට යන ගමන් තමයි ඉන්නේ. ඒ නිසා දවස ගානේ මාව ගොඩනගාගන්න එක තමයි මගේ ජීවිතේ ලොකුම අරමුණ.

මං මේ දේවල් ලිව්වේ මගේ හිත ලස්සන කරගන්න දරන උත්සාහයෙන් පුංචිම හරි දෙයක් ඔයාට වැදගත් වෙයි කියන අරමුණෙන්. මං ආස මාව දකින, පේන, ඇහෙන අයට 'ගුඩ් වයිබ්' එකක් වෙන්න. මගේ හිතේ ඇතිවෙන හැම සුබවාදී ආකල්පයක්ම හැමෝම එක්ක බෙදාගෙන ජීවිතේ ඉස්සරහට යන්න. එහෙම කරන්න පුළුවන් කියලා මට මං ගැන ලොකු විශ්වාසයක් දැනෙනවා. ඒ විශ්වාසය ඇතිවෙන්නේ නිකන්ම නෙවෙයි, අපි අපේ වැරදි අවබෝධ කරන් ඒවා හදාගනිද්දි.

මට ඊරිසියාවක් දැනෙද්දි, මේක ඊරිසියාවක් කියලා තේරුම් අරන් එතැනින් මිදෙන්න පුළුවන් හැකියාවක් දැන් මට තියෙනවා. අපේ වැරදි අඩුපාඩු පිට කෙනෙක් තේරුම් කරනවාට වඩා, අපිම තේරුම් අරන් හදාගනිද්දි ඇත්තටම හිත් ලස්සන වෙනවා. තමන්ට අවංකව වෙලා, තමන්ගේ හිතට එකඟ වෙලා, තමන්ගේ හෘදසාක්ෂියට අවනත වෙලා ජීවත්වෙද්දි ජීවිතේ සරලයි, හිතත් සුන්දරයි.

මේ ගමනේදී ඔයා එක්ක ගැටෙන්න එන, ඔයා එක්ක පැටලෙන්න එන අයත් ඕනෑතරම් ඉදීවී. ලොකුම හපන්කම තමයි ඒ අය එක්ක පැටලෙන්න, ගැටෙන්න නොගිහින් ඔයාගේ ගමන ඉදිරියටම යන එක. මේ ලිපිය කියවලා පොඩිම හරි දෙයක් ඔයාගේ ජීවිතේට ගත්තානම් මේ ලියපු අකුරුවලට හොඳම වටිනාකම මට ලැබේවි.

■ **හෂිණී මනමේන්ද්‍ර**



# මුල් කාලෙ නම් මම ගහන ෆොටෝ දැකලා කට්ටිය කලබල වුණා



**රැෆෙල්ලා ප්‍රනාන්දු**

වික්ටෝරියානු යුගය කියන්නේ එංගලන්තේ ගෑනුන්ට වැඩියෙන්ම නීති වැටිච්චි කාලේ. ජූලියා මාග්‍රට් කැමරන් ජීවත්වුණෙත් ඔය කාලේ. දවසක් කැමරන් නෝනට අයින් කරපු පරණ කැමරාවක් ලැබුණේ අහම්බෙන්. ඒකෙන් ෆොටෝ ගහන හැටි ඇය තනියම ඉගෙනගත්තා. ඒ කාලේ මිනිස්සු කැමරන්ව දැක්කේ නිකන් තුවක්කුවක් අතේ තියාගෙන ඉන්න ගෑනියෙක් ගානට. හැබැයි එච්චර කැමරන් නෙමෙයි සැලුණේ. ඇය මිනිස්සුන්ගේ ෆොටෝ ගැහුවා. කට්ටිය ඒවා කැතයි කිව්වා. ඒ කියද්දිත් දිගටම ඇය ෆොටෝ ගැහුවා. කාලෙකදි ඇගේ අද්විතීය නිර්මාණ එංගලන්තේ පුරා ප්‍රසිද්ධ වුණා. එංගලන්තේ ප්‍රථම ඡායාරූප ශිල්පිනිය ජූලියා කැමරන්. වික්ටෝරියා කෞතුකාගාරෙට මුලින්ම ඡායාරූප දුන්නු කාන්තාව, ඒ විතරක්ද අන්තර්ජාලේ තියෙන චාල්ස් ඩාවින්, ආතර් රජු, හෙන්රි ටේලර්, ජෝන් හර්ඩොල් වගේ ප්‍රකට පුද්ගලයන්ගේ ෆොටෝ පවා කැමරන් නෝනා ගහපුවා.

මාග්‍රට් කැමරන් පටන්ගත්තු ෆොටෝ වැඩේ ඉස්සරහට ගෙනියපු කාන්තාවන් ලෝකේ වටේම ඉන්නවා. ලෝකේ තත්ත්වය ඒක වුණත් අදටත් අපේ ඡායාරූප ක්ෂේත්‍රයේ කාන්තාවන් අඩුයි. ඒ විතරක් නෙමෙයි විලාසිතා ඡායාරූපකරණය පැත්තෙන් ජාත්‍යන්තරයට ගියපු පිරිමි ඡායාරූප ශිල්පීන් පවා අඩුයි. එහෙම තියෙද්දිත් ෆැෂන් ෆොටෝග්‍රැපි කිව්ව හැටියේ එකපාර කාන්තා නාමයක් මතක්වෙනවා නම් ඒ නම බොහොම විශේෂයි නේද?

ඔව්. ඒ රැෆෙල්ලා ප්‍රනාන්දු. ෆැෂන් ෆොටෝග්‍රැපි ගැන කියද්දි අපේ රටේ කාටත් මුලින් මතක් වෙන නම ඒක.

**"මුල් කාලේදි ආර්ටිස්ට්ලාගේ ෆොටෝ දැකලා කට්ටිය කලබල වුණා. හැමදාම සාමාන්‍ය විදියට දකින කලාකරුවන්ව මේ විදියට දකින්න මිනිස්සු කැමති වුණේ නෑ. හැබැයි ඒ අකමැත්ත මම අභියෝගයක් කරගත්තේ නැහැ. මම දිගටම මගේ වැඩේ කළා."**

අලුත් වැඩක් පටන්ගනිද්දි ඒ වෙනස හුරු නැතිකමට මිනිස්සු කියන කතා ඇහැව්වා නම් ජූලියා කැමරන් ඉතිහාසෙත් නෑ, රැෆෙල්ලා ප්‍රනාන්දු ජාත්‍යන්තරේත් නෑ.

ඡායාරූප ගැනම කතා කළාට මොකෝ රැෆෙල්ලා විලාසිතා නිර්මාණයෙනුත් ජාත්‍යන්තරය ජයගත්තු කාන්තාවක්. ඉතින් ඇගේ කතාව අපිත් එක්ක බෙදාගන්න ගමන් අද 'ධරණී' කවරය හැඩ කරන්න අපි ඇයට ආරාධනා කළා.

"මගේ ගම වැලිසර. පවුලේ ඉන්නේ අම්මයි, තාත්තයි, අක්කයි, මමයි. තාත්තා ව්‍යාපාරිකයෙක්. පුංචි කාලේ ඉඳලා මම කලාවට දක්ෂයි. අක්කා කැමති ඉගෙනගන්න. අම්මලා අපි දෙන්නගේ මේ වෙනස හොඳට තේරුම් අරන් අපිව ඒ ඒ අංශවලට යොමුකළා."

දෙමාපියන්ගෙන් ලැබුණු ඒ තල්ලුව රැෆෙල්ලා අද ඉන්න තැනට එන්න සෑහෙන රුකුල් වුණා කියලා ඇය කිව්වා.

**"යමක් කමක් තේරෙන කාලේ ඉඳලම මම චිත්‍ර ඇන්දා. මගේ පළවැනි චිත්‍ර ප්‍රදර්ශනය තියනකොට මට අවුරුදු 14යි. චිත්‍ර තරඟ ගොඩකින් දිනලා තියෙනවා. ජපන් නැෂනල් ආර්ට් ගැලරි එකෙත් එකපාරක් මගේ චිත්‍රයක් ප්‍රදර්ශනයට තිබුණා."**

චිත්‍ර විතරක් නෙමෙයි කලා විෂයන් විදියට ඇය නාට්‍ය, මූර්ති ශිල්පය එහෙමත් හදාරලා තියෙනවා.

"ශාන්ති ආර්ට් ෆවුන්ඩේෂන් එකෙන් අවුරුදු 12ක් මූර්ති හා චිත්‍ර කලාව හැදෑරුවා. හැබැයි උසස් අධ්‍යාපනය කරද්දි මම ආස වුණේ ෆැෂන් ඩිසයිනින්වලට."

රැෆෙල්ලා කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයේ ආදි ශිෂ්‍යාවක්. ඇකඩමි ඔෆ් ඩිසයින් (Academy of Design) ආයතනයෙන් විලාසිතා නිර්මාණකරණය ඉගෙනගනිපු ඇයට එංගලන්තයේ බොස්ටන් විශ්වවිද්‍යාලයෙන් (Boston University - London) ෆැෂන් ඩිසයිනින් සම්බන්ධ උපාධියක් තියෙනවා.

**"ඉගෙනගෙන ඉවර වුණාට පස්සේ ෆැෂන් ඩිසයිනින් කම්පැනි කිහිපයකම වැඩ කළා. තව කෙනෙක් යටතේ වැඩ කරනවට වඩා මගේම දෙයක් පටන්ගත්තොත් දුර ගමනක් යන්න පුළුවන් කියලා හිතුණු නිසා 'Raffella' නමින් තනියම ෆැෂන් ඩිසයින් කරන්න පටන්ගත්තා."**

තනියම ගමනක් යන්න ඕනේ කියලා රැෆෙල්ලගේ හිතේ ඇතිවුණු පුංචි සිතුවිල්ල නතර වුණේ ලොකු තැනකින්. ලන්ඩන් ෆැෂන් වීක්, පැරිස් ෆැෂන් වීක් කියන්නෙ ලෝකේ හැම විලාසිතා නිර්මාණකරුවෙක්ම යන්න හීන දකින විලාසිතා ප්‍රදර්ශන දෙකක්. කොටින්ම කිව්වොත් ෆැෂන් ඩිසයිනර් කෙනෙක්ට ඔතැනින් එහාට තව යන්න තැනක් නැහැ.

**"ලන්ඩන් ෆැෂන් වීක්, පැරිස් ෆැෂන් වීක් දෙකෙන්ම මගේ ඇඳුම් නිර්මාණ එළිදක්වලා තියෙනවා. එංගලන්ත නළු මොරිසා කැලමයින් සහ කොරියානු නළු හියුජින් ලී තමයි එහිදී මගේ ඇඳුම් ඇන්දේ."**

Canns සිනමා උළෙලත් ඔයිට දෙවැනි නැහැ. හැම අවුරුද්දේම ප්‍රංශයේ තියෙන Canns එකට යන එක ලෝකේ ප්‍රකට කලකරුවන්ට පවා හීනයක්. විලාසිතා නිර්මාණ පැත්තෙන් Canns ගියපු පළවැනි ශ්‍රී ලාංකිකයා රැෆෙල්ලා.

"Canns 69, 71 ෆෙස්ටිවල් දෙකටම මම ඇඳුම් හැදුවා. හොලිවුඩ්වල ප්‍රකට සෙලිබ්‍රිටි ලෝයර් කෙනෙක් වෙන ටයිට් බ්‍රිස්ටා වෙනුවෙනුත් එකපාරක් ඇඳුමක් නිර්මාණය කළා."





### ඔහොම ෆැෂන් ඩිසයිනින් කර කර හිටපු රැෆෙල්ලා ෆොටෝ ගහන්න පටන්ගත්තේ කොහොමද?

"ඇඳුම් නිර්මාණය කළාට පස්සේ එච්චගේ ෆොටෝ ගහන්න ඕනානේ. හැබැයි කිසිම තැනකින් ඒ වැඩේ මට ඕන විදියට වුණේ නැහැ. ඉතින් ඒකත් මටම කරලා බලන්න හිතුණා. පස්සේ මම තනියම ෆොටෝග්‍රැපි ඉගෙනගත්තා. සෑහෙන රිසර්ච් කළා. දේවල් කියෙව්වා. හොයලා බැලුවා. මගේ ෆොටෝස් ලස්සනයි කියලා ගොඩක් අය කිව්වා. දැන් මම ෆොටෝ ගහන්න අරන් අවුරුදු 14ක්. ඡායාරූප ක්ෂේත්‍රයේ නමක් හදාගත්තු ඡායාරූප ශිල්පිනියන් ඒ කාලේ හිටියේ නැහැ. ඡායාරූප ශිල්පීන්ට පවා තියෙන ගෞරවය අඩුයි කියලා මට දැනුණා. ෆොටෝ වැඩේ දිගටම කරනවා නම් ගෞරවයක්, පිළිගැනීමක් හදාගෙන ඒක කරන්න ඕනේ කියලා මට හිතුණා. ඒ වෙනුවෙන් මම සෑහෙන මහන්සි වුණා."

අවුරුදු ගාණකට කලින් ෆොටෝ ගහන්න පටන්ගත්තතත් ෆැෂන් ෆොටෝග්‍රැපර් කෙනෙක් විදියට රැෆෙල්ලා ජනප්‍රිය වුණේ සෙලිබ්‍රිටි කැලෙන්ඩර් එකත් එක්කයි.

**"මගේ ඇඳුම්වල ෆොටෝස් කරන අතරේ වෙනත් මැගසීන්, බ්‍රෑන්ඩ්ස් වෙනුවෙනුත් ඡායාරූප කළා. ඒවා දැකලා ආර්ටිස්ලගේ ෆොටෝෂූට්ස් කරන්න කම්පැණි එකකින් කතා කළා. ආර්ටිස්ලා එක්ක වැඩ කරන්න පටන්ගත්තේ එතැනින්. මුල්ම ෆොටෝෂූට් එක කළේ සාරංග දිසාසේකර එක්ක. මෙහෙම කරපු ආර්ටිස්ලගේ ෆොටෝස් ගොඩක් ප්‍රසිද්ධ වුණා."**

රැෆෙල්ලා මුලින්ම සෙලිබ්‍රිටි කැලැන්ඩර් එක (ජනප්‍රිය පුද්ගලයන්/කලාකරුවන් යොදාගෙන නිර්මාණය කරන දිනදර්ශන) එළිදැක්වුවේ 2013දී.

"වෙන රටවල සෙලිබ්‍රිටි කැලැන්ඩර් හරි ප්‍රසිද්ධයි. අපේ රටේත් ලස්සන කලාකරුවෝ ඉන්නවා. හැබැයි හැමදාම එයාලව දකින්නේ එකම විදියට. වෙනස් විදියට කැලැන්ඩර් එකක් කරන්න හිතුණේ ඒකයි. 2013/2014 අවුරුදු දෙකේ කැලැන්ඩර් කළේ කලින් කම්පැණි එකට කරපු ෂූට්ස්වල ඉතිරි ෆොටෝවලින්. කැලැන්ඩර් එකටම කියලා ෂූට්ස් කරන්න පටන්ගත්තේ 2015දී."

රැෆෙල්ලාගේ ෆොටෝවල තියෙන්නේ අමුතුම කලාවක්. ෆොටෝස් ගන්නවට අමතරව ඡායාරූපවලට ඉන්න කලාකරුවන්ගේ ෆැෂන් පැත්ත බලන්නෙත් ඇයමයි.

**"මේ වැඩේට ආර්ටිස්ලගෙන් මට ලොකු සහායක් ලැබෙනවා. 2021 ඉඳලා කැලැන්ඩර් එක ඉන්දියාව, පැරිස්, ලන්ඩන් එහෙමත් යනවා. පටන්ගත්තු මුල් කාලේ කලාකාරයන්ව වෙනස් කරනවා කියලා විවේචන ආවට දැන් ගොඩදෙනා මේ විදියට ඒ අයව දකින්න කැමතියි."**

ගිය අවුරුද්දේ ඇගේ කැලැන්ඩර් එකේ ජැකලීන් ෆර්නෑන්ඩසුත් හිටියනේ. ලංකාවට

නෑකම් කිව්වත් ඇය ප්‍රකට බොලිවුඩ් නිළියක් නිසා ඒ අත්දැකීම ගැනත් අපි ඇගෙන් ඇහුවා.

"ගිය අවුරුද්දේ රෝහිත් ෂෙට්ටිගේ 'සර්කස්' කියලා හින්දි මූවි එකක් ආවා. ඒකේ ප්‍රවර්ධන ඡායාරූප කරන්න මට අවස්ථාව ලැබුණා. චිත්‍රපටයේ ප්‍රධාන නිළිය ජැකලීන්. එකට වැඩ කරද්දී මම කැලැන්ඩර් එකේ ෆොටෝ ඇයට පෙන්නුවා. කැලැන්ඩර් එකට ෂූට් එකක් කරන්න ජැකී එකපයින් කැමති වුණා. මුම්බායිවලදි මම ෂූට් එක කළා. ජැකලීන් නිසා මේ පාර කැලැන්ඩර් එක ඉන්දියාවේ ගොඩක් ප්‍රසිද්ධ වුණා. ඡායාරූප සමාජ මාධ්‍යවල ෂෙයා කරලා ඇයත් මට ලොකු සහයෝගයක් දුන්නා."

**රෝහිත් ෂෙට්ටිගේ ෆිල්ම් එකේ ෆොටෝ ගන්න රැෆෙල්ලාට අවස්ථාව ලැබුණේ කොහොමද?**

"මාස ගාණක ඉඳලා එයාලා ඉන්ස්ටාග්‍රෑම් එකේ මාව ෆලෝව් කළා. පස්සේ දවසක කතා කරලා වැඩේ බාරදුන්නා. රූගතකිරීම් තිබුණේ ඉන්දියාවේ. ඉතින් දවස් ගාණක් එහේ ගිහිල්ලා වැඩ කළා. රන්වීර් සිං, දීපිකා පදුකෝන්ලා එහෙමත් හිටියා. බොලිවුඩ් කියන්නේ අපිට ලොකු හීනයක් වගේනේ. ඒ අය එක්ක වැඩ කරද්දි මේ අය එක්කත් වැඩ කරන්න ලැබුණානේ වගේ අමුතු සතුටක් දැනුණා."

හොලිවුඩ් වැඩ විතරක් නෙමෙයි රැෆෙල්ලා ජාත්‍යන්තර සඟරා වන නිවේයෝර්ක් ටයිම්ස්, පැරිස් ෆැෂන් නිව්ස් මැගසීන්, මිහාරා මොල්විස් වගේ මැගසීන් වෙනුවෙන් වගේම නයිකි, ගැප්, කැනෝන් වගේ ජාත්‍යන්තර සන්නාම වෙනුවෙනුත් ඡායාරූප ශිල්පිනියක් විදියට වැඩ කරනවා.

"එංගලන්තේ IAA සම්මාන උළෙලේ හොඳම ඡායාරූප ශිල්පිනිය විදියට සම්මානයක් ලැබුණා. ඒ තරඟකරුවන් 310ක් අතරින්. මේ සම්මානය දිනාගත්තු පළමු ආසියානුවා මමයි. BEFTA UK ආයතනයෙන් තමයි ඡායරූප ශිල්පීන්ට වර්ල්ඩ් රෑන්ක් දෙන්නේ. ඔවුන්ගේ ශ්‍රේණිගතකිරීම්වලට අනුව ලෝකයේ හොඳම ඡායාරූප ශිල්පීන් 10 දෙනාගෙන් 8 වැනි තැන ලැබුණා. නිවේයෝර්ක් ෆැෂන් සම්මාන උළෙලේ අවසානය දක්වා ගියා. එතැනදි නම් මට සම්මානයක් ලැබුණේ නැහැ. හැබැයි අවසානයට යෑමම මට සම්මානයක්. ඒ වගේම IPA සම්මාන උළෙල. ඡායාරූප ශිල්පීන්ට මේක ඔස්කා හා සමානයි. 2022 IPA එකෙන් මට ජූරියේ විශේෂ සම්මානයක් ලැබුණා."

ඒ ඇය ලබාගත්තු ජාත්‍යන්තර ජයග්‍රහණ. ඉතින් මුලදි ඡායාරූප ක්ෂේත්‍රයේ විශේෂ නමක්, සන්නාමයක් විදියට රැෆෙල්ලාව හැඳින්නුව එක සාධාරණයි නේද? අහම්බෙන් වගේ කැමරාව අතට අරන් කාන්තාවක් විදියට ඇය ඇවිල්ලා තියෙන ගමන ගොඩක් දුරයි. හැබැයි අපි මෙච්චර වෙලා කතා කළේ ඒ ගමනේ ලස්සන පැත්ත. ඒ යට තියෙන කටුක කතාව කියන්නේ දැන්.

"2017දී සමනලී ෆොන්සේකා එක්ක ඉංගිරියේ නාන තොටුපළක ෆොටෝෂූට් එකක් කළා. ෆොටෝ ගනිද්දි සම්පූර්ණ අවධානය දෙන්නේ ඒකටනේ. වැඩේ කරන අතරතුරේ මාව ලිස්සලා වැටුණා. එවෙලේ මට ලොකු අමාරුවක් ආවේ නැහැ. හැබයි දවස් ගාණකට පස්සේ එකපාරම මගේ බෙල්ලෙන් පහළ සම්පූර්ණයෙන් පණ නැති වුණා. අවුරුදු එකමහමාරක් ඇඳට වෙලා හිටියා. මට ආයේ කවදාවත් ඇවිදින්න බැරිවෙයි කියලයි ඩොක්ටර්ස්ලා කිව්වේ. ඒ කාලේ මම ප්‍රසිද්ධයි. හොඳට වැඩ ආවා. ඉතින් එහෙම ඉඳලා එකපාර එක්තැන් වෙනවා කිව්වහම මම මාර විදියට මානසිකව වැටුණා. ඇඬුවා. ඒත් සිංහල බෙහෙත් නිසා ඇවිදින්න බෑ කිව්ව මට ආයේ නැගිටින්න පුළුවන් වුණා. මගේ 10 වැනි කැලැන්ඩර් එක කළේ ගිය අවුරුද්දේ. ඒ වැඩ අස්සේ අවුරුදු ගාණකට පස්සේ ආයෙත් කොන්දේ අමාරුවක් ආවා. මුකුත් නොකර ඇඳටම වෙලා ඉන්න කියලයි ඩොක්ටර්ස්ලා කිව්වේ. හැබැයි කොහොමහරි ෂූට් එක කරනවා කියලා මම හිතුවා. දවසකට වේදනානාශක මිලිග්‍රෑම් 17,000 ගානේ බිබී තමයි ෂූට් කළේ. ඒ බීපු බෙහෙත් ඇඟෙන් අයින් කරන්න දවස් ගණන් වමනේ දැම්මා. පොඩ්ඩ එහා මෙහා වුණානම් මම ආයේ එක්තැන් වෙන්න තිබුණා. හැබැයි ඒ අවදානම අරන් කොහොමහරි සාර්ථකව වැඩේ කළා."

සියුමැලි කියන ගෑනුන්ට අවස්ථාවේ හැටියට යකඩ ගෑනු වෙන්නත් බැරිකමක් නැහැ කියලයි රැෆෙල්ලාගේ කතාව ඇහුවම අපිට හිතුණේ.

**"මගේ ගෙදර අයගෙනුත් මට ලොකු සහායක් ලැබෙනවා. මගේ හස්බන්ඩ් නිෂාන් දිල්ෂ්. මගේ බ්‍රෑන්ඩ් එක 'රැෆෙල්ලා ප්‍රනාන්දු' කියන මගේ නම. විවාහ වුණාට පස්සේ මගේ නම වෙනස් කරන්න කියලවත් කවදාවත් ඔහු කියලා නැහැ. මම සාර්ථක වෙනවා දකින්න එයා හරිම කැමතියි. අපි දෙන්නම වැඩ කරන නිසා සහයෝගයෙන් දේවල් කළමනාකරණය කරගන්නවා. මම ඉව්වොත් එයා වළං හෝදනවා. එයා වළං සේදුවොත් මම උයනවා. සැමියෙක්ගෙන් ඒ වගේ හයියක් තියෙනවා නම් ඕනම කාන්තාවකට සාර්ථක වෙන්න පුළුවන්."**

ඇයට සහාය දෙන පිරිස ගැන මතක් කළ ඇය 'ධරණී' කියවන ඔබ වෙනුවෙන් වචනයක් කියන්නත් අමතක කළේ නෑ.

**"අපේ සමාජේ දැන් ලොකු තරඟයක් තියෙනවා. අරයා අරක කරන නිසා මමත් ඒකම කරන්න ඕනේ කියලා හිතන්න එපා. තමන්ට ආවේණික දක්ෂතාවන්, හැකියාවන් අඳුනගෙන ඒ ගැන හැදෑරීම් කරලා වැඩක් පටන්ගන්න. මම වුණත් තාමත් දේවල් ඉගෙනගන්නවා. අනික අනිත් අය ඉක්මනට සාර්ථක වෙනවා කියලා ඒ වේගෙන්ම සාර්ථක වෙන්න ඕනා කියලා එකක් නැහැ. හිමින් හිමින් අත්දැකීම් එක්ක තමන්ගේ ගමන යන්න කියන එකයි අනිත් අයට මම කියන්නේ."**

**■ සෙව්වන්දි හෙට්ටිආරච්චි**
**ඡායාරූප - ක්‍රිෂාන් කාරියවසම්**





THE UTMOST FOR THE HIGHEST
1954

බෞද්ධ කාන්තා විද්‍යාලය Buddhist Ladies' College

**6 ශ්‍රේණිය 2023 / පළමු වසර 2024 / පෙර පාසල්**

සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිසුවියන් බඳවා ගැනීම

වසර 69 ක අභිමානවත් ඉතිහාසයකට හිමිකම්පාන
කොළඹ 07 බෞද්ධ කාන්තා විද්‍යාලයේ
ඔබ දියණියට ඉගෙනීමට අනගි අවස්ථාවක්.
කාර්යාලයට පැමිණ අයදුම්පත් දැන් ලබාගත හැක.
විමසීම් සඳහා පහත අංක අමතන්න.

**ADMISSIONS GRADE6-2023**
**GRADE 1-2024/NURSERY 2024**

With a long-proven history of 69 years, Buddist Ladies College, Colombo 07 offers your daughter a valuable chance.

Application forms are availble at the office.
Vacancies exist in Sinhala and English language streams.
For any clarifications in this regard please contact us.

බෞද්ධ කාන්තා විද්‍යාලය
නො. 229, ධර්මපාල මාවත, කොළඹ 7
දුරකතන - 0112695347 / 0772821954
www.buddhistladiescollege.lk

**මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි**

# කාඩ්බෝඩ් පිරිමින්ට වඩා නම් පින්ගුත්තර හොඳයි

උම්මග්ග ජාතකය කියන්නේ ජාතක පොතේ තියෙන දීර්ඝම ජාතක කතාවනේ. ඔය කතාව පුරාවටම සඳහන් වෙන්නේ බුදුන්වහන්සේ මහෞෂධ පඬිතුමා විදියට ඉපදුණ ආත්මෙදි එතුමන්ගේ ප්‍රඥාවෙන් විසඳපු නොයෙකුත් ප්‍රශ්න ගැන. මේ කියන සිරිකාලකන්නි ප්‍රශ්නයත් ආන්න ඒ විදියට විසඳපු ප්‍රශ්නවලින් එකක්.

ඔය කතාවේ ඉන්නවා පින්ගුත්තර කියලා තරුණයෙක්. ඔහු ශිල්ප හදාරන්න ගිහිල්ලා තියෙන්නේ තක්ෂිලා නුවර දිසාපාමොක් ඇදුරුතුමන් ළඟට. ඔහු ඉගෙනීම අහවර කළේ දිසාපාමොක් ආචාරීන්ගේ දක්ෂතම ගෝලයා බවටත් පත්වෙලාලු.

ඔය කාලෙදි ගුරා තමන්ගේ දක්ෂතම ගෝලයාට දුව දීග දෙන සිරිතක් තිබුණාලුනේ. ඒ නිසා පින්ගුත්තරයාටත් දිසාපාමොක් ඇදුරුතුමාගේ දෝණියන්දට කරගහන්න සිද්ධවෙලා. ගුරු ගෞරවය නිසාම මේකට කැමති වුණා ඇරෙන්න ඔහුගේ හිතේ ඇය ගැන අබමල් රේණුවක තරම්වත් ආදරයක් තිබිලා නෑ. ඒත් ඉතින් කරන්න දෙයක් නැති නිසා කොල්ලා කෙල්ලවත් අරගෙන ගමට යන්න තක්ෂිලා නුවරින් පිටත්වෙලා තියෙනවා.

යන අතරමඟදි රෑ බෝවුණ නිසා දෙන්නටම මඟුල්දා රාත්තිරිය ගෙවන්න වෙලා තියෙන්නේ පාරේ තිබුණු අම්බලමක. ඔහොම ඉන්නකොට අර තරුණිය ආදරය බලාපොරොත්තුවෙන් ටිකෙන් ටික පින්ගුත්තරයට කිට්ටුවෙලා. හැබැයි ඉතින් අර කෙල්ල ඇඳට ගොඩවෙනකොට පින්ගුත්තරයා බිමට පනිනවලු. ආපහු කෙල්ල බිමට පනිනකොට පින්ගුත්තරයා ඇඳට ගොඩවෙනවලු. කොහොමින් කොහොමහරි දෙන්නත් එක්ක පහුවදා එළිවෙනකම්ම ඔය සෙල්ලම තමයි කරලා තියෙන්නේ. අන්තිමේදි අර තරුණියට හොඳටම තරහා ගිහිල්ලා "ගෑනියයෙක් බලෙන් ඇඟට පැනලත් ඒ දිහා නොබලන උඹනම් හැබෑම පින්ගුත්තරයෙක්" කියලා මේ ඉලන්දරියාට බැන වැදිලා.

ඒ වෙලාවේ පින්ගුත්තර කිව්වලු පිරිමියෙක් යම්කිසි ගැහැනියෙක්ව තමන්ගේ භාරිය විදියට පිළිගන්නේ නැතිනම් ඇගේ ගෞරවය කෙලසමින් ඇයට පුරුෂ ශක්තිය පෙන්නීම නියම පිරිමිකම නෙවෙයි කියලා. ඊටපස්සේ මේ තරුණයා ඇය දිඹුල් ගහක මුදුනටම නගිනකන් බලන් ඉඳලා ගහ වටේටම කටු අතුරලා පැනලා ගියා කියලයි කියන්නේ.

ඔය කියන කාලෙදි මියලු නුවර රජකම් කරලා තියෙන්නේ වේදේහ රජතුමා. ඔන්න ඉතින් පසුවදා සේනාව එක්ක ඇවිදින්න ආපු



රජතුමා දිඹුල් ගහේ හිටපු මේ තරුණියව දැකපු ගමන් ඇගේ රූපෙට වශීවෙලා ඇයව ඔහුගේ අන්තඃපුරයේ අගබිසව බවට පත් කරගත්තාලු. එදා උදවිය දිඹුල්වලට උදුම්බරා කියලා තියෙන නිසා දිඹුල් ගහක් මුදුනෙදි හමුවුණ මේ තරුණියටත් උදුම්බරා දේවිය කියලා ආමන්ත්‍රණය කරලා තියෙනවා.

හැබැයි මේ උදුම්බරා දේවියට වැඩි කාලයක් වේදේහ රජතුමාගේ අගබිසව වෙලා ඉන්න ලැබිලා නැහැ. ටික කාලයක් යද්දි වේදේහ රජතුමා අවුරුදු දෙළහක ලාබාල තරුණියක්ව අගබිසව කරගෙන උදුම්බරාව මාලිගාවෙන් නෙරපලා තියෙනවා. මුලින්ම ඔය කතාව ටිකක් මතක් කරලම හිටියේ නියම පිරිමිකම කියලා හිතාගෙන එදා උදුම්බරා පටලවගත්ත තැනම අදටත් අපේ සමහර ගෑනුත් පටලවගන්නවා කියලා හිතුණ නිසා.

ඇත්තටම කාන්තාවක් තමන්ගේ ගෞරවය රකින පිරිමියෙක්ව තෝරගන්න ඕන කොහොමද, එහෙමත් නැත්නම් පිරිමියෙක් නියම පිරිමියෙක් බවට පත්වෙන්නෙ තැන නොතැන නොබලා ගෑනුන්ට පුරුෂ ශක්තිය පෙන්නුවොත් විතරමද?

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික මහාචාර්ය අත්තනායක එම්. හේරත් මහතා ඒ ගැන කිව්වේ මේ විදියේ කතාවක්.

කවුරුහරි කාන්තාවක් ඇවිත් මගෙන් ඇහුවොත් නියම පිරිමියා කියන්නේ මොකාටද කියලා මම නම් කියන්නේ ගැහැනියෙකුට ගරුකරන, රැකවරණයක් සලසන්න පුළුවන් එකා තමයි නියම පිරිමියා කියලා. එහෙම නැතුව දකින දකින ගෑනි ඉස්සරහ බොරු සංදර්ශන දාලා වීරයා වෙන්න හදන උන්ට කවදාවත් නියම පිරිමියෙක් වෙන්න බැහැ.

කතාවේ හැටියට ඔය පින්ගුත්තරත් එදා උදුම්බරාගේ ඇඟට අතක්වත් නොතිබ්බේ ඒකා නියම පිරිමියෙක් නිසා කියලයි මට නම් හිතෙන්නේ. මොකද ඇයව තමන්ගේ බිරිඳ කර නොගන්නවා නම් ඇගේ ගෞරවයට හානි නොකරන්න ඕන කියන තැන ඉඳන් ඔහු කටයුතු කරලා තියෙනවා. එහෙම නැතුව පින්ගුත්තරයාත් එදා රෑ ඒ ගෑනිගේ ගෞරවය රකින එක කෙසේ වෙතත් මුලින්ම මගේ පිරිමිකම රැකගන්න ඕන කියලා හිතලා තිබුණා නම් වේදේහටත් එදා අගබිසව කරලා ඔටුනු පළන්දන්න වෙන්නේ දවසක් හරි පවුල් කාපු වෙන මිනිහෙකුගේ අඹුවක් එක්ක. එහෙමත් නැතුව පින්ගුත්තර හිතලා තිබුණා නම් ආදරේ කළා නොකළා ඔන්න ඔහේ මේකි නමට හරි මගේ ගෑනි වෙලා හිටපුවාවේ කියලා උදුම්බරාට රජබිසවක් වෙන්න වාසනාවක් නොලැබෙන්නත් ඉඩ තිබුණා. ඇයට ඒ සියල්ල ලැබුණේ පින්ගුත්තර එදා නියම පිරිමියෙක් විදියට ඇයට හානියක් නොකරපු නිසා. නමුත් එදත් උදුම්බරා කියන ගැහැනියගේ හිතේ වීරයෙක් විදියට රජවුණේ තමන්ගේ ගෞරවය රැකපු පිරිමියා නෙවෙයි, කිසිම ඇහිල්ලක් බැලිල්ලක් නැතුව රට්ටුන්ට පේන්න පෙරහරකින් අරගෙන ගිහිල්ලා තාවකාලික ඔටුන්නක් පළන්දපු වේදේහ රජතුමාව.

ඔය වගේ උදුම්බරාලා අදටත් අපේ සමාජයේ ඕනතරම් ඉන්නවා. ඒ වගේ කාන්තාවෝ පිරිමින්ගේ බාහිර පෙනුමට අනන්ත අප්‍රමාණ රැවටිලා ජීවිත අපායක් කරගත්තු අවස්ථා ගැන මට ඕනතරම් අහන්න දකින්න ලැබිලා තියෙනවා. සමහරක් ගැහැනු උදවිය ඉන්නවා ඒ උන්දැලට ආදරය, කරුණාව තියෙන පිරිමින්ව පේන්නෙම අර පින්ගුත්තරලා වගේ. ටිකක් සද්දෙන් කතා කරලා, අඩිය පොළොවේ හප්පලා, පොඩි දේටත් බෙල්ලෙන් අල්ලලා කනේ පාරක් දෙන එකාට තමයි ආන්න නියම පිරිමියා කියලා කියන්නේ.

**කාන්තාවෝ පිරිමින්ගේ බාහිර පෙනුමට අනන්ත අප්‍රමාණ රැවටිලා ජීවිත අපායක් කරගත්තු අවස්ථා ගැන මට ඕනතරම් අහන්න දකින්න ලැබිලා තියෙනවා. සමහරක් ගැහැනු උදවිය ඉන්නවා ඒ උන්දැලට ආදරය, කරුණාව තියෙන පිරිමින්ව පේන්නෙම අර පින්ගුත්තරලා වගේ**

ඕකට මම දන්න කියන ඇත්තම කතාවකුත් කියන්නම්කෝ.

විශ්වවිද්‍යාලෙදි මගෙන් ඉගෙනගත්තු ඉතාමත් දක්ෂ ලස්සන දුවෙක් හිටියා. අද වෙනකොට ඇය ගුරුවරියක්. හැබැයි අදටත් කසාදයක් කරගෙන නෑ. හේතුව මීට කාලෙකට කලින් ඇයත් උදුම්බරා වගේම තමන්ගේ ගෞරවය රැකපු තරුණයෙක්ව පින්ගුත්තරයෙක් කියලා තමන්ගේ ජීවිතෙන් පන්නගෙන, ගෞරවය කෙලසපු පිරිමියාව වීරයෙක් කරගෙන ජීවිතේම වරද්දගත්තා.

මට මතක විදියට ඒ දුවට ඉතාමත් හොඳ පවුලකින් වැදගත් පිරිමි ළමයෙක්ව යෝජනා වෙලා තිබුණා. දෙන්නා කසාද බඳින්න කියලා හිතාගෙන ටික කාලයක් එහෙ මෙහෙ ගමන් බිමන් එහෙමත් ගිහිල්ලා ආශ්‍රය කළා. හැබැයි ඒ කාලය අතරතුර අර පිරිමි ළමයා ඒ දැරිවිය අනවශ්‍ය තැන්වලට අරගෙන ගිහිල්ලා ඇයට හානිවෙන විදියට කටයුතු කරලා තිබුණේ නෑ. ඒ දුව මට කියලා තියෙන විදියට දවසක්දා ඒ තරුණයා ඇයට කියලා තියෙනවා නිකමටවත් කසාද බඳින්න කලින් ඔහු මියගියොත් ඇයට නම්බු පිටින් වෙනත් කසාදයක් කරගන්න පුළුවන් මට්ටමට ඔහු ඇයව ආරක්ෂා කරනවා කියලා. හැබැයි ඇය හැමදාමත් ඔහුගේ ඒ ගතිගුණය දැක්කේ නිවටකමක් විදියට. සමහරක් දාට ඔහු සමරිසි පිරිමියෙක්වත්ද කියලත් ඇය ඔහුව සැක කරපු අවස්ථා තිබිලා තියෙනවා.

ඔය ප්‍රශ්න නිසා ඒ දුව අර තරුණයාව අත්හැරලා දාලා වෙනත් සම්බන්ධයක් පටන්ගත්තා. ඒ තරුණයා කලින් තරුණයට වඩා ඉතාමත් කඩවසම්. සෙල්ලක්කාරයි. සම්බන්ධය පටන් අරගෙන සතියෙන් දෙකෙන්ම ඇයව ලැගුම්හල්වලටයි, යාළුවොන්ගේ ගෙවල්වලටයි එක්කගෙන යනවා කියලා වැරදි ආරංචි මුළු කැම්පස් එක පුරාම පැතිරුණා. ඊට ටික කාලෙකට පස්සේ ඔහු අර දුවත් එක්ක කසාද නොබැඳ එකට ජීවත්වෙන්න පටන්ගත්තා. මම දන්න තරමින් එදා ඉඳන් තමයි ඇයගේ ජීවිතය අපායක් වෙන්න පටන් අරගෙන තියෙන්නේ. ඔහු ඇයව අසීමිත විදියට සැක කරලා පහර දෙන්න පවා පටන් අරගෙන තියෙනවා. අන්තිම පහත් විදියට ඇයට කතා කරන්න පටන් අරගෙන තියෙනවා.

ඊටපස්සේ දවසක් ඔය දුවව මට මුණගැහුනා. ඒ වෙලාවේ ඇය මට කිව්වා "සර් එදා මම පින්ගුත්තරයෙක් කියලා එළවගෙන තියෙන්නෙ මට ආදරය කරපු ගරු කරපු නියම පිරිමියාවයි" කියලා. ආන්න ඒ නිසා මම අපේ තරුණ දුවලට කියන්නේ කවුරුහරි පිරිමියෙක් ලස්සනට ඇඳ පැළඳගෙන තමන්ගේ ඉස්සරහට ඇවිල්ලා වැඩ කෑලි දානවා නම්, යාළුවෙලා දවසෙන් දෙකෙන් තමන්ගේ ගෞරවයට අත තියලා උගේ ගෞරවය රැකගන්න හදනවා නම්, රටේ ලෝකේ ඉන්න සේරම උන්ව පාවලා දිදී පද හදනවා නම්, තමන්ට ගරු කරන්න දන්නේ නැත්නම් ඒකා නියම පිරිමියෙක් නෙවෙයි කියන එක. එහෙම උන්ට කියන්නත් වෙන නිර්වචන ඕනතරම් තියෙනවා.

කතාව අවසානෙදි මගේ තර්කය වෙන්නේ ගෑනු පිරිමි ඉස්සරහදි උදුම්බරාවක් නොවෙන තරමටයි, පිරිමි ගෑනු ඉස්සරහදි පින්ගුත්තරයෙක් වෙන තරමටයි ඉතාමත් හොඳයි කියන එක.

■ **ලිහිණි මධුෂිකා**



# අරයාට එපා වුණාට අපිට නම් එයා රත්තරං



ක්‍රොකස් කියලා කඩවසම් නාවිකයෙක් හිටියා. දවසක්දෘ නැව කැඩිලා ක්‍රොකස් දූපතක් මැද අතරමං වුණා. පස්සේ ක්‍රොකස් ජීවත්වුණේ දූපතේ. දූපතේ ස්මිලැක්ස් කියලා කුමාරිකාවක් හිටියා. දවසක් දූපත ඇතුළට ගියාපු වෙලාවක ක්‍රොකස් ස්මිලැක්ස් කුමාරිව දැකලා ඈ ගැන හිතක් පහල කරගත්තා. ස්මිලැක්ස් කුමාරිත් සෙල්ලමට වගේ ක්‍රොකස් එක්කලා සම්බන්ධයක් පටන් අරන් ප්‍රේමාලිංගනේ යෙදුණා. ඔහොම යද්දි දැන් මේ සම්බන්ධය නවත්තන්න ඕනේ කියලා හිතපු ස්මිලැක්ස්, ක්‍රොකස්ව මඟඇරලා යන්න ගත්තා. කුමාරිය ගැන තිබුණු සැබෑම සෙනෙහස නිසා ක්‍රොකස් ඇයව ලුහුබැන්දෘ. ඒක ගැන කෝපවෙච්චි ස්මිලැක්ස් ක්‍රොකස්ව මලක් බවට පත්කළා.

ග්‍රීක පුරාවෘත්තවලට අනුව ක්‍රොකස් සැටිවස් (Crocus Sativus) මල බිහිවුණා කියන්නේ ඔහොමයි. ඔය ස්මිලැක්ස් කියන කුමාරි අකමැති වුණාට මොකෝ ක්‍රොකස් කියන්නේ ලෝකේ පුරාම ගෑනුන්ව පිස්සු වට්ටපු මලක්. ක්‍රොකස් කිව්වහම නොදන්නවා වුණාට කුංකුම, සැෆ්‍රන් කිව්වහම ක්‍රොකස්ව නොදන්න කෙනෙක් නෑ. මොකදෘ සැෆ්‍රන් නැත්තම් කුංකුම කියන්නේ ක්‍රොකස් මලේ රේණුවලට. මේව්වයේ මිල බොහොම වැඩියි. හැබැයි මිලටත් වඩා ප්‍රතිලාභ වැඩියි. ඔය කොයි හේතුවත් නිසා ලෝකේ ගොඩදෙනා ක්‍රොකස් රේණුවලට කියන්නේ රතු රත්තරං කියලා. ඉතින් අදෘ කතා කරන්නේ රතු රත්තරංවලින් ලස්සන වෙන හැටියි රත්තරං.

අර කලින් කිව්වේ පුරාවෘත්තයක්නේ. ඇත්තම සැෆ්‍රන් පුරාණේ අවුරුදු 3500කට එහා දිගයි. මුලින්ම සැෆ්‍රන් හොයාගෙන තියෙන්නේ පර්සියාවෙන් (අදෘ ඉරානය). පර්සියන් මිනිස්සු ලස්සන වෙන්න වගේම ඖෂධයක් විදියටත් සැෆ්‍රන් පාවිච්චි කරලා තියෙනවා. සරත් සෘතුවෙදි තැනිතලා බිම්වල ක්‍රොකස් පිපෙනවා. ඒ කාලෙට ගම්වල බවලත් උදව්යයි පුංචි ගෑනු දැරිවියොයි ඉහේ කරේ කූඩ එල්ලන් කුංකුම මල් නෙළන්න පෝලිමට යනවලු. පුංචි ගෑනු ළමයි ක්‍රොකස් මල් නෙළන පෞරාණික සිතුවමක් ග්‍රීසියෙනුත් හොයාගෙන තියෙනවා.

ඉන්දියාවේ කාශ්මීරෙත් ක්‍රොකස් පිපෙනවා. ඉතින් ඉන්දියාවේ මිනිස්සුත් අතීතේ ඉඳලම සැෆ්‍රන් පාවිච්චි කළා කියන්න සාක්ෂි තියෙනවා. නළලට කුංකුම තියන්නයි කුළුබඩුවක් සහ වර්ණකයක් විදියට කෑමට දන්නයි විතරක් නෙමේ රෙදි සායමටත් සැෆ්‍රන් පාවිච්චි කරනවා. ව්‍යාපාරයක් විදියට මුලින්ම සැෆ්‍රන් වවලා තියෙන්නේ ඉරානය. අදෘ නම් ඉන්දියාව, ඉතාලිය, ඇෆ්ගනිස්තානය, මොරොක්කෝව, චීනය, ජපානය, ප්‍රංශය, ඔස්ට්‍රේලියාව වගේ රටවල් කීපයක්ම ක්‍රොකස් වවනවා. එක ක්‍රොකස් මලක තියෙන්නේ සැෆ්‍රන් රේණු තුනයි. සැෆ්‍රන් කිලෝ එකක් හදන්න මල් 200,000ක් නෙළන්න ඕනේ. ඒකට විශාල මිනිස් ශ්‍රමයක් වැයවෙන නිසයි සැෆ්‍රන් ගණන්.

මිලටත් වඩා කුංකුමේ ප්‍රතිලාබ අමිලයි කිව්වනේ. ඕන් අහගන්නකෝ ප්‍රතිලාබ. සැෆ්‍රන්වල ක්‍රොසින් (Crosin), ක්‍රොසෙටින් (Crocetin), සැෆ්‍රනල් (Safranal), කෙම්ෆෙරොල් (Kaempferol) කියලා ප්‍රතිඔක්සිකාරක හතරක් තියෙනවා. මැරුණු සම ඉක්මනින්ම අලුත්වැඩියා කරලා තරුණබව වැඩි කරන්න ඔය ජාතිවලට පුළුවන්. හිරුඑළියෙන් සමට වෙන හානිය වළක්වන්න සැෆ්‍රන් කදිමයි. විටමින් C ඕසෙට නිසා සම පැහැපත් කරන්නත් පුළුවන්. ලප මකන්න, කුරුළෑ සුව කරන්න, හිසකේ වර්ධනය කරන්න විතරක් නෙමෙයි ශරීරයේ බර අඩු කරන්නත් ක්‍රොකස් රේණු යසයි.

ඔය කිව් රූපලාවණ්‍ය ප්‍රතිලාබවලට අමතරව මානසික ආතතිය, අධිරුධිර පීඩනය නැති කරන්නත් මිනිස්සු සැෆ්‍රන් පාවිච්චි කරනවා. ඇස් පෙනීම දියුණු කරන්න වගේම පිළිකා නාශකයක් විදියටත් සැෆ්‍රන් වැඩ කරනවා කියලා පරීක්ෂණවලින් හොයාගෙන තියෙනවා.

සැබෑම සැෆ්‍රන්වල මිල අධික වුණාට ලාබෙට සැෆ්‍රන් විකුණන අයත් ඉන්නවා. නොදන්නකමට ගොඩක් බවලතියෝ මේවා මිලේට ගන්නවා. හැබැයි කුණුකොල්ලෙට ගත්තු සැෆ්‍රන් පාවිච්චි කරනවා නම් එව්වා ෆේක් බව සහතිකයි නෝනේ.

කුංකුම රතු - දුඹුරු නැත්තම් රන් පැහැයට හුරු කහ පාටක් ගන්නවා. හැබැයි බැලූ බැල්මෙන් කෘත්‍රිම එව්වා හොයාගන්න අමාරුයි. කුංකුම රේණුවක් අරන් ටික වෙලාවක් පොඩි කළාම අත කහ/තැඹිලි පාටට හැරෙන්න ඕනේ.

කුංකුම පැණි රස නැහැ. දුම්කොළ, අමු වැනිලාවල වගේ කටුක රසක් තියෙන්නේ. රේණුවක් කාපුවාම පැණි රසක් එනවා නම් ඒක ෆේක්. සුවඳ ගත්තත් එහෙමයි සැෆ්‍රන්වල සුවඳ මිහිරි නෑ. තියෙන්නේ දුම්කොළවල වාගේ කටුක සුවඳක්.

වතුරට හරි කිරිවලට හරි මෙව්වා දාපුවාම දියවෙන්න විනාඩි 15ක්වත් යනවා. හෙමින් හෙමින් රේණුවේ පාට වතුරට කවලම් වෙනවා. පුදනකොටම කාපි යකා කියලා දාපු හැටියේ වතුර පාට ගැහුණා නම් ඒක කෘත්‍රිම එකක්. ඒ වගේම වර්ණය වතුරේ දිය වුණාට රේණුවේ පාට නැතිවෙන්නේ නෑ. රේණුවේ පාට සම්පූර්ණයෙන් මැකිලා සුදු පාට රොඩ්ඩක් ඉතිරි වුණා නම් එක බොරු.

දැන් බලමු සැෆ්‍රන් සත්කාර. ඉන්දියාවෙයි මැදපෙරදිගයි ගෑනු පුරුද්දක් විදියට සැෆ්‍රන් බොනවා. කිරි වීදුරුවකට සැෆ්‍රන් රේණු පහක් දාලා ඒක ඒක ශීතකරණයේ දාලා තියලා පහුවෙනිදෘ උදේම බොන්න. සමහරු නම් කිරි එකට සැෆ්‍රන් දාලා පැය බාගයක් වගේ ඉඳලත් බොනවා. ඔය කොයි ක්‍රමෙත් වරදක් නෑ. කිරි නැත්තම් වතුරට සැෆ්‍රන් රේණු හතරක් විතර දාලා තියලා බොන්න.

කුළුබඩුවක් නිසා කිරිබත්වලට, බත්වලට එකතු කරලා සැෆ්‍රන් ගන්න පුළුවන්. මී කිරි යෝගට් එක්කත් සැෆ්‍රන් කන්න පුළුවන්.

කෑමට වුණත් රේණු 5/6ක් ප්‍රමාණවත්. දවසට ගන්න පුළුවන් උපරිම ප්‍රමාණය 1.5g. අර ඕනම දෙයක් වැඩි වුණොත් වහ වෙනවා වගේ කුංකුම 5gට වඩා ගත්තොත් මැරෙන්න වුණත් පුළුවන්.

සැෆ්‍රන්වලින් සමට මේ බාහිර සත්කාර කරන්නත් පුළුවන්. යෝගට්, කිරි, මී කිරි ඔය ඕන එකකට සැෆ්‍රන් රේණු 4ක් දාලා පැය බාගයක් තියලා සමේ ගාන්න. විනාඩි 20ක් තියලා සෝදන්න.

කෝමාරිකාවලට කුංකුම රේණු හතර පහක් දාලා පැය බාගයක් තියලා ගාන්න. විනාඩි තිහක් තියලා සෝදලා දාන්න. කුංකුම, කිරි, ඔලිව් තෙල් එකට දාලා පැය බාගයක් තියලා ගාන එකත් සමට හොඳයි.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි





**සීතා පොන්නම්පෙරුම**
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

පාඩම් අංක 69

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**



# මං උන්දැට ඉලපත කැඩෙන්න ගැහුවා

ඕන් ඈත අතීතේ ගම්තුලාවක තරුණ අඹු-සැමි යුවලක් වාසය කළාලු. කාලයක් යද්දි මේ බිරිඳ ගැබ්බර වුණා. ගැබේ ඉන්න දරුවා ඉපදුණොත් සැමියාගේ ජීවිතේට අනතුරක් වෙනවය කියලා අනාවැකිකාරයෙක් සැමියට කිව්වා. අනේ ඔය කතාව ඇහැව්ව සැමියා ගෙදර ඇවිදිල්ලා බිරිඳගේ කුසට පහර දීලා දරුගැබ විනාශ කළාලු. ඒ වේදනාවයි දරු ශෝකෙයි එකට එක්කාසු වෙච්චි බිරිඳත් එතැනම මැරිලා ගියා. හැබැයි මේ බිරිඳ මැරෙන්නේ ස්වාමියා ගැන වෛර බැඳන්. ගෙදර මනුස්සයාට විතරක් නෙමේ මුළු පිරිමි සංහතියටම ද්වේශ කොරාපු මේ ගැබ්බරී බෝදිලිමෙක් වෙලා හැන්දෑ කරුවල වැටෙද්දි ගෙවල් ගානේ යන්න ගත්තලු, ගෙදර පිරිමියව ඩැගැගන්න.

ගෙවල්වල පිරිමින්ට බෝදිලිමාගෙන් බේරෙන්න උදව් කරන්න පුළුවන් එකම එක උපකරණෙකට විතරයි. ඒ තමයි ඉලපත. බෝදිලිමා කෑගහද්දි ගෙදර බවලතී ඉලපත අරන් එළිපත්තට බැහැපු හැටියේ බෝදිලිමා අන්තුරුස්දන වෙනවලු. මේක මේ ළඟක් වෙනකලුත් අපේ ගම්වල මිනිස්සු විශ්වාස කළ කතාවක්.

බෝදිලිමා කොච්චර යකිනියක් වුණත් ඉලපතට බය වෙච්චි එකයි වැඩේ. ඉස්සර මිනිස්සු ගේ ඇතුළ වගේම වතුපිටි අතුගාන්න පාවිච්චි කළේත් ඉලපත. අතුගාන්න පාවිච්චි කළාට මොකෝ එදා බවලතියන්ගේ හොඳම ආරක්ෂකයා වුණේ ඉලපත. ඉස්සර ගම්තුලානේ ගෑනු අනංග පිරිමින්ගෙන් ආරක්ෂා වෙන්න පාවිච්චි කරලා තියෙන්නේ ඉලපත. "මං උන්දැට ඉලපත කැඩෙන්න ගැහැව්වා" කියලා කතාවටත් කියන්නේ.

ඉලපතෙන් පස්සේ මිනිස්සු ගෙවල් අතුගාන්න පාවිච්චි කළේ කොස්ස. මිදුලට ඉදල. 1950 ගණන්වල වගේ ඉඳලා අපේ රටේ උදවිය ඉදල් කොසු පාවිච්චි කරලා තියෙනවා.

දැන් කියන මේ සිද්ධිය වුණේ 2018දී. අනුරාධපුර පැත්තේ අවුරුදු හතක දියණියක් මිදුල ඉස්සරහා සෙල්ලම් කර කර ඉඳලා. දරුවගේ අම්මාත් ඒ ළඟම මිදුල අතුගාමින් හිටියලු. ඔන්න එකපාරටම වගේ ඉහළ අහසේ හිටපු උකුස්සෙක් දරුවගේ ඔළුවට වහලා ඔළුවට හොටයෙන් කොටන්න හදලා. එවේලේ අර අම්මා උකුස්සට ඉදලෙන් ගහලා දරුවව බේරගෙන. ඕන් බලන්නකෝ ඉස්සර ඉලපත වගේ අදත් ඉදල් කොසු මිනිස්සුන්ගේ ආරක්ෂකයා වෙන වෙලාවල් නැතුවම නෙවේනේ.

ගෙදරක අත්‍යවශ්‍යම බඩු ලැයිස්තුවකට දන්න කිව්වොත් ඉදල කොස්ස නැතිවම බෑ. ඉදලක් කොස්සක් නැති වුණොත් ගෙයක් දෙරක් අපූරුවට තියෙයි. ගෙදරකට විතරක් නෙමෙයි පන්සලකට සංඝයාට දානයක් දුන්නත් පිරිකර සම්පූර්ණ වෙන්නේ ඉදල කොස්සෙන්. ඉතින් හැමගෙදරකටම නැතිවම බැරි ඉදල් කොසු හදන හැටි ස්වයං රැකියා පාඩමෙන් කියලා නොදී කොහොමද?

ලිපිය දිග වැඩිවෙන නිසා ස්වයං රැකියාවක් විදියට ඉදල් හදන හැටි අද බලමු. කොසු ගැන කතාව ඊගාව සතියට.

ඉදලක් හදන්න අමුද්‍රව්‍ය ගන්න ලොකු මුදලක් වැයවෙන්නේ නැහැ. ඉතින් සුළු මුදලක් වැය කරලා ලාබ ලබන්න මේක හොඳ ව්‍යාපාරයක්.

එක ඉදලක් හදන්න සුද්ද කරගත්තු ඉරටු 700gක් අවශ්‍යයි. පොල් අතු 3කින් ඉරටු 700gක් ගන්න පුළුවන්. හැබැයි ගන්නකොට පොල් අත්තේ අයින්වල තියෙන ඉරටු ගන්න එපා. මැද තියෙන ශක්තිමත් එව්වා විතරක් ගන්න. තොග වශයෙන් ඉරටු මිලට දෙන උදවියත් ඕන හැටියට ඉන්නවා.

ඊගාවට අඟල් 1/2 පළල, අඟල් 7ක් දිග තහඩු පඩි/බෙල් පටි 2ක්, රිවට් ඇණ, අඟල් 1 1/2 ඇණ 4ක්, අඟල් 1 1/4 ඇණ ටිකක්, මිටියක්, ප්ලාස්ටික් දිගටි වළල්ලක්, ලී රාමුවක්. තලන්න රේල් පීල්ලක් වගේ යකඩයක් සහ ලී මිටක් අවශ්‍යයි. සැහැල්ලු ලී වලින් හැදුව ඉදල් මිටි තොග වශයෙන් ගන්න තියෙනවා.

අර අවශ්‍යයි කිව්ව ලී රාමුව වෙළඳපොළෙන් මිලදීගන්න පුළුවන්. එහෙම නැත්නම් ඒක මේ විදියට ගෙදරදිම හදාගන්න. අඟල් 1 1/2ක් පළල අඟල් 18ක් දිග රීප්ප පටි දෙකක් ගන්න. එක පැත්තකින් පියනක් වගේ අරින්න වහන්න පුළුවන් විදියට තහඩු කෑල්ලක් හයි කරන්න. අනෙක් පැත්තේ කෙළවර හිලක් විදලා බෝල්ට් ඇණයක් දාලා නට් එකක් හයි කරගන්න.

හරි දැන් වැඩේ පටන්ගමු. අඟල් 7 තහඩු කෑලිවල දෙකෙළවර හිල් විදලා රිවට් ඇණවලින් කොන් යා කරලා රවුම් දෙකක් හදාගන්න.

පස්සේ ඉරටු එක මිටට අරගෙන මහත පැත්ත එක මට්ටමකට තියලා හදාගත්තු රවුම් දෙක පරතරයක් ඇතිව රිංගගන්න.

ඔය අතරේ ලී මිට යටින් උල් කරලා තියාගන්න. උල් කරගත්තු ලීය අර කලින් රවුම් දාලා හදාගත්තු ඉරටු මැදින් රිංගවන්න. ලීය රිංගවන්න හිර වැඩි වගේ නම් මැදින් ඉරටු ටිකක් අයින් කරන්න. හැබැයි කිසිම වෙලාවක මේක ගොඩක් ලූස්වට තියාගන්න එපා. ඒකෙන් ඉදලේ ප්‍රමිතිය මුළුමනින්ම නැතිවෙනවා.

ලීය රිංගවලා මිටෙන් බිමට ගහන ගමන් ලීය සෙට් කරගන්න. තහඩුවට ලීය අහුවෙන විදියට තියලා උඩිනුයි යටිනුයි 1 1/2 ඇණ ගහන්න. ඉරටු අවශ්‍ය දිගට එකගාණට තියලා ඉතිරිය කපන්න.

දැන් ඉරටු විහිදවන ගමන් ලී රාමුව තියලා නට් එකෙන් තද කරන්න. මේ විදියට තද කරාපුවහම ඉරටු නොසෙල්වෙන්න තදට තියෙන්න ඕනේ.

දැන් ඉදල කෙළින් හිටවලා මැද ඉරටු ටිකක් ඇරලා දෙපැත්තේ ඉරටු ටික උපරිම ශක්තියෙන් දෙපැත්තට නවලා ටිකෙන් ටික අත අරින්න මෙහෙම කරාපුවහම පාවිච්චියේදී ඉදල හසුරවන්න ලේසියි.

හදාගත්තු ඉදලට ප්ලාස්ටික් වළල්ල දාලා 1 1/2 ඇණ ගහන්න. එක පැතත්කින් ගහන ඇණ අනෙක් පැත්තෙන් ආපුවහම ඇණය නවන්න.

ලී රාමුව ගලවන්න. මිටේ උඩ එහෙම හොඳට පරීක්ෂා කරලා වෙළඳපොළෙට දාන්න.

මෙහෙම හදාගත්තු ඉදලක් දැන් රුපියල් 300 වගේ ඉඳලා මිල කරන්න පුළුවන්. කපලා ඉතිරිවෙන පොඩි ඉරටුවලින් පුංචි ඇයොන්ට සෙල්ලම් ඉදල් හදලා තවත් ආදායමක් හොයාගන්නත් බැරි නැහැ. ඉදල් නිෂ්පාදනය ගැන තවත් මොනවාහරි දැනගන්න තියෙනවා නම් 0714766819 අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි













# කවි යාය

සංස්කරණය **ලිහිණි මධුෂිකා**

## තවම ඔබ 'මනමෙ කුමරිය'

කුමරිය
ඔබ 'මනමෙ කුමරිය'

එතෙක්
මෙතුවක්
දනන් තුඩගෙහි
රැඳුන'යුරු
'මනමෙ කුමරුන් - කුමරිය'

නොකිව් නොකියන
නොලිව් නොලියන
කිසිවකුදු
කිසි දින
'වැදි රජෙකු රැජිනකැ'

ඔබ සමග එන කල
දිනා ආවෙමි
මහා විජිතය මා සතු
ප්‍රේමයෙන් මන රංජිත

කවුරුන්ද බිඳ හළෝ
සුබැඳි එක් සිත
දෙසිත් කොට

කෙළෙසින්ද නැගුණේ
මේ දුර
දෙසිතක

හෙළා කගපත
ගෙල මත
දිවි තොර වන්ට පෙරම
මට ම මා අහිමිව

**චමින්ද රොෂාන්**

## පාපොච්චාරණයක්

මන්තිරි වලව්වේ බැල මෙහෙ කෙරුවාට
ලැබුණේ නුඹය පඩි නඩි හෙම නැතුවාට
වැව් පිටියක නුඹ අතහැර දැමුවාට
දියණිය සාප නොකරන් මේ අම්මාට

ගතේ රුහිරු කිරි කරලා පොවන්නට
වතේ පිපෙන මල් හසරැලි බලන්නට
පුතේ කියා කිරිකැටි මුව සිඹින්නට
නැතේ අපට ඉඩ එකතුව වසන්නට

කැපුවත් පාර මට මහමග තනි වෙන්ට
කවුරුත් නොමැත මේ නිරයෙන් ගොඩගන්ට
ගල්මුල් උරුම ලොව අසරණ ගැහැනුන්ට
කිළුටක් නොමවේය පින් කළ මහතුන්ට

දහ මාසයක් විඳි දැඩි දුක කුරිරු ලොවේ
මහමෙර සමඟ වුව සමකළ හැකිද නොවේ
යහ ගුණ රැඳුන ලොවකදි දිනෙක මතු භවේ
සහ ජාතකව මගෙ කුසටම වඩින් දුවේ

**ජේ.සිල්වියා පෙරේරා**
**මිලේනියම් සිටි**
**කොටුගොඩ**

## කවියක හොරයක්!

මගෙ කවි පදරුත් විමසා
කිසිවෙකු බැලුවෝතින් හෙම
ඔබ පමණයි එහි ඉන්නේ
සඟවන්නට බැරිවෙයි පෙම

කුමක් කරන්නද නොදැනේ
ඔබමය මේ සැමතැනම
පත්ඉරු අතරෙහි සැඟවී
ඉඟි පා මා කරයි පුදුම

කඳුළු අතර හිඳ හඬමින්
සිනහවක සලා දෙලවන්
හිත මුල්ලක සැඟව ඉඳන්
නින්දද මගෙ හොරෙන් අරන්

සැඟවිය යුතු ලොවෙන් ඔබව
එබෙන්නැතුව ඉන්න ඔහොම
පියඹා ඔබෙ ළඟට එන්න
තටු සවිමත් නැනෙ තාම

**මුදිතා පෙරේරා**
**පානදුර**

## උරුම කරුම


ගල්කොරියේ නිතර ඇසෙනා හෙණ හඬට
හුරුවී නුඹත් නංගියෙ යන මුත් වැඩට
නැහැ නොවැ නේද වැටුණේ අරහක් බඩට
මොනවා කරන්නද පූරුවෙ කළ පවට

තිස්සෙම දවසෙ ඉඳගෙන පොල් අත්ත යට
ඇස් දෙක රිදුම් දෙනතුරු අව් රශ්මියට
ඉස් පාසුවක් නොමැතිව ද මුගුරු කැට
අස් වැසුමක් ඇත්ද හෙලුවත් කරුමයට

අතු පැල වෙතයි දුක් කරදර ඇදෙන්නේ
නෙතු අග නිතර කඳුළැලි බිඳු හැලෙන්නේ
සතුටින් නැතත් අපි දිවි මග දුවන්නේ
ගතු කියවන නෙවෙයි කරුමෙයි ගෙවන්නේ

**කේ. බස්නායක**
**ඉඳුනිල්වත්ත**
**කුලියාපිටිය**

## සෝගිනි



විහින් කරගත් දෙයට
දිග පළල පෙනෙනවිට
නැගෙන සෝගිනි පතුල යට
කියන්න අහන්න කෙනෙක් අද නෑ මට

**එච්.එම්.එච්.ජී. හේරත්**
**හීලෝගම**

### කවි යාය

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.**

''කවි යාය''
'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,විජේරාම මාවත,කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න


**ලගදීම කෝට්ටේදී**
**නවක කේක් පංති ආරම්භ කිරීම**
මෙහෙයවීම- R.L. ක්ලෙමන්ට් මහතා
ශා.තෝමස් දේවස්ථානය - මීසම් ශාලාව මැයි මස 23 වෙනිද
උපන්දින කේක් - කේක් සෑදීම සහ කේක් සැරසීම.
දින 10 ක් හෝ සතියකට වරක් මාස 03 යි
අයිසිං මල් පාඨමාලාව - දින 10 මල් වර්ග 20 යි.
එංගලන්තයේ PME Knigtbridge ආයතනය පිරිනමන අයිසිං මල් සඳහා ඩිප්ලෝමා සහතිකය සමග R.L. ක්ලෙමන්ට් පාසැලෙන් පිරිනමන සහතිකය දෙනු ලැබේ.
අව්වට වැස්සට දිය නොවන විශේෂ පේස්ට් (Paste) එක කියා දෙන ලැබේ.
පහත සඳහන් ස්ථානවල නවක සිසුන් බඳවා ගනු ලැබේ.
(පෙ.ව. 9.00 සිට ප.ව 12.00 දක්වා)
මැයි 14 කොළඹ 106/14 වෝල්ස් පටුමග කොළඹ 15
මැයි 18 මහබාගේ නො.15 ලින්ටන් පාර නාගොඩ
මැයි 20 මහනුවර පුෂ්පදාන සමිති ශාලාව ඩී.ඇස්.සේනානායක වීදිය
මැයි 23 කෝට්ටේ ශා.තෝමස් දේවස්ථානය (මීසම් ශාලාව)
විමසන්න - 0112249607 / 011 2522201

**උගස් තැබූ රත්තරං**
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහල මිලක්
076 101 88 53
SL PROMO

**සංවර්ධිත බැංකු ඇබෑර්තු**
★ බලපත්‍රලාභී අලුතින් විවෘත වූ බැංකු කිහිපයක් සඳහා ප්‍රාදේශීය මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.
මුළු 40,000/-
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)
0716 434 278 | 0703 346 072
0702 725 731 | 0774 024 155
0718 853 997 | 0715 947 191

**ආදරණීය දෙමව්පියන්ට රැකවරණය**
ඔබගේ ආදරණීය දෙමව්පියන්ට සතුටින් කාලය ගත කිරීමටත් නිවසකමෙන් පහසුකම් සහිතව
විශ්‍රාමික දිවිය ගතකිරීමටත් අපගේ වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථානයේ
ඉඩ පහසුකම් ඇත
සාධාරණ අයකිරීම්
විස්තර සඳහා අමතන්න
0703202068 0764818618

**Gemmology**
**රත්න විද්‍යාව**
විද්‍යාත්මක සාධක තුලින් මැණික් හඳුනා ගැනීම, උපකරණ භාවිතය, පතල් කර්මාන්ත පිළිබඳ පුහුණු ගුරුවරයෙකු විසින් කුඩා කණ්ඩායම් ලෙස හෝ තනි තනිව උගන්වනු ලැබේ.
කාන්තාවන් සඳහා විශේෂ පන්ති
077 22 43 222

**A/L Physic Theory + Rivision + Paper Classes**
වසර 04ක් උගන්වා පළපුරුදු සහිත කොළඹ විශ්වවිද්‍යාලයේ සිසුවෙකු විසින් තනි හා කණ්ඩායම් පන්ති සඳහා නිවසට පැමිණ විශිෂ්ඨ ප්‍රතිඵල ලබා දීමට වගකීමක් සහිතව සරලව මෙන්ම පැහැදිලිව ඉගැන්වීම සිදු කරයි. අතපසු වූ විෂය කොටසක් ද ආවරණය කොට විශිෂ්ඨ ප්‍රතිඵල අපේක්ෂා කරන සිසුන් හට විශේෂයි. කළුතර හා කොළඹ දිස්ත්‍රික්යේ අය පමණි.
(Online මුළු දිවයිනටම)
යසිරු සංජන: 0715 249 556

**ඔබත් කෙට්ටුද?**
ස්ත්‍රී/පුරුෂ
ලි.ප.අ.7853
ඔබගේ කෙට්ටුව නැතිකර පිරිපුන් පැහැපත් පෙනුමක් ලබාගැනීමට අතුරු ආබාධවලින් තොර අපගේ ප්‍රතිකාර ....
**පැමිණ** හෝ **තැපැල්** මගින් ලබාගන්න.
විමසීම් : 0774227503
අධික තරබාරුව, පොතු කබර, පුරුෂ රෝග පැමිණ ප්‍රතිකාර ලබාගත හැක.
(උදේ 9.00 - සවස 4.00)
**දේශීය ඖෂධාලය, මිරිස්වත්ත, ගම්පහ.**
පෝය, බදාදා සහ බ්‍රහස්පතින්දා වසා ඇත.
❖ දුරකථනයෙන් කාලය වෙන්කර පැමිණෙන්න.

ධරණී
ලිබර්ටි පබ්ලිෂර්ස් පුයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 07. දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය 0112 127204
දැන්වීම් අංශය 0112672601, 0112672603, 0761393811
ෆැක්ස් 0112 673 451

ධරණී
පුවත්පත නිවසටම
ගෙන්වාගන්න අමතන්න
076 1367 623

මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්
විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.
නැතහොත් ලිපියක් මගින් විමසන්න.
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?
ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?
අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?
මෙන්න!
එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම
* නිවාස ආරක්ෂා
* නඩුහබ දිනීමට
* දරුඵල ලබීමට
මත්කුඩු සහ සුරාව
* රැකියා ලබා ගැනීමට
* සියලු විභාග සඳහා
* නොවිකිණෙන ඉඩම් විකිණීමට
*විවාහ පමා අයට
*නැරගිය අය ගෙන්වීම
*අසාර්ථක ව්‍යාපාර දියුණුවට

මාතර වෙද හාමුදුරුවෝ
ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යකට
ඇබ්බැහි වූ අයෙක් ද?
එසේ නම් ඉන් මිදීමට අමතන්න.
වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න
අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර
චන්ද්‍රසේල පිරිවෙන්
පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත මාතර වෙද හාමුදුරුවෝ
භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

විද්‍යාව ගණිතය 6 - 11 ශ්‍රේණි සඳහා
තනි හෝ කුඩා කණ්ඩායම් පන්ති
සාධාරණ අයකිරීම් යටතේ මෙහෙයවීම
පළපුරුදු විද්‍යා උපාධිධාරි ගුරුවරයකු විසින්
Bsc. University of Colombo
සිංහල මාධ්‍ය ඉංග්‍රීසි මාධ්‍ය පන්ති සඳහා
කොළඹ, ගම්පහ, මහරගම, කොට්ටාව,
නුගේගොඩ, කළුතර, කඩුවෙල, අවට්න් විමසන්න.
නිබන්ධන හා ප්‍රශ්නපත්‍ර ලබාදෙයි
විමසීම් : 0705 321 553

උගස් රත්තරන්
සින්නවීමට යන රන් භාණ්ඩ අප ආයතනය
විසින් ඔබ උගස් කළ ආයතනය පැමිණ බේරා දී
පොරොන්දු වූ මිලටම මිලදී ගනු ලැබේ.
දිවයින පුරා සේවාව,
බොරුවලට නොරැවටෙන්න
පවුම - 185,000/-
077 457 3003

කුළුබඩු නිෂ්පාදන සඳහා ප්‍රායෝගික පුහුණු වැඩමුළුව.
- කුළුබඩු නිෂ්පාදන ව්‍යාපාරයක් ලෙස ආරම්භ කරන්නේ කෙසේද?
- වෙළඳපොල තෝරාගැනීම.
- ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේදී සැලකිලිමත් විය යුතු කරුණු.
- කුළුබඩු නිෂ්පාදනයේ විධිමත් ක්‍රියාවලිය.
- ඇසුරුම්කරණය සහ ලේබල්කරණය.
- යන්ත්‍ර සූත්‍ර හා උපකරණ භාවිතය.
- පිරිවැය හා මිල ගණනය.
- පවත්වාගෙන යාම, පුළුල් කිරීම සහ ගැටළු නිරාකරණය.



වැඩි විස්තර සඳහා 076 205 3799 | 074 124 1764
261/1, වතුමුල්ල හංදිය, උඩුගම්පොල
දිනය 2023 මැයි 28
වේලාව උදේ 8.00-5.00
සැ.යු. එක් පුහුණු වැඩමුළුවක් සඳහා සීමිත ප්‍රමාණයක් බඳවා ගනු ලැබේ.
මෙහෙයවීම:
ප්‍රවීණ සම්මානලාභී ව්‍යවසායක
දිලූෂි උඩුමුල්ලගේ
දිලූෂි ප්‍රඩක්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂිකා.
ආහාර තක්ෂණය, අලෙවිකරණය.
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධි අපේක්ෂක.
සඳමිණි මෙන්ඩිස්
අලෙවිකරණය සහ උපදේශනය පිළිබඳ උපාධිධාරි
2018/2019 අඛණ්ඩව වසරේ හොඳම ව්‍යවසායක සම්මානලාභී ආයතනය

ඔබගේ දරුවා මෙවර අපොස සා.පෙ/උ.පෙ/ ශිෂ්‍යත්වය
විභාගවලින් ඉහළින්ම සමත් කරන්නේ කෙසේද? අදම අමතන්න
- අයුතු සම්බන්ධතා නවතා ගැනීමට නොහැකිද?
- පෙම් සම්බන්ධතා බිඳ වැටී ඇත්ද?
- විවාහය ඉක්මන් කරගන්න
- ආර්ථික අපහසුතා මැද්දේ රැකියාවක් ලැබෙන්නේ නැද්ද?
- ව්‍යාපාර කඩා වැටුණාද?

උපන් දිනය සහ වේලාව
සමඟ අමතන්න
071 031 4878

ජාත්‍යන්තර කීර්තියට පත් ගුප්ත
විද්‍යා විශේෂඥ සද්ධර්ම කීර්ති ශ්‍රී ජෝර්ති
විද්‍යාගුර විහාරාධිපති
අති පූජ්‍ය වේරපිටියේ ඥාණිස්සර වෙද හාමුදුරුවෝ
පුරාණ විහාරය වේරතැන්න, වේරපිටිය.



මාගේ දරුවාගේ විභාගයෙන් විශිෂ්ඨ ලෙස සමත් කරදුන් නිසා රත්නපුරයේ සමන්ති කුමාරි විසින් මෙම දැන්වීම පළ කරන ලදී

# ඈ වසරයි

බියංකා නානායක්කාර ලියයි

122 කොටස



## මට ඕනි කෙනා මං තෝරගෙන ඉවරයි අප්පච්චි

තේනුක තෙන්නකෝන් මැති ඇමතිවරුන් ඇසුරු කරන බවක් අංජනා ඇල්ලේපොල මෙතෙක් දිනක් දැන සිටියේ නැත. ඔහුගේ පියා දේශපාලනය කරන බවක් සහ මන්ත්‍රීවරයෙක් කියා ඔහුගෙන්ම අසා තිබුණත් මෙතෙක් දිනක් නම් ඒ කවුදැයි කියාවත් දැනගැනීමේ උවමනාවක් නොවීය. පණිවිඩය කී තරුණයා වීදුරු දොර ඇරගෙන පිටව ගියත් පැමිණි බව කී ඇමතිවරයා හමුවන්නට යන්නට තේනුකට එතරම් හදිස්සියක් නැති ගානය. වෙනදා තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා ඉඳහිට හෝ මේ අසළින් යද්දී සාප්පුව ළඟට පැමිණ කතා කර යෑම සාමාන්‍ය දෙයක් වුවත් අද ඔහුගේ ආගමනය තේනුකගේ හිතේ ප්‍රශ්නකාරීබවක් ඇති කළේය. ඒ පෙරදා රැයේ වූ දුරකතන කතාබහ ආසන්න සිදුවීමකොට සිතුණ නිසාය. මේ මොහොතේ ඒ ගැන කතාබහට ආවොත් ඕනෑ දෙයක් වන්නට කියා අංජනා ගැන තෙන්නකෝන් බණ්ඩාරට කියන්නට ඔහු සිතාගත්තේය. තේනුක කවුන්ටරයේ මෙහා පසින් ගොස් අංජනාගේ මුහුණ ඉදිරියෙන් සිටගත්තේය.

"මං පොඩ්ඩකට එළියට යනවා. මං කතා කළොත් ඔයත් එන්න ලෑස්තියෙන් ඉන්න."

තේනුක තෙන්නකෝන් කී දෙයට පුරුදු ලෙස ප්‍රශ්න කිරීමකින් තොරව හිස වැනුවත් ඇත්තටම අංජනාගේ හිතේ ප්‍රශ්නයක් ඉතුරු වුණේය. ඒ ඔහු යන්නේ කොහේද කියාය. ඒ මොහොතේ ඇයට තේරුම්ගියේ ඔහු සාප්පුවෙන් පිටතට යන බවක් නොව පැමිණියවුන් සමඟ කොහේ හෝ යන බවය. අඩුතරමේ ඔහු යන්නේ කොහෙද කියා හෝ ගියානම් කියා අංජනාට සිතුණි. ඈ ඒ සිතුවිල්ලෙන්ම වීදුරු දොරෙන් පිටව ගිය තේනුක පස්සෙන් ඇස් තබාගෙන සිටියාය. මොහොතකට පෙර සාප්පුව තුළට පැමිණි තරුණයා වන් තරුණයන් දෙදෙනෙකු සාප්පුව ඉදිරියේ නවතා ඇති සුපිරි ජීප් රිය ආසන්නයේ ඇවිදිමින් සිටිනු අංජනාට පෙනුණි. ඒ පැමිණි බව කී ඇමතිවරයාගේ ආරක්ෂකයින් කියා ඇයට තේරුම්ගියේ ඒ මොහොතේය. තේනුක ගොස් නැවතුණේ ඒ ජීප් රිය ළඟයි. අංජනාගේ ඇස් බලා සිටියේ දැන් දැන් ඔහු ජීප් රියේ ඇරෙන දොරකින් ඊට ගොඩ වෙතැයි කියාය. ඒත් එසේ වූයේ නැත. ජීප් රියේ පිටුපස කොටසේ ඇරුණ වීදුරුවෙන් ඇතුළෙ සිටිනා කෙනෙකු හා ඔහු කතා කරනු පෙනුණි.

අංජනා ඇල්ලේපොල දන්නා තේරෙන කාලයේ පටන් දේශපාලනයට අකමැත්තක් දැක්වූ කෙනෙකි. මේ නිසා අධ්‍යාපන ඇමතිවරයා හැරෙන්නට පාර්ලිමේන්තුවේ ඉන්නා මැති ඇමතිවරුන් කවුරුන්ද කියා රූපෙන් තියා නමින්වත් ඇය හඳුනන්නේ නැත. ඒ නිසා මේ පැමිණ සිටින්නේ කවුද කියාත් රූපය දුටුවත් ඇය හඳුනන්නේ නැත.

ඇරුණු රිය කවුළුවෙන් තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා තේනුක හා පුළුල් සිනාවක් පෑවේය. ඔහුගේ ඒ සුපුරුදු සිනාව දැකීමත් ඒ සමඟ තේනුක සිතේ පියා හා තිබූ නොමනාප ගති දියව ගියද සියුම් පසුතැවිලි සහගතහැඟීමක්ද ආවේය. ඒ පෙරදා රැයේ ඔහුට කතා කළ තදබවේ වචන මතක් වීය.

"අප්ප්ච්චි කොහේ යන ගමන්ද?"

වෙනදටත් ඔහු එන්නේ තව ගමනක අතුරු ගමනක් නිසා තේනුක පුරුද්දට ඇසුවේය.

"කොහේවත් නෙවේ, පොඩි පුතා හම්බවෙන්නමයි ආවෙ."

තේනුක උඩ බැලුවේය. තෙන්නකෝන් බණ්ඩාරගේ ඒ උත්තරය ඔහු බලාපොරොත්තු වූවක් නොවේ.

"ඇයි අප්පච්චි..?"

"මට පොඩි පුතත් එක්ක ටිකක් කතා කරන්න ඕනෑ..."

"ඉතින් කෝල් එකක් දෙන්න තිබ්බනෙ අප්පච්චි."

හිත ඇතුළෙන් නොසන්සුන්වෙමින් වුව තේනුක තෙන්නකෝන් කීවේ වෙනසක් නොපෙන්වමිනි. ඊට තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා මහ හඬින් සිනාසුණේය. ඒ සිනාව තේනුකට තේරුම්ගත නොහැකි විය.

"ඇයි අප්පච්චි හිනාවෙන්නෙ..?"

"හිනාවෙන්නේ... ඔයත් එක්ක පුළුවන්ද ටෙලිෆෝන් එකෙන් දෙයක් කතා කරන්න... දැක්කනෙ ඊයෙ මට කෑගහලා ටෙලිෆෝන් එක තිබ්බා..."

"සමාවෙන්න අප්පච්චි..."

"හරි හරි... ඔයාට ඒ වෙලේම මං සමාව දුන්නා... අපි යමුද පොඩ්ඩක් එළියට..?"

ඒ ඇරයුම එතරම් සුබදායක නැති බව තේනුකගේ හිත කීවේය. ඒ නිසා මේ මොහොතේ ඒ අවස්ථාව මගහරින්නට ඔහු සිතාගත්තේය.

"මං හවසට ගෙදර එන්නම්. අද මං සාප්පුවේ ඉන්නම ඕනි. දවස් ගාණකින් මේ ආවෙ."

"ගෙදර ඇවිත් ඕවා කතා කරන්න බෑ. අනික මට ඔයත් එක්ක තනියමයි කතා කරන්න ඕනි..."

"කතා කරන්නම ඕනි නම් මෙහෙම කතා කරමු..."

තේනුක කීවේ රිය බඳට දෑත තබමිනි. තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා කල්පනාවෙන් හිස වැනුවේය. ඔහු තේනුකට රියට නගින්නට ඇරයුම් කළත් තේනුක ඒ ඇරයුම ප්‍රතික්ෂේප කළේය. දේශපාලනයට නාවට තේනුකටත් තමන්ට සේම ඔළුවෙන් වැඩ කිරීමේ හැකියාවක් ඇතැයි තෙන්නකෝන් බණ්ඩාරට හැඟිණි. ඒ හැකියාව මේනකට බිංදුවක්වත් පිහිටා නැත. ඒ නිසා හැම ප්‍රශ්නයක් ගැටලුවක්ම විසඳගන්නවා වෙනුවට ඔහු කරගන්නේම හත්පොළේ ගාගන්නා එකය. දේශපාලනයට බලෙන් හෝ ගන්නට තිබ්බේ මේනක නොව තේනුක කියා මුල්ම වතාවට තෙන්නකෝන් බණ්ඩාරට සිතුණේය.

"ඊයෙ මං පුතාට කියපු කාරණේ ගැන හිතුවද?"

"මං ඒකට උත්තරේ ඊයෙම අප්පච්චිට දුන්නනෙ. හිතට අකමැති දේවල් ගැන මං මතක් කර කර හිතන්නෙ නෑ..."

"ඔයා බඳින්න හිතන් ඉන්නෙ චතුමිණීද?"

තෙන්නකෝන් බණ්ඩාරට දිය යුතු උත්තරය තත්පරයෙන් මුව අග රැඳුණත් තේනුක තෙන්නකෝන් එය මුව තුළම සිරකරගත්තේය. ඒ නිහඬතාවයේ වාසිය ගත් තෙන්නකෝන් බණ්ඩාර දිගටම කතා කළේය.

"ඔයාට හරියන්නේ චතුමිණී වගේ කෙනෙක් නෙවේ, දිව්‍යා වගේ දේශපාලන ව්‍යාපාරික ලෝකෙ හොඳ සම්බන්ධකම් තියෙන කෙල්ලෙක්. අනික ඉතින් ඔයා චතුමිණී බැන්දෙත් හිරේ වැටුණා වගේ තමා පුතෝ... දන්නවනෙ නිශ්ශංකගෙ හැටි... ගමට ගිහින් වතුපිටි බලාගෙන ළමයි හදගෙන ඉන්න පුළුවන්..."

තේනුක පියාට කතා කරන්නට දී ඔහු කියන්නක් අසා සිටියේය. සමහරවිට ඒවායින් නොදන්නා දෙයක් දැන ගන්නටද පුළුවන් වෙතැයි ඔහු සිත කීවේය.

"නිශ්ශංකයි මැණිකෙයි චතු දුව අපේ ගෙදර ගෙනැත් නැවැත්තුවේ ඕකට කියලා මට නම් එදම තේරුණා. ඔයාගෙ අම්මත් ඉතින් මල්ලිගෙ වැඩවලට සපෝට් නේ... ඒ මදිවට ටෙලිෆෝන් සාප්පුව ළඟම සැලෝ එකකුත් දලා දුන්නා. බිස්නස් කරන්න පුළුවන්ද මේ කොළඹ කරන්නන් වාලේ..."

"අප්පච්චිට වැරදිලා..."

තේනුක තෙන්නකෝන් කට කොනකින් සිනාසෙමින් කීවේය.

"මට වරද්දන්න ගොඩක් අය දඟලනවා. මට එහෙම වරද්දන්නත් බෑ, මාව පරද්දන්නත් බෑ..."

තෙන්නකෝන් බණ්ඩාර කීවේ අභිමානවත් හැඟීමෙනි. ඔහු කෙරෙන් මුදවාගත් නෙත තේනුක පාර ළඟ තිබ්බේය. නතර නොවී එකදිගට වාහන වැළ නොකැඩී කොළඹ දෙසට ඇදෙයි. එය පාසල් ඇරෙනා වේලාව නිසා ඇතිවන සුපුරුදු වහන තදබදයයි.

"මට ඕනි කෙනා මං තෝරගෙන ඉවරයි අප්පච්චි. හැබැයි ඒ චතුමිණී නෙවේ..."

එය ඇසුණු සැනින් තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයාගේ මුහුණේ පෙනුම වෙනස්වෙනු තේනුක දුටුවේය.

"කවුද එයා..?"

මොහොතකින් ඒ ප්‍රශ්නය එන බව තේනුක දැන සිටියේය. ඒ නිසා ඒ වනවිටත් හිත ඇතුළේ ඒ ප්‍රශ්නයට උත්තරය පේවී තිබුණේය.

"එයා මේ පැත්ත පළාතටවත් සම්බන්ධයක් නැති කෙනෙක්. අප්පච්චිට ඕනි නම් මං දැන් එයාව පෙන්නන්නම්. කෙල්ලෙක් මාව රවට්ටගත්තා කියලානම් කියන්න හිතන්නවත් එපා. මමයි එයාව රවට්ටගත්තේ... කතා කරලා බලන්න එයා කොච්චර වෙනස් කෙනෙක්ද කියලා..."

"රවට්ටගත්තා කිව්වේ... කෙල්ලෙක් එක්ක යාළුවෙන එක රවට්ටගැනිල්ලක් නෙවෙයිනේ."

"මට හිතෙනවා මං එයාව රැවැට්ටුවා කියලා. මොකද මේ මොහොත වෙනතුරුත් එයා දන්නෙ නෑ අපේ පවුල් පසුබිම. කොටින්ම අප්පච්චි ගැනවත්..."

"බලන්න වටින ළමයෙක්..."

තෙන්නකෝන් බණ්ඩාර කීවේ ඇත්තටම අංජනා දැකීමේ උවමනාවෙන් නොවෙයි. සැනින් සිතට ආ දෙයක් හිත තබාගෙනය.

"ඔහොම ඉන්න, සාප්පුවේ ඉන්නවා මං එක්ක එන්නම්..."

ප්‍රශ්නය එතෙකින් අවසන් කරගන්නට උවමනා නිසාම තේනුක කීවේය. වාහනය ළඟින් ඔහුට අඩියක් දෙකක් යන්නට හැරී තෙන්නකෝන් බණ්ඩාර ආරක්ෂක නිලධාරී ගමගේට කතා කළේය.

"මං දැන් ගමගේව අර සාප්පුව ඇතුළට යවනවා. ඒකෙ ඉන්න ගෑනු ළමයගෙ පින්තූරයක් ගන්නවා නොදැනෙන්න. අර අපේ පුතාව ආපහු එක්ක එන්න මං කතා කරනවා කියලා..."

දුරකතනයේ තිබූ පිට වැස්ම ගලවා අසුනට දැමූ තෙන්නකෝන් බණ්ඩාර අසුන මත තිබූ මුදල් පසුම්බියෙන් රුපියල් පන්දහසේ කොළයක් අතට ගනිද්දී ගමගේ විසින් සාප්පුව තුළට යන්නට ගිය තේනුකව යළි වාහනය ළඟට කැඳවාගෙන ආවේය.

"ඔහොම හදිස්සියේ ඒ ළමයා දකින්න ඕනි නෑ. ඔයා කිව්වනෙ මං ගැන දන්නෙත් නෑ කියලා. අපි පස්සෙ අම්මත් එක්කම එයාව හම්බවෙමු පොඩිපුතා..."

තෙන්නකෝන් බණ්ඩාර අවස්ථාවට අනුව හැඟුම්බර වී සිටියේය. තේනුක හා කතා කරමින්ම මුදල් නෝට්ටුව හා දුරකතනය අතට දුන් ඇමතිවරයා ඊට අලුත් පිටවැස්මක් ගෙන එන ලෙස කියමින් ගමගේ සාප්පුව තුළට යැව්වේය.

අංජනා සිටියේ කවුන්ටරයේ ඉඳගෙන පාර දෙස බලාගෙන නිසා ගමගේ සාප්පුවට ඇතුළුවෙනු දුටුවාය. වින්දන හා කමල් දෙදෙනාම ගණුදෙනුකරුවන් සමඟ සිටි නිසා ගමගේ කෙළින්ම ගොස් අංජනා අත දුරකතනය තැබුවේය.

"හොඳ ෆෝන් කවරයක් ඕනි මිස්..."

ඇයට තවම ඒ විෂයේ අත්දැකීම් නැත. ඒ නිසා අංජනා මඳ සිනාවක් පාමින් දුරකතනය අතට ගෙන වින්දන වෙතට යන්නට සැරසුණාය. ගමගේ ඔහුගේ දුරකතනය අතට ගෙන ඈ පස්සෙන් ගියේ අවස්ථාව ආ සැනින් පින්තූරය ගන්නටයි.

"අර තියෙන්නේ මේ වර්ගෙ ෆෝන් කවර ටික... මෙයාට එකක් සිලෙක්ට් කරන්න කියලා මිස් චුට්ටක් බලන්න. මං මේ සල්ලි අරන් එන්නම්."

ගමගේ ඒ ෆෝන් කවර එකින් එක අතගාමින් බලද්දී අංජනා ඒ ළඟින්ම සිටගෙන බලා සිටියාය.

"මිස් මං පොඩ්ඩක් මේ කවර ටිකේ ෆොටෝ එකක් ගන්නම්. අපේ සර්ට පෙන්නලා එකක් ගන්න පුළුවන්..."

අංජනා සිනාසී හිස වැනුවාය. ඒ සිනාව ඇය මුහුණෙන් වියැකෙන්නට පෙර ගමගේ ෆෝන් කවර දෙසට ඇල්ලූ දුරකතනයේ කැමරාව සැනින් ඈ දෙසට හරවා එකක් නොව පින්තූර කීපයක්ම ගත්තේය.

ලබන සතියට




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.